රාජ්‍ය දැව සංස්ථාව
STATE TIMBER CORPORATION

පාරිභෝගික විශ්වාසය දිනාගත් දැව කර්මාන්තයේ සැබෑ නායකත්වය
REAL LEADERSHIP OF THE TIMBER INDUSTRY THAT WON CONSUMBER TRUST



2022
වාර්ෂික වාර්තාව
ANNUAL REPORT

වනජීවී හා වනසම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය
MINISTRY OF WILDLIFE AND FOREST RESOURCES CONSERVATION



රාජ්‍ය දැව සංස්ථාව

වාර්ෂික වාර්තාව - 2022

දැව වෙළෙඳපොළෙහි සැබෑ නායකත්වය උදෙසා

1968 - 2022

54 වසරක නොනිමි ගමන් මග
රාජ්‍ය දැව සංස්ථාව

ජනහද දිනූ ආයතනයක් ලෙස පෙරටම

දැක්ම

ජාතියේ විශ්වාසනීයත්වය දිනූ අනර්ඝතම දැව හා දැවමය භාණ්ඩ සැපයුම්කරුවීම සහ දැව වෙළෙඳපොළෙහි සැබෑ නායකත්වය ඉසිලීම

මෙහෙවර

අප සතු තාක්ෂණික දැනුම, කීර්තිනාමය හා නිපුණතාවය උපයෝගී කරගනිමින් නීත්‍යානුකූලව, පරිසර හිතකාමී අන්දමින් ජාතික අවශ්‍යතාවය අනුව අපගේ ගැනුම්කරුවන්ගේ දැව සහ දැවමය භාණ්ඩ ඉල්ලීම නිෂ්පාදනයකර ලබාදීම

අනර්ඝතම දැවමය නිෂ්පාදන

රාජ්‍ය දැව සංස්ථාව රජය සතු ව්‍යාපාරයකි. එය 1968.04.04 දිනැති හා අංක:14796 දරණ ගැසට් පත්‍රය මගින් ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ගරු අමාත්‍යතුමන් විසින් 1957 අංක 49 දරණ රජයේ කාර්මික සංස්ථා පනතේ බලතල ප්‍රකාරව පිහිටුවන ලද අතර, 1969 නොවැම්බර් 07 දිනැති අංක 14879 දරණ ගැසට් පත්‍රය, 1982 පෙබරවාරි 05 දිනැති අංක:178/10 අති විශේෂ ගැසට් නිවේදනය, 2001 වර්ෂයේ ජුනි 26 දිනැති අංක:1190/7 දරණ අති විශේෂ ගැසට් පත්‍රය සහ 2008 පෙබරවාරි 25 දිනැති අංක:1538/7 දරන ගැසට් පත්‍ර අනුව තවදුරටත් සංශෝධනය කොට යාවත්කාලීන කරන ලදී. යෙදවූ මූලික ප්‍රාග්ධනය රු.මිලියන 2.5 කි. වර්ෂ 54කට වැඩි අත්දැකීම් හා පළපුරුද්ද ඇති ආයතනයක් ලෙස රාජ්‍ය දැව සංස්ථාව ඉහළ ප්‍රමිතියෙන් යුතු ගෘහ භාණ්ඩ අවශ්‍යතා ඇති හෝටල් හිමිකරුවන්ගේ, රජයේ ආයතනවල සහ ගෘහ නිර්මාණ ශිල්පීන්ගේ ඇතුළු පෞද්ගලික ගැනුම්කරුවන්ගේ ප්‍රමුඛ තේරීමක් බවට පත්ව ඇත.

රාජ්‍ය දැව සංස්ථාව ඉහළ ගුණාත්මක බවින් යුතු අනර්ඝතම දැවමය නිෂ්පාදන පාරිභෝගිකයින් හට සැපයීමට හා උපරිම සේවාවක් ලබාදීමට හැකි සෑම අවස්ථාවකදීම උත්සාහ දරයි. අලංකාර නිවාස, සුඛෝපභෝගී හෝටල්, විධායක කාර්යාල ඇතුළු විදේශීය වාසස්ථාන සඳහා ද, අපගේ අනර්ඝ දැව ඉහළ වටිනාකමක් එක් කරයි. මනා ලෙස කළමනාකරණය කරන ලද වනවගා මඟින් ලබාගනු ලබන වටිනා දැව මඟින් කරනු ලබන සුවිශේෂී නිෂ්පාදන වන කාර්යාල හා නිවාස සඳහා වූ ගෘහ භාණ්ඩ, කඳන් හා ඉරු දැව අපගේ පාරිභෝගිකයන් උපරිම තෘප්තිමත්භාවයට පත්කිරීමට සමත් වේ. කීර්තිමත් රාජ්‍ය ආයතනයක් ලෙස රාජ්‍ය දැව සංස්ථාව පුළුල් පරාසයක පැතිරුණ ඉහළ පෙළේ හා දීර්ඝ කල්පැවැත්මක් ඇති දැවමය නිෂ්පාදන වෙළෙඳපොළට ඉදිරිපත් කරනු ලබන අතර, නිෂ්පාදන නවීන තාක්ෂණයෙන් යුතු අධි තාක්ෂණික යන්ත්‍රෝපකරණවලින් සමන්විත නවීන වැඩ පරිසරයක් තුළ නිපදවනු ලබයි.

සිත් ඇදගන්නා සුළු පුටු අසුන්වල සිට සුවිශේෂී නිදන කාමර කට්ටලයන් දක්වා පාරිභෝගිකයන් විසින් ඉල්ලුම් කරනු ලබන මිළට හා කාල වකවානුව තුළ ඉහළ ගුණාත්මකභාවයෙන් යුතුව, නිෂ්පාදන ලබාදීමේ හැකියාව රාජ්‍ය දැව සංස්ථාව සතුව පවතී. අපගේ නිෂ්පාදනවල ගුණාත්මකභාවය අප විසින් නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා උපයෝගී කරගන්නා පහත දක්වා ඇති ක්‍රියාමාර්ග තුළින් සනාථ කරනු ලබයි.

- තිරසාරව කළමනාකරණය කරන ලද වන වගා මගින් ලබාගනු ලබන පරිණත දැව අපගේ නිෂ්පාදනයන් සඳහා යොදාගනු ලැබීම.
- ඵලය හා දෝෂ රහිත, ඉහළ ශ්‍රේණියේ දැව භාවිතා කරනු ලැබීම.
- මනා ලෙස පරිරක්ෂණය කරන ලද දැව භාවිතය.
- නවීන නිෂ්පාදන ක්‍රියාවලි සඳහා යන්ත්‍රෝපකරණ භාවිතය.
- ගුණාත්මක භාවය සහ සහතික කරන ලද අනෙකුත් දැව නොවන අමුද්‍රව්‍ය භාවිතය
- එකලස් කිරීමේ හා නිමකිරීමේ නවීන ශිල්ප ක්‍රම භාවිතය.

නිෂ්පාදනවල ගුණාත්මකභාවය හැරුණුවිට, සංස්ථාව මගින් සපුරාලනු ලබන සියලුම ආකාරයේ ගෘහ භාණ්ඩ අවශ්‍යතා සඳහා නොමිලේ ඇස්තමේන්තු කිරීමේ සේවාවක් සහ මිනුම් සේවාවක් සපයනු ලබයි. තවද, ඉහළ ප්‍රතිලාභ සහිත අපගේම පිරිවිතරයන්ට අනුව නිෂ්පාදනය කරන ලද උසස් තත්ත්වයේ ගෘහ භාණ්ඩ පරාසයක් වෙළෙඳපොළට සැපයීමට අපි සහතික වෙමු. අපගේ නිෂ්පාදන පරාසයන් පුළුල් කිරීමට අමතරව විශේෂයෙන් අපගේ සේවාවන් සහ ගනුදෙනුකරුවන් සඳහා සේවා පරිසරය ද අපි නිරන්තරයෙන් වැඩිදියුණු කිරීමට අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට ද සහතික වෙමු.

අපගේ කාර්යයන්



මූල්‍ය වශයෙන් ස්ථායී වේ.



නිවාස හා සේවා ස්ථාන ඉදිකිරීම සඳහා තිරසාර අමුද්‍රව්‍ය සපයනු ලැබේ.



තිර සාරවන කළමනාකරණ ක්‍රමෝපායන් යොදා ගනිමින් පරිසරය ආරක්ෂා කිරීමටත් වර්ධනය කිරීමටත් දායකවේ.



ආදායම් බදු හා භාණ්ඩාගාර බදුගෙවමින් ප්‍රජා සංවර්ධනය සඳහා දායක වේ.



පුළුල් පරාසයක පැතිරුණ නවීන හා සම්ප්‍රදායක ගෘහ භාණ්ඩ




පටුන


පිටුව


මූල්‍ය ප්‍රකාශන උද්ධෘත	08
ආයතනික තොරතුරු	09
කළමනාකරණ මඩුල්ල	10
සභාපතිතුමාගේ සමාලෝචනය	13
සාමාන්‍යාධිකාරිතුමාගේ සමාලෝචනය	16
අපගේ කාර්යභාරයන් හා අපගේ ව්‍යාපාරික වටිනාකම්	20 - 21
අධ්‍යක්ෂ මණ්ඩලය	22
ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මඩුල්ල	23
අධ්‍යක්ෂ මණ්ඩල සමාලෝචනය	24
අපගේ ආවරණ කලාප	28
ආයතනික පාලනය	30
විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව	33
අවදානම් කළමනාකරණය	35
ආයතනික සමාජ වගකීම	40
ව්‍යාපාරික සාරාංශය	50
දශකයක තොරතුරු	53
විගණකාධිපතිගේ වාර්තාව	54
වාර්ෂික ගිණුම්	69
මූල්‍ය පාරිභාෂික ශබ්ද මාලාව	92

මූල්‍ය ප්‍රකාශන උද්ධෘත

දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා		2022	2021	වෙනස %
ඉපැයීම් සම්බන්ධ ප්‍රධාන දත්ත සහ අනුපාත				
අයභාරය	රු. '000	4,743,049	5,695,663	-17%
භාණ්ඩාගාර හා ආදායම් බදුවලට පෙර ලාභය	රු. '000	1,015,986	1,496,156	-32%
භාණ්ඩාගාරයට ගෙවූ බදු	රු. '000	320,000	100,000	220%
ආදායම් බදු	රු. '000	380,105	259,944	46%
වර්ෂය සඳහා විස්තීරණ ආදායම්	රු. '000	635,881	1,236,212	-49%
ස්කන්ධය මත ඉපැයීම්	%	8.3	18.3	-54.6%
වත්කම් මත ඉපැයීම්	%	6.6	13.4	-50.5%
ශේෂ පත්‍ර සම්බන්ධ ප්‍රධාන දත්ත සහ අනුපාත				
මුළු වත්කම්	රු. '000	9,588,286	9,207,819	4.1%
මුළු ස්කන්ධය	රු. '000	7,665,155	6,757,207	13.4%
මුළු ණයහිමියෝ	රු. '000	1,923,131	2,450,612	-21.5%
ණය/ස්කන්ධය	%	25.1	36.3	-30.8%
ණය/මුළු වත්කම්	%	20.1	26.6	-24.6%
වෙනත් තොරතුරු				
මුළු සේවකයන්	සංඛ්‍යාව	1,500	1,606	-6.6%
එක් සේවකයෙකුට අයභාරය	රු. '000	3,162	3,546	-10.8%
එක් සේවකයෙකුට ලාභය	රු. '000	677	932	-27.4%







ආයතනික තොරතුරු - 2022

ගරු මහින්ද අමරවීර අමාත්‍යතුමා - වනජීවී හා වනසම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය

ආර්.එම්.සී.එම්.හේරත් මිය - ලේකම්, වනජීවී හා වනසම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය

අධ්‍යක්ෂ මණ්ඩලය - 2022

එම්.එස්.කරුණාරත්න මහතා	-	සභාපති - රාජ්‍ය දැව සංස්ථාව
ආචාර්ය කේ.එම්.ඒ.බණ්ඩාර මහතා	-	අධ්‍යක්ෂ (වනසංරක්ෂණ ජනරාල්)
එස්.ඒ.සී.කුලතිලක මිය	-	අධ්‍යක්ෂ (භාණ්ඩාගාර නියෝජිත)
බී.ටී.බණ්ඩාර දිසානායක මහතා	-	අධ්‍යක්ෂ
එම්.ආර්.අජිත් කුමාර බණ්ඩාර මහතා	-	අධ්‍යක්ෂ
පී.ඩී.බී.බස්නායක මහතා	-	අධ්‍යක්ෂ
ඩී.ජී.එස්.දසනායක මහතා	-	අධ්‍යක්ෂ
කේ.අයි.ඩී.පී.කාරියවසම් මහත්මිය	-	අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

විගණන හා කළමනාකරණ කමිටුව

එස්.ඒ.සී.කුලතිලක මහත්මිය	-	කමිටු සභාපතිනි
ආචාර්ය කේ.එම්.ඒ.බණ්ඩාර මහතා	-	කමිටු සාමාජික
බී.ටී.බණ්ඩාර දිසානායක මහතා	-	කමිටු සාමාජික

විගණක

විගණකාධිපති

විගණකාධිපති දෙපාර්තමේන්තුව

306/72, පොල්දූව පාර, බත්තරමුල්ල.

ප්‍රධාන බැංකුව

ලංකා බැංකුව

මුදල් වර්ෂය

ජනවාරි 01 දින සිට දෙසැම්බර් 31 වන දින දක්වා

දුරකථන : 94112866600-5

ෆැක්ස් : 94112866623

වෙබ් අඩවිය : www.timco.lk

කළමනාකරණ මඩුල්ල - 2022

සාමාන්‍යාධිකාරි / ප්‍ර. වි. නි	ආචාර්ය එන්.ඩී. රුවන්පතිරණ	PhD (Forestry), M.Sc. (Forestry), B.Sc.

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීන්

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මුදල්)	ජී.ඩී.එස්. කුමාරසිංහ මයා	MBA, B.Sc. (Acc.Fin.Mgt), FCA, ACCA, ACMA
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මානව සම්පත් හා පාලන)	එම්.ඒ.සි.එන්. සමරසිංහ මයා	MPM, B.Sc (Business studies) Ad.Dip in Mgt. and Admin.
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මෙහෙයුම්)	එම්.සි. දේවේන්ද්‍ර මයා	M.Sc. (Forestry), B.Sc.
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (අලෙවි)	ඩබ්.බී. සමන්ත මයා	M.Sc. (Forestry), B.Sc. N. Dip. Teaching
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ඉංජිනේරු හා නිෂ්පාදන) වැ.ආ	ජී.ජී.ටී. ගමගේ මයා	B.Sc., MBS.
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (අභ්‍යන්තර විගණන) වැ.ආ	එච්.එම්.එස්. මාධව මයා	B.Com (Sp), (PGDipCom)
සහකාර සාමාන්‍යාධිකාරි (පර්යේෂණ පුහුණ හා සංවර්ධන)	ආචාර්ය සී.කේ. මුතුමාල	PhD in Agricultural Engineering M.Sc. (Forestry), B.Sc. (Agri.) Hon.,
සහකාර සාමාන්‍යාධිකාරි (කලාප)	පී.කේ. අජිත් චන්දන මයා	B.Sc, MBS
සහකාර සාමාන්‍යාධිකාරි (කලාප)	එච්.බී. රජවත්ත මයා	BA, MBS.

කළමනාකරුවන්

කළමනාකාර (සිල්පර හා විදුලි කණු)	ඩී.එම්.එන්. පුෂ්පකුමාර නිල්මිණි මයා	B.Sc, MBS.
කළමනාකාර (යාන්ත්‍රික ඉංජිනේරු)	ඒ.කේ. ලසිත එඩිමන්ඩ් මයා	B.Sc. (Engineering)
කළමනාකාර (මුදල්)	පී.ටී.එන්. බෝවත්ත මිය	
කළමනාකාර (මුදල්)	එච්.ජී.ආර්. විජේනායක මයා	
කළමනාකාර (ආරක්ෂක)	සී.වීරමන් මයා	
කළමනාකාර (මුදල්) වැ.ආ	යූ.එස්. මඩවල මයා	HNDA, MAAT
කළමනාකාර (මුදල්) වැ.ආ	එච්.එම්.පී.බී. හේරත් මයා	HNDA, FM(ABE)UK, PgD.Fin MBA (UK)
කළමනාකාර (තොරතුරු තාක්ෂණ) වැ.ආ	ජේ.එම්.එම්.බී. ජයසුන්දර මයා	B.Sc. (Sp) Hon.

ප්‍රාදේශිය කළමනාකාරුවන්

ප්‍රාදේශිය කළමනාකාර (ප්‍රධාන කාර්යාලය)	ආර්. විජේතුංග මයා	B.Sc. (Agri.)Sp
ප්‍රාදේශිය කළමනාකාර (බූස්ස)	එම්.ඩී.සී. සම්පත් මයා	BA
ප්‍රාදේශිය කළමනාකාර (අම්පාර)	යූ.පී.එච්. උළුවඩුගේ මයා	B.Sc
ප්‍රාදේශිය කළමනාකාර (බණ්ඩාරවෙළ)	ඩී.එච්. රාජපක්ෂ මයා	M.Sc. (Forestry), B.Sc.
ප්‍රාදේශිය කළමනාකාර (කුරුණෑගල)	යූ.එස්.එම්. ප්‍රනාන්දු මයා	BA (sp)
ප්‍රාදේශිය කළමනාකාර (කොළඹ)වැඅා	එච්.ඒ.ගාමිණී අල්විස් මයා	
ප්‍රාදේශිය කළමනාකාර (මොණරාගල)වැ.අා	එස්.සී ජයමාන්න මයා	B.Sc.
ප්‍රාදේශිය කළමනාකාර (අනුරාධපුර) වැ.අා	ඩී.එල්. අබේනායක මයා	
ප්‍රාදේශිය කළමනාකාර (රත්නපුර)	එච්.එල්. නන්දන මයා	B.Sc., MBS.
ප්‍රාදේශිය කළමනාකාර (යාපනය)	ශ්‍රී ස්කන්ධරාසා මයා	
ප්‍රාදේශිය කළමනාකාර (මින්නේරිය)	එච්.පී.එස්. දිසානායක මයා	BA
ප්‍රාදේශිය කළමනාකාර (මාතර)	ඩබ්.අයි.සාරංග මයා	B.Sc. (Hon.)
ප්‍රාදේශිය කළමනාකාර (නුවර) වැ.අා.	ඩී.ඒ. හෙන්දාවිතාරණ මයා	
ප්‍රාදේශිය කළමනාකාර (නුවරඑළිය)වැ.අා.	ඩබ්.ඩී.පී.ජී. ජයසේකර මයා	
ප්‍රාදේශිය කළමනාකාර (නුවරඑළිය)වැ.අා.	සුනිල් ජයරත්න මයා	

නියෝජ්‍ය කළමනාකරුවන්

නියෝජ්‍ය කළමනාකාර (ගෘහභාණ්ඩ නිර්මාණ හා තත්ත්ව ආරක්ෂණ)	ඊ.එම්.එම්. ප්‍රනාන්දු මයා	
පද්ධති විශ්ලේෂක	ඩබ්.එච්.ඒ. චන්ද්‍රකුමාර මයා	B.Sc.
නියෝජ්‍ය කළමනාකාර (මානව සම්පත්)	එච්.පී. පෙරේරා මිය	
කළමනාකාර (නීති)	කේ.අයි.ඩී.පී කාරියවසම් මිය	LLB, Attorney at Law
නියෝජ්‍ය කළමනාකාර (මුදල) බූස්ස	ඒ.එල්.තුෂාරි ද සිල්වා මිය	HNDA, MAAT
නියෝජ්‍ය කළමනාකාර (මුදල්) නුවරඑළිය	එන්.ටී.එස්.කේ.පී. තිලකවර්ධන මයා	HNDA, MAAT
නියෝජ්‍ය කළමනාකාර (මුදල්) නුවර	ඩබ්.එම්.ජී.එම්. විජේසිංහ මයා	B.Sc. (Bus.Admin.) MAAT.
නියෝජ්‍ය කළමනාකාර (මුදල්) මොණරාගල	ඒ.ජේ. පුෂ්පකුමාර මයා	B.Sc. (Bus.Admin.) MA
නියෝජ්‍ය කළමනාකාර (මුදල්) මින්නේරිය	එම්.ඩී.පී.එම්. දිසානායක මිය	B.Sc. (Acc), MBS.
නියෝජ්‍ය කළමනාකාර (මුදල්) ප්‍රධාන කාර්යාලය	එස්. විතානගේ මිය	
නියෝජ්‍ය කළමනාකාර (මුදල්) අනුරාධපුර	ඩබ්.කේ. ජයසිංහ මයා	
නියෝජ්‍ය කළමනාකාර (මුදල්) කොළඹ	එස්.පී.ඒ.ජේ.සි. සමරකෝන් මයා	B.Sc. (Finance)
නියෝජ්‍ය කළමනාකාර (මුදල්) ප්‍ර කා	එස්.එම්. හේවගේ මයා	B.Sc, Bus.Admin (Bus. Econ.sp), MBS.
නියෝජ්‍ය කළමනාකාර (මුදල්) කුරුණෑගල)	එස්.එච්.අයි ප්‍රසාද් මයා	B.Sc.Bus.Admin (Bus. Econ.sp), MBS.
නියෝජ්‍ය කළමනාකාර (මුදල්) ප්‍ර කා	ඩී.කේ.ජී.ජී. පුෂ්පකුමාර මයා	B.Com., MBA, MAAT, PgD. Acc.& Fin.
නියෝජ්‍ය කළමනාකාර (අලෙවි)	ඩබ්.ඩී.ඒ.එස්. තිලකරත්න මයා	

නියෝජ්‍ය කළමනාකාර (දෙව ශ්‍රේණි කිරීම් හා වෙන්දේසි)	ඩී.පී.කේ.එස්.ජී. සමරවික්‍රම මයා	B.Sc. (Mkt.Mgt.)
නියෝජ්‍ය කළමනාකාර (දෙව සැපයීම්)	බී.ඒ. නලින් දේශප්‍රිය මයා	
නියෝජ්‍ය කළමනාකාර (ගෘහභාණ්ඩ නිර්මාණ)	එච්.එම්.ටී.එස්. අබේරත්න මිය	B.Desing (Hon.) MBA
නියෝජ්‍ය කළමනාකාර (ඉරුම්හල්)	එම්.පී.එන්. අරුණශාන්ත මයා	B.Sc. (Bus.Admin.)
නියෝජ්‍ය කළමනාකාර (විමර්ෂන)	එස්.ඒ.ඩී. නිරෝෂන් මයා	B.Sc. (Bus.Mgt.)
නියෝජ්‍ය කළමනාකාර (යාන්ත්‍රික ඉංජිනේරු) - කල්දෙමුල්ල	එම්.කේ.එම්. අක්තාර් මයා	B.Tech.
නියෝජ්‍ය කළමනාකාර (තත්ත්ව ආරක්ෂණ) බූස්ස	එච්.එම්.එල්.කේ.ජී. හේරත් මයා	B.Sc.
නියෝජ්‍ය කළමනාකාර (තත්ත්වආරක්ෂණ) අම්පාර	ඩබ්.එම්.අය.එච්. වීරසූරිය මයා	B.Sc.
නියෝජ්‍ය කළමනාකාර (නිෂ්පාදන) ප්‍ර කා	අයි.එම්.අයි.එස්.කේ වික්‍රමසිංහ මයා	PgD.Fin.& Mathematics, B.Sc.
නියෝජ්‍ය කළමනාකාර (මිලදීගැනීම් හා නාවික) ප්‍රකා	එච්.ඩී.එස් සඳමාලි මිය	B.B.Mgt.(HR) Sp., DIP PCA.

ගෘහභාණ්ඩ සංකීර්ණ කළමනාකරුවන්

නියෝජ්‍ය කළමනාකාර (ගෘ.භා සංකීර්ණය) අම්පාර	ආර්.එස්. පල්ලියගේ මයා	BLE, Dip. IT & M
නියෝජ්‍ය කළමනාකාර කල්දෙමුල්ල.	එච්.එම්.යූ.පී. සෝමවීර මයා	B.Sc. (Bus.Admin)

නියෝජ්‍ය ප්‍රාදේශිය කළමනාකරුවන්

නි.ප්‍රා.ක. (මින්නේරිය)	කේ.එම්.පී.ටී.සී. කපිලරත්න මයා
නි.ප්‍රා.ක. (අම්පාර)	යූ.ජේ.ජී. ඒකනායක මයා
නි.ප්‍රා.ක. (මහනුවර)	ඩබ්.ඒ.එස්. විජේසේකර මයා
නි.ප්‍රා.ක. (මාතර)	කේ.චන්ද්‍රසේන මයා
නි.ප්‍රා.ක. (කොළඹ)	ඊ.එම්.ඒ.කේ. එදිරිසිංහ මයා
නි.ප්‍රා.ක. (කොළඹ)	එස්.බී. උඩගෙදර මයා BA
නි.ප්‍රා.ක. (මාතර)	පී.හෙට්ටිආරච්චි මයා B.Sc.
නි.ප්‍රා.ක. (රත්නපුර)	එස්.ඒ. මනෝජ් තුෂාර මයා
නි.ප්‍රා.ක. (කුරුණෑගල)	ආර්.පී.පී.ඩී. ජයසිංහ මයා
නි.ප්‍රා.ක. (අනුරාධපුර)	එස්.එම්.එස්. සිරිවර්ධන මයා
නි.ප්‍රා.ක. (අම්පාර)	ආර්.සී සමන්කුමාර මයා
නි.ප්‍රා.ක. (මින්නේරිය)	එම්.ඩබ්.ඩබ්.බී. මුදන්නායක මයා
නි.ප්‍රා.ක. (රත්නපුර)	එච්.ආර්.එම්.එස්. ගුණසේකර මයා

සභාපතිතුමාගේ සමාලෝචනය



එම්.එස්. කරුණාරත්න
සභාපති


තවත් එක් අසීරු වර්ෂයක් තුළ රාජ්‍ය දැව සංස්ථාව ළඟාකරගත් මූල්‍යමය ප්‍රතිඵල පිළිබඳ වාර්තා කිරීමට මම සතුටු වෙමි. පසුගිය වසර තුන තුළ ප්‍රබල බාහිර බලපෑම්වලට ලක්වී තිබියදීත්, සැළකිය යුතු කාර්ය සාධනයක් ලබාදීම උදෙසා රාජ්‍ය දැව සංස්ථාව ඒ සඳහා වූ ගමන් මඟ කළමනාකරණය කර ඇති ආකාරය පිළිබඳ මම ඉතා ආඩම්බර වෙමි. මෙය රාජ්‍ය දැව සංස්ථාවේ ක්‍රමෝපායන්, බාහිර බලපෑම්වලට ඔරොත්තුදීමේ හැකියාව, කාර්යක්ෂම බව හා සංස්ථා කාර්ය මණ්ඩලයෙහි බාහිර බලපෑම් හමුවේ ඉදිරියට යෑම හා ඒ සඳහා ඇති කැමැත්ත ඒ පිළිබඳ සාක්ෂියක් වන බව මම විශ්වාස කරමි.

මූල්‍ය වර්ෂය තුළ අප විසින් ගනු ලැබූ දුරදර්ශී ක්‍රියාමාර්ග හා පියවරයන්හි ප්‍රතිඵල වශයෙන් 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා රු. මිලියන 4743 ක් වූ අලෙවි ආදායමක් හා රු. මිලියන 1,016 ක බදු පෙර ලාභයක් ද, වාර්තා විය. තවද සාර්වාර්ථික හා මූල්‍ය අභියෝග මාධ්‍යයේ රාජ්‍ය දැව සංස්ථාවෙහි ව්‍යාපාර කටයුතු ද නොසැලී පැවතුණි. කොවිඩ් 19 වසංගතය හා 2022 වර්ෂයේ පැවති ආර්ථික අර්බුධ තත්වය යටතේ මෙවැනි මූල්‍ය කාර්ය සාධනයක් ළඟා කර ගැනීමට රාජ්‍ය දැව සංස්ථාවට හැකියාවක් ලැබී ඇත. විදේශ විනිමය සංචිත පියවීම, රුපියල අවප්‍රමාණයවීම, ඉහළ උද්ධමනය, ඉහළ පොළී අනුපාත හා බාහිරින් ලබාගත් ණය ආපසු ගෙවීමේ අරගලය මගින් ඇති වූ ආර්ථික අර්බුධය මෑත කාලීනව ලංකාව මුහුණ දුන් දරුණුතම සිදුවීම වේ.


2022 වර්ෂය අපගේ මූලික ශක්තීන්, නව්‍ය හා උසස් තත්වයේ නිෂ්පාදනය කෙරෙහි විශාල වශයෙන් අවධානය යොමුකළ වසරකි. මෙම සාමාන්‍ය තත්වයන් යටතේ දැඩි ආරක්ෂක පියවරයන් හා අභිප්‍රේරණ කාර්ය මණ්ඩලයක් සමග සිදුකෙරුණි. ඒ අතරම නැවතත් අපගේ පාරිසරික හා සමාජ සංස්කෘතික කාර්ය සාධනය ඉහළ මට්ටමකින් පුළුල් කළෙමු. මානව සම්පත යනු අප සංස්ථාව සතු ඉතා වටිනාම සම්පත බව අපගේ විශ්වාසයයි. අපගේ ගනුදෙනුකරුවන්ට හැකි උපරිම මට්ටමකින් සේවය කිරීමට කැපවී සිටින හා සංස්ථාවේ ඉලක්ක ළඟා කර ගැනීම මෙම කාර්ය නොපිරිහෙලා ඉටුකරන අපගේ කාර්ය මණ්ඩලයේ පුහුණු හා සංවර්ධන වැඩසටහන් සඳහා 2022 වර්ෂයේදී ද අප ආයෝජනය කළෙමු.

මූල්‍ය කාර්ය සාධනය

2022 වර්ෂයේ ආර්ථික අවපාතය යටතේ, රාජ්‍ය දැව සංස්ථාව රුපියල් මිලියන 4,743 ක අලෙවි ආදායමක් වාර්තා කළ අතර, එය රුපියල් මිලියන 5,696 ක් වූ 2021 වර්ෂයේ අලෙවි ආදායමට සාපේක්ෂව 17% ක අඩුවීමකි. කෙසේ නමුත්, මෙම පසුබැස්ම යටතේ වුවද, රුපියල් මිලියන 1,016 ක බදු පෙර ලාභයක් හා රුපියල් මිලියන 636 ක බදු පසු ලාභයක් ඉපැයීමට රාජ්‍ය දැව සංස්ථාවට හැකිවීම සුවිශේෂී වේ. ඒ අනුව බදු පෙර ලාභය හා බදු පසු ලාභය 2021 වර්ෂයට සාපේක්ෂව 32% කින් පහළ ගොස් ඇත. කෙසේ වෙතත්, රජය සතු සංස්ථාවක් ලෙස මෙම දුෂ්කර කාලසීමාව තුළ වුවද, රු.මිලියන 320 ක් භාණ්ඩාගාර බදු ලෙස ලබාදීම පිළිබඳ අපි ආඩම්බර වෙමු.



ඒ හා සමානව, 2021 වර්ෂයේ 13% ක් වූ බදු පෙර සාමාන්‍ය වත්කම් මත ප්‍රතිලාභ (ROA) 2022 වර්ෂයේ දී 6.6% ක් දක්වා පහත වැටී ඇති අතර, 2021 වර්ෂයේ 18.3% වූ බදු පසු සාමාන්‍ය කොටස් මත ප්‍රතිලාභය (ROE) 2022 වර්ෂයේ දී 8.3% දක්වා පහත වැටී ඇත. ආර්ථික අර්බුධය හේතුවෙන් ඇති වූ දුෂ්කරතා මෙම පහත වැටීම්වලට මූලික හේතුව විය. එසේ වුවද, සියලු වත්කම් හා කොටස් ආදායම් ඉපැයීම සඳහා විශාල දායකත්වයක් ලබාදී ඇති අතර, එමගින් සංස්ථාව විසින් සුදුසු කාරක ප්‍රාග්ධන කළමනාකරණ ප්‍රතිපත්තියක් පවත්වාගෙන යන බව හෙළිවේ.



ඉදිරි ගමන් මග

කෙටිකාලීන හා මධ්‍ය කාලීන ශ්‍රී ලංකාව පිළිබඳව දැක්ම අස්ථාවර අතර, දීර්ඝ කාලීන ස්ථාවරත්වය දේශපාලන පරිසරය හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහාය ඇතිව ණය ප්‍රතිව්‍යුහගත කිරීම මත පුරෝකථනය කරනු ඇත. මෑත කාලීන සිදුවීම් නව දේශපාලන සංස්කෘතියට හා ශ්‍රී ලංකාවේ දිගු කාලීන සමෘද්ධිය සඳහා ඉවහල් වනු ඇතැයි බලාපොරොත්තු ඇතිව අනාගතය පිළිබඳව සුභදායීව සිතමි.

අපගේ ව්‍යාපාරයෙහි ආරක්ෂාකාරී ස්වභාවය රාජ්‍ය දැව සංස්ථාව යම්තාක් දුරකට පරිවර්ථනය කළ යුතු අතර, ශක්තිමත් ශේෂපත්‍රය හා ආයතනික හැකියාවන් අකාබනික අන්තර්ග්‍රහණය තුළින් වෙළෙඳපොළ කොටස ලබාගැනීමට අවස්ථාව සලසනු ඇතැයි මම විශ්වාස කරමි. තවද, අඛණ්ඩව වර්ධන ආකල්ප අප තුළ ඇති කරගන්නා අතර, අපට මුහුණදීමට සිදුවන අභියෝග පිළිබඳ පැහැදිලි අවබෝධයකින් හා වෙළෙඳපොළ තුළ තරඟකාරීව සිටීමට ක්‍රියාශීලි පියවර ගන්නෙමු.

අපි අභියෝගාත්මක නව වසරකට පිවිසෙන බැවින් සංස්ථාව මගින් නිරතුරුව තත්ව විශ්ලේෂණයන් සිදුකරනු ලබන අතර, එම විශ්ලේෂණයන්හි ප්‍රතිඵල මත පෙර සකස් කරන ලද සැළසුම් සමාලෝචනය කරන්නෙමු. නමුත් පසුගිය වසරවල සාර්ථකත්වය ගෙන ඒමේ ක්‍රියාවලියේ දී වැදගත් ලෙස සනාථ වූ ''සංස්ථාවෙහි ශක්තිමත් පදනම, ශක්තිමත් උපායමාර්ග මෙන්ම ව්‍යාපාර ආකෘතිවල ඔරොත්තුදීමේ හැකියාව සහ ක්‍රියාශීලී බව'' ඉදිරි අභියෝග ජයගැනීමට රාජ්‍ය දැව සංස්ථාවට ඉවහල් වනු ඇති බවට අප විශ්වාස කරමු.

අපගේ මූලික ව්‍යාපාරය ගොඩනැඟීමට හා වර්ධනය කිරීමට ඇති අවස්ථාවන් උපයෝජනය කරමින් අභියෝගයන්ට සාර්ථකව මුහුණදීමට රාජ්‍ය දැව සංස්ථාවට හැකියාව හා පෙර සූදානම ඇති බව මාගේ විශ්වාසයයි. ඒ අතරම, අපගේ වර්ධන ගමනට මග සළසන අපගේ වෙළෙඳනාමය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය ආයෝජනයන් හා අපගේ සාර්ථකත්වයට ඉවහල් වන ශේෂ පත්‍රයෙන් පරිභාහිර සාධක ද ශක්තිමත් කිරීමට අප අපේක්ෂා කරන්නෙමු. ''අපගේ පාර්ශවකරුවන් සඳහා අප විසින් නිර්මාණය කරනු ලබන වටිනාකම් තවදුරටත් ඉහළ නැංවීමේ අපේක්ෂාව'' විසින් අපව ඉදිරියටම මෙහෙයවනු ලබන බව මම අවධාරණය කරමි. එම අපේක්ෂාවට අනුගාමීව සමාජීය හා පාරිසරික වගකිව යුතු සංවිධානයක් ලෙස අපගේ අනන්‍යතාවය ශක්තිමත් කිරීමට කටයුතු කරන අතරම, අපගේ පාර්ශවකරුවන් හට තිරසාර වටිනාකමක් ලබාදීම සහතික කිරීම සඳහා රාජ්‍ය දැව සංස්ථාව සිය පූර්ණ අවධානය

යොමුකරනු ඇත. තවද, වත්මන් රජය විසින් දේශීය නිෂ්පාදනකරුවන්ට අපනයනය සඳහා ලබාදීඇති සහය පූර්ණ උපයෝජනය කිරීමට සංස්ථාව කටයුතු කරනු ඇත.

මාගේ කෘතඥතාවය

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් ගරු වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමාටත්, අමාත්‍යාංශ ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයටත්, වනසංරක්ෂණ ජනරාල්තුමා ඇතුළු එම දෙපාර්තමේන්තුවට අනුයුක්ත සියලු කාර්ය මණ්ඩලයටත්, අනෙකුත් සියලු රජයේ නිලධාරීන්ටත්, අපහට ලබාදුන් සහයෝගය වෙනුවෙන් කෘතවේදීත්වය පුදකිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි.

තවද, අධ්‍යක්ෂ මණ්ඩලය යනුවෙන්, සාමාන්‍යාධිකාරි/ප්‍රධාන විධායක නිලධාරිතුමා හා රාජ්‍ය දැව සංස්ථාවෙහි අනෙකුත් සියලු කාර්ය මණ්ඩලය වෙත හා ඔවුන්ගේ දායකත්වය, දැනුම හා හැකියාවන් ඇතුළු සාර්ථකත්වය වෙත පියනගන ගමන්මගෙහි ඔවුන්ගේ පක්ෂපාතීත්වය හා කැපවීම වෙනුවෙන් විශේෂ ස්තුතිය පුදකරමි.

2023 වර්ෂය පහසු වර්ෂයක් වනු ඇතැයි අප අපේක්ෂා නොකරමු. කෙටි කාලීන අභියෝග නොසලකා දිගු කාලීනව අප අවධානය යොමුකර ඇති අතර, අපගේ හැකියාවන් උපරිම ප්‍රතිඵල ලබාදීමට අප කැපවී සිටින්නෙමු. තවද, අපගේ ඉලක්ක ළඟාකර ගනිමින් පාර්ශවකරුවන්ට උපරිම ප්‍රතිලාභයන් ලබාදීමට අප කැපවී සිටින්නෙමු.

එම්.එස්. කරුණාරත්න
සභාපති
රාජ්‍ය දැව සංස්ථාව

සාමාන්‍යාධිකාරි සමාලෝචනය - 2022



ආචාර්ය එන්. ඩී. රුවන්පතිරණ
සාමාන්‍යාධිකාරි / ප්‍රධාන විධායක නිළධාරි

පෙර වසරවලදී මෙන් 2022 වසර සඳහා රාජ්‍ය දැව සංස්ථාවේ වාර්ෂික වාර්තාව ඔබ වෙත ඉදිරිපත් කිරීමට ලැබීම මට ඉමහත් සතුටක් ගෙන දෙයි. රටේ පැවති දේශපාලනික සහ ආර්ථික පරිසරයෙහි ඇති වී ඇති දුෂ්කරතා මධ්‍යයේ වුවද, සමාලෝචිත වර්ෂය තුල ස්ථාවර කාර්යය සාධනයක් දක්නට ලැබුණි. පසුගිය වසරේ මෙන්ම රාජ්‍ය දැව සංස්ථාව අභියෝගාත්මක තත්ත්වයන්ට සුදානම් බවත් ඒවා ජයගැනීමට හැකි බව මෙම වසරේත් පෙන්වා දී ඇත. ජාතික වසංගතයකට (කොරෝනා) මුහුණ දෙන අතරතුර පාලනය කල නොහැකි, ඉහළ යන උද්ධමනය, රුපියලේ අගයේ උච්චාවචනයන් සහ විදේශ විනිමය සංචිත පහත වැටීම, හමුවේ ශ්‍රී ලංකාව ආර්ථික අස්ථාවර අවධියක් පසු කරමින් සිටී. මෙම තත්ත්ව යටතේ සෑම සමාජ, ආර්ථික පන්තියකම සිටින ශ්‍රී ලාංකිකයන්ට මින් පෙර කිසිදා නොදුටු දුෂ්කරතාවලට මුහුණ දීමට සිදු වී ඇත. ස්ථාවර ආර්ථික, දේශපාලන සහ රාජ්‍ය ප්‍රතිපත්තිමය පරිසරයක සහය ඇතිව IMF වැඩසටහනක් ආරම්භ කිරීම මගින් ශ්‍රී ලංකාව ආර්ථික ප්‍රකෘතිය කරා ගෙන යනු ඇතැයි අපි සිතමු. කෙසේ වෙතත් ශ්‍රී ලංකාව ආර්ථිකමය වශයෙන් කෙටි කාලීන හා මාධ්‍ය කාලීන බාධකවලට තවදුරටත් මුහුණ දෙමින් සිටී. මෙවන් වාතාවරණයක වුවද ජාතික දැව අවශ්‍යතාවය සපුරාලීම සඳහා සහය දීමට අපි දිගටම බැඳී සිටිමු.

දැව කර්මාන්තයේ සැබෑ නායකයෙකු ලෙස

දැව කර්මාන්තයේ ප්‍රමුඛ නායකයෙකු ලෙස, අපගේ සේවාවන් හොඳම මට්ටමින් ලබා දෙමින් අපගේ ජාතියේ විශ්වාසය තහවුරු කිරීමට අපගේ කණ්ඩායම් ප්‍රමුඛව කැපවී කටයුතු කළහ. වසර 54ක කාලසීමාව තුල ආරම්භයේ සිටම රාජ්‍ය දැව සංස්ථාවේ සේවකයන් අපගේ ගෞරවනීය පාරිභෝගිකයන් සමඟ වඩාත් සමීපව සහ ඵලදායී ලෙස සහයෝගයෙන් කටයුතු කරමින් අපගේ සැපයුම් සහ අලෙවි පද්ධතිය ශක්තිමත් කළෙමු.

වෙනස්වන පරිසරයේ අවශ්‍යතා සපුරාලමින් දැව නිෂ්පාදනය සහ අලෙවිය නංවාලීමට රාජ්‍ය දැව සංස්ථාව අඛණ්ඩව සිය කැපවීම උපරිමයෙන් සිදුකරමින් සිටී. එබැවින් රාජ්‍ය දැව සංස්ථාවට රට තුල වඩාත්ම විශ්වාසදායක සහ හොඳම තත්වයේ දැව සහ දැව නිෂ්පාදන සපයන ප්‍රමුඛයා වීමට තවමත් හැකි වී ඇත. රාජ්‍ය දැව සංස්ථාව ප්‍රාදේශීය කාර්යාල 12 ක්, ගබඩා 51 ක්, ප්‍රදර්ශනාගාර 9 ක්, දැව සංකීර්ණ 3 ක් සහ ගෘහභාණ්ඩ කර්මාන්ත ශාලා 3 ක් සමඟින් දීප ව්‍යාප්ත මෙහෙයුම් ජාලය හරහා කළමනාකරණය කරමින් මෙහෙයවීම සිදු කරයි.


මෑතකදී ආර්ථිකයේ පසුබෑම සහ ඉන්ධන අර්බුදයේ ප්‍රතිඵලයක් ලෙස ඇතිවූ සියළු දුෂ්කරතාවලට මුහුණ දීමට රාජ්‍ය දැව සංස්ථාව උපරිමයෙන් කැපවිය. පසුගිය වසර අභියෝගාත්මක වසරක් වුවද, බාධක සමඟ වෙනස් වන වෙළඳපොල තත්වයන්ට අනුවර්තනය වීමට සිය ක්‍රියාකාරී සැලැස්ම අඛණ්ඩව කරගෙන යමින්, සිය උපායමාර්ගික මුලපිරීම් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට රාජ්‍ය දැව සංස්ථාවට හැකි විය.

ප්‍රශස්ත කාර්යය සාධනයක්

වත්මන් මූල්‍ය වර්ෂය තුල ලබාදුන් ප්‍රශස්ත කාර්ය සාධනය, රාජ්‍ය දැව සංස්ථාව උපාය මාර්ගිකව කටයුතු කර ඇති බවට සාක්ෂි

දරණ අතර එහි ප්‍රතිඵලයක් ලෙස වෙනස්වන වෙළඳපොළ තත්වයන් සඳහා අනුගතවීමට හැකි වී ඇත.

2022 වසර අවසානයේදී, අපි අපගේ ඉලක්ක සපුරා ගනිමින් අපගේ ධාරිතා මට්ටම් පුළුල් කළෙමු. කෙසේ වෙතත් රටේ දේශපාලන හා ආර්ථික පසුබිම සමඟ ස්ථාපිත ඉලක්ක වෙත ලඟාවීම සඳහා සෑම කණ්ඩායමකම මෙහෙයුම් කාර්යයන් අභියෝගාත්මක වේ. 2022 වර්ෂයෙන් අවසන් වූ මුල්‍ය වර්ෂයේදී රාජ්‍ය දැව සංස්ථාවේ ආදායම රුපියල් මිලියන 4743කි. 2022 වසර ජයග්‍රාහී වසරක් වන අතර, සියලු අභියෝගවලට මුහුණ දෙමින් රුපියල් මිලියන 1016 ක ලාභයක් ඉපයීමට සමත් විය. අපගේ සාර්ථකත්වය මත මෙම වසරේදී ඉපයීමට හැකි වූ බදුවලට පෙර ලාභය වන රුපියල් මිලියන 1016 වුවත් එය පෙර වසරේදී රුපියල් මිලියන 1496 ක් විය. පවතින බාධා හමුවේ පසුගිය වසරට වඩා අමතර ලාභයක් ඉපයීමට නොහැකි වුවද පරිපාලන වියදම්, මූල්‍ය වියදම්, වැනි අපගේ වියදම් සපුරාගැනීමට හැකි විය. රාජ්‍ය දැව සංස්ථාව විසින් රුපියල් මිලියන 1039 පරිපාලන වියදම් ලෙසද, රුපියල් මිලියන 955 ක් විකිණුම් සහ බෙදාහැරීමේ වියදම් ලෙසත් මෙම වසරේදී වැය කර ඇත. මෙම වසරේ ලාභය අඩු වීමට ප්‍රධාන හේතුව වන්නේ ඉන්ධන මිල ඉහල යාම, ප්‍රවාහන වියදම ඉහල යාමත් වේ. පවතින ආර්ථික අර්බුදය 2022 වසරේ සැලකිය යුතු ලෙස ආයතනික මුදල් ප්‍රවාහයට බලපාන ලදී. රාජ්‍ය දැව සංස්ථාවේ නිෂ්පාදන අයිතම අතර 2022 වර්ෂයේ කඳන් වලින් ලබාගත් ආදායම අනෙක් අයිතමයන්ට වඩා ඉහළ අගයක් ගෙන



ජාතියේ විශ්වාසය දිනූ නිෂ්පාදන

රාජ්‍ය දැව සංස්ථාව විසින් උසස් තත්වයේ කඳන්, ඉරු දැව, සිල්පර, වැට කණු, විදුලි කණු, අලිවැට කණු සහ ගෘහභාණ්ඩ නිෂ්පාදනය කරයි. ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ ප්‍රධාන දැව සැපයුම්කරුවා වන්නේ රාජ්‍ය දැව සංස්ථාවයි. අනෙකුත් දැව කර්මාන්ත සමඟ තරඟකිරීම දුෂ්කර වුවද විශ්වාසනීය උසස් තත්වයේ භාණ්ඩ පිරිනැමීමෙන් රාජ්‍ය දැව සංස්ථාව නිරන්තරයෙන්ම ජාතියේ හඳවත් දිනා ගනී. ප්‍රධාන දැව සපයන වෙළඳ ආයතනය ලෙස මොරටුව දැව කර්මාන්තකරුවන් සඳහා දැව සැපයීම සිදුකරයි. වසර ගණනාවක් පුරා අපගේ සිල්පර, අලිවැට කණු, වැට කණු සහ විදුලි කණු මිලදී ගත් අපගේ ප්‍රධාන විශ්වාසනීය සේවාදායකයන් වූයේ ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව, වන ජීවී දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලයයි. තවද අපගේ විශ්වසනීය පාරිභෝගිකයන් තවමත් අපගේ උසස් තත්ත්වයේ ගෘහභාණ්ඩ වෙත ඇදී යයි. අපගේ ගෘහභාණ්ඩ නිෂ්පාදන සඳහා සැමදා හොඳ ප්‍රතිචාර පාරිභෝගික ජනතාවගෙන් ලැබී ඇත.

ජයග්‍රහණ

රාජ්‍ය දැව සංස්ථාව සේවකයන් 1500කින් පමණ සමන්විත වන අතර වාර්ෂික ආදායම ලෙස රුපියල් බිලියන 4.7 ක් පමණ උපයන ආයතනයකි. පසුගිය වසර කිහිපය තුල ඉන්ධන සහ ආර්ථික අර්බුධය තුල රුපියල් මිලියන 1016 ලාභයක් ලබාගනිමට සංස්ථාවට හැකි විණි. මෙවැනි ජයග්‍රහණ අගයමින් ජාතික මට්ටමේ නිෂ්පාදන හා සේවා කර්මාන්ත සඳහා ලංකා ජාතික කර්මාන්ත මණ්ඩලය සහ ජාතික වාණිජ මණ්ඩලය විසින් සංවිධානය කරන ලද සම්මාන උළෙලවලදී හොඳම සමානය ලබා ගැනීමටද රාජ්‍ය දැව සංස්ථාවට හැකි විය. රාජ්‍ය දැව සංස්ථාව පසුගිය වසර 54ක ඉතිහාසය පුරා වසර ගණනාවක් ජාතික ව්‍යාපාර විශිෂ්ටතා රන් සම්මාන වලින්ද පිදුම් ලබා ඇත.

ආයතනික සමාජ වගකීම සහ ඒ සඳහා කැපවීම

ආයතනික සමාජ වගකීම ඉටුකිරීම සඳහා ආදායම් උත්පාදනයට එහා ගිය සමාජ මෙහෙවරක් රාජ්‍ය දැව සංස්ථාව මගින් ඉටු කර ඇත. ආයතනය සහ ප්‍රජාව යන දෙඅංශයම ශක්තිමත් කිරීමට කැප වී සිටින රාජ්‍ය දැව සංස්ථාවේ පර්යේෂණ සංවර්ධන හා පුහුණු අංශය මගින් මෙම කටයුතු නිරතුරුව සිදු කරනු ලබයි.

රාජ්‍ය දැව සංස්ථාවේ පර්යේෂණ සංවර්ධන හා පුහුණු අංශය මගින් 2022 වසරේ පුහුණු වැඩසටහන් සඳහා වැයකල මුළු මුදල රු. 3,855,849ක් වන අතර පුහුණු වැඩසටහන් 70ක් සඳහා සේවා යෝජකයන් 861ක් පුහුණු කර ඇත. නිලධාරි 16 දෙනෙකු ජාත්‍යන්තර පුහුණු වැඩසටහන් 3 ක් වෙත මාර්ගගත ක්‍රමයෙන් සහභාගී කරවා ඇත. තවද දැව කර්මාන්තය සම්බන්ධව ඇති NVQ පාඨමාලා කිහිපයක්ද පවත්වන ලදී. මෙම පුහුණුලාභීන් 404ට අමතරව පවත්වන ලද භාහිර පුහුණු වැඩසටහන් මගින් පුහුණු කරන ලදී. මීට අමතරව රාජ්‍ය දැව සංස්ථාවෙහි පර්යේෂණ සහ පුහුණු අංශය ආයතනයේ ව්‍යාපාරික අවශ්‍යතා ඇතුළු මෙම ක්ෂේත්‍රයේ පැනනගින ගැටළු විසඳීම සඳහා සමාජයට අවශ්‍ය නව දැනුම මෙන්ම දැව සම්බන්ධ පර්යේෂණ සිදු කරයි. රාජ්‍ය දැව සංස්ථාවෙහි පර්යේෂණ සහ පුහුණු අංශය විසින් නිරන්තර දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදි. දැනුම භාහිර ප්‍රජාව සමඟ බෙදාගැනීමට සැමවිටම සම්මන්ත්‍රණ සහ ලිපි ප්‍රකාශන ආදිය ප්‍රකාශයට පත් කිරීමට කටයුතු කරයි. පර්යේෂණ පත්‍රිකා 2ක්, සඟරා ලිපි 4ක් යනාදිය ඇතුළුව ලිපි 6ක් 2022 දී ප්‍රකාශයට පත් කර ඇත.

රාජ්‍ය දැව සංස්ථාවේ පර්යේෂණ සංවර්ධන හා පුහුණු අංශයේ එක් ප්‍රධාන රාජකාරියක් වන්නේ නවීන තාක්ෂණය භාවිතා කරමින් දැවවල අභ්‍යන්තර පටක විශ්ලේෂණය කර දැව හඳුනා ගැනීමයි. සෑම වසරකම දැව හඳුනාගැනීමේ සහතික 150-200ක් සහ අනෙකුත් දැව සම්බන්ධ වාර්තා රජයේ සහ රාජ්‍ය නොවන කණ්ඩායම් වෙත නිකුත් කරයි. දැව හඳුනාගැනීමට අමතරව දැව ශක්තිය සම්බන්ධ පරීක්ෂා වන MOE, MOR, සම්පිණ්ඩන, ආතති පරීක්ෂා ද ඝනත්ව සඳහා වන පරීක්ෂා ද කල්පැවැත්ම සඳහා පරිරක්ෂණ ක්‍රම වන Boron, CCB වැනි පරිරක්ෂක යොදා ගනිමින් සිදු කරන පරීක්ෂාද කරනු ලැබේ.

මීට අමතරව, රාජ්‍ය දැව සංස්ථාවේ ප්‍රාදේශීය කාර්යාල 14ක් පුරා විසිරි ඇති පැල තවාන් 28ක් හරහා පැල නිෂ්පාදනය සිදු කෙරේ. රාජ්‍ය දැව සංස්ථාවේ තවාන්වලින් නිෂ්පාදිත පැල 2022 වසරේදී විවිධ රුක් රෝපණ වැඩසටහන් හරහා බෙදා දී ඇත. SLASS සමඟ එක්ව 2022 වසරේදී වේවැල්දෙණිය වීරසුරියකන්ද කනිෂ්ඨ විද්‍යාලයේ Little forester රුක් රෝපණ වැඩසටහන පවත්වන ලදී. රුක් රෝපණ ක්‍රියාකාරකම් සඳහා පැල හැර කෘෂිකාර්මික උපකරණ කට්ටලය සහ රාජ්‍ය දැව සංස්ථාවේ ප්‍රකාශන (තිරසාර වන කළමනාකරණය, ජෛව විවිධත්වය, දැව ගෘහ නිර්මාණ ශිල්පය සහ විවිධ ගස් විශේෂ පිලිබඳ පත්‍රිකා) එකතුවක් පාසලට පරිත්‍යාග කරන ලදී.

ඉදිරි දැක්ම සහ අපේක්ෂාවන්

අදාළ වර්ෂය තුල රාජ්‍ය දැව සංස්ථාව බාධකවලට නිවැරදිව මුහුණ දී ඇති අතර වසංගත කාලපරිච්ඡේදය සමඟ ආරම්භ වූ දුෂ්කර මාවතේ ගමන් කර සාර්ථක ප්‍රතිඵල ලබා ඇත. අතීතයෙන් ලබාගත් අත්දැකීම් තුලින් ඉදිරි වසරවලද උපාය මාර්ගික ක්‍රියාකාරකම් භාවිතා කරමින් සාර්ථක කරගැනීමට අපේක්ෂා කෙරේ. තවදුරටත් අපගේ කළමනාකරණයෙන් ඔබ්බට වන අස්ථාවර ආර්ථික පරිසරයක විදේශ විනිමය අඩුවීම, උද්ධමනය වැඩිවීම, පොලි අනුපාත ඉහල යාම සහ රුපියලේ අගය අවප්‍රමාණය වීම තුලින් පුද්ගලයින්ට සහ ඉදිකිරීම් කර්මාන්තය ඉදිරි කාලය තුල අතිශය දුෂ්කරතා, ගැටළුවලට මුහුණදීමට සිදුවන බැවින් එමගින් අපගේ මෙහෙයුම් පරිසරයද පීඩාවට ලක්වීම නොවැලක්විය හැක.

ශ්‍රී ලංකාවේ ආර්ථිකය බිඳවැටීම නිසා දැව කර්මාන්තය වැනි කර්මාන්ත තදබල ලෙස පීඩාවට ලක්විය. මෙම බාධක හමුවේ රාජ්‍ය දැව සංස්ථාවට ඉහළ කාර්ය සාධනයක් ලබාගත හැකිවුයේ පිරිවැය ප්‍රශස්තකරණය තුලින් නිෂ්පාදන වටිනාකම උපරිම කිරීම හරහාත් නිෂ්පාදන පරිමාව මත පදනම් වූ දැව නිෂ්පාදන වර්ධනය කිරීම හරහාත් කාර්යක්ෂම කණ්ඩායම් කළමනාකරණය හරහාත් සහ ව්‍යාපාර සංකුලතා මධ්‍යයේ වුවද දැනුම සහ අත්දැකීම් ගොඩනගාගැනීම හරහාත් වේ. රාජ්‍ය දැව සංස්ථාව විසින් දැව අපනයනය සහ දැව කර්මාන්තය සඳහා අවශ්‍ය යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම් ඉදිරියේදී ක්‍රියාත්මක කරනු ලැබේ. අපනයනය සඳහා ඇති සීමා ඉවත් කිරීමෙන් පසු පයිනස් සහ කළුවර ගෘහ භාණ්ඩ අනාගතයේදී අපනයනය කිරීමට බලාපොරොත්තු වේ.

පයිනස් දැව වල ඇති සුවිශේෂී දැවමය ලක්ෂණ මනා ලෙස අවධානය කර රාජ්‍ය දැව සංස්ථාව පයිනස් නිෂ්පාදන සඳහා දේශීය හා විදේශීය වෙළඳපොල වර්ධනය කිරීම කෙරෙහි අවධානය

යොමු කරමින් සිටි. නිෂ්පාදන අගය එකතු කල නිෂ්පාදන විවිධාංගිකරණය තුලින් ආයෝජනය වැඩි කිරීමට අපේක්ෂා කෙරේ. අනාගත ඉලක්ක වැඩිපුරම කේන්ද්‍රගත වන්නේ ගෘහභාණ්ඩ කර්මාන්තය වැඩිදියුණු කිරීම තුලින් ආදායම් වැඩි කිරීමයි. පයිනස් ඇතුළු දැව භාවිතය සමාජයේ ව්‍යාප්ත කිරීම, දැව භාවිතය මගින් පාරිසරික සංරක්ෂණ අරමුණු දිරිගැන්වීම අපගේ එක් ඉලක්කයක් වී ඇති නැවුම් පෙනුමක් සමඟ භාණ්ඩවල ගුණාත්මකභාවය ඉහල නැංවීම සඳහා රාජ්‍ය දැව සංස්ථාව විසින් අස්වනු නෙලීමේ ක්‍රියාවලින්, පදම් කිරීම හා පරිරක්ෂණ ක්‍රමවේද මෙන්ම දැව ශ්‍රේණිකිරීමේ ක්‍රමවේද කෙරෙහි දැඩි අවධානයක් යොමු කිරීමට සැලසුම් කර ඇත.

මීට අමතරව ෆින්ගර් ජොයින්ට් ඒකකය වැඩි දියුණු කල යුතුය. බොහෝ පාරිභෝගිකයන් මෙම භාණ්ඩවලට කැමැත්තක් දක්වන බැවින් මෙම නිෂ්පාදන නුදුරු අනාගතයේදී අපනයනය කිරීමට උත්සාහ කරනු ඇත. කැප්පෙටිපොල සහ අම්පාර ගෘහභාණ්ඩ කර්මාන්තශාලා සඳහා මෙන්ම සියළුම ගෘහභාණ්ඩ නිෂ්පාදන සහ ෆින්ගර් ජොයින්ට් සඳහා සහතිකය ඉදිරි වර්ෂයේදී ලබාගැනීමට අපේක්ෂා කෙරේ. ISO 9001:2015 ප්‍රමිතීන් ලබාගැනීමත් සමඟ රාජ්‍ය දැව සංස්ථාවේ ක්‍රියාකාරී සැලැස්ම අනාගතයේ වෙනස්වන වෙළඳපොල තත්වයන්ට අනුගත වනු ඇත.

ස්තුතිය පුදකිරීම

අධ්‍යක්ෂක මණ්ඩලයෙහි මගපෙන්වීම නොමැතිව මෙම ජයග්‍රහණ ලබාගැනීමට අපට පහසු නොවන බව මම පිළිගනිමි. එබැවින් මෙම සාර්ථකත්වය පවත්වා ගැනීමට සභාපතිතුමා, අධ්‍යක්ෂක මණ්ඩලය, කළමනාකාරිත්වය සහ වැඩ කරන කාර්ය මණ්ඩලය විසින් ලබාදෙන සහයෝගයට මාගේ කෘතඥතාව පළමුව පලකරමි. දුශ්කරතා මැද අප සමඟ සම්බන්ධ වූ අපගේ ගෞරවනීය පාරිභෝගිකයින්ට මගේ ඉහළම ස්තුතිය මින් පිරිනමමි. දැව ආශ්‍රිත නිෂ්පාදන සඳහා ඔවුන්ගේ ප්‍රධාන නියෝජිතයා වීම ගැන අපි ආඩම්බර වන අතර අපගේ හැකියාවෙන් උපරිමයෙන් ඔවුන්ට සුවිශේෂී භාණ්ඩ සැපයීමෙන් ඔවුන්ට සහය වීමට අපි සැමවිටම සූදානමින් සිටින්නෙමු. අවසාන වශයෙන් මම වනජීවී සහ වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශයේ ගරු. අමාත්‍යතුමාට, අපගේ අමාත්‍යාංශයේ ලේකම්තුමාට සහ කාර්ය මණ්ඩලයට ''වනසංරක්ෂණ ජනරාල් සහ වනසංරක්ෂණ දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයට ඔවුන්ගේ නොමඳ සහයෝගය සහ සහයෝගීතාවය වෙනුවෙන්මගේ අවංක කෘතඥතාව පළ කිරීමට කැමැත්තෙමි. ඔවුන්ගේ මගපෙන්වීම සහ ඥානවන්ත උපදෙස් සඳහා ඔවුන් සෑම කෙනෙකුටම ස්තුති කිරීමට මෙය අවස්ථාවක් කර ගැනීමට කැමැත්තෙමි. රාජ්‍ය දැව සංස්ථා පවුලට, ඔවුන්ගේ ධෛර්යය, ආයතනය කෙරෙහි වන හැඟීම නව්‍ය බව සහ වෙහෙස නොබලා වැඩකිරීම නිසා දිවයින පුරා සිටින අපගේ ප්‍රජාවන්ට අඛණ්ඩව සේවය කිරීමට අප සමත්වීම පිළිබඳව මාගේ ඉමහත් ප්‍රණාමය දැව පවුලට පුද කරමි. අවසාන වශයෙන් රාජ්‍ය දැව සංස්ථාව කෙරෙහි විශ්වාසය තැබීම වෙනුවෙන් අපගේ වටිනා ගනුදෙනුකරුවන් සැමදා අගය කරමි.



ආචාර්ය එන්.ඩී. රුවන්පතිරණ
සාමාන්‍යාධිකාරී / ප්‍රධාන විධායක නිළධාරී
රාජ්‍ය දැව සංස්ථාව

අපගේ කාර්යභාරයන්

- වනාන්තරවලින් දැව කපා ඉවත්කිරීම, එම දැව ඉරූ දැව හා නිමි භාණ්ඩ බව පරිවර්තනය කිරීම, දැව කඳන්, ඉරූ දැව හා නිමි භාණ්ඩ නිෂ්පාදන අලෙවිය සහ යටෝක්ත කාර්යයන් සඳහා කැලෑ මාර්ග ඉදිකිරීම.

- දැව කඳන් කිරීමේ මධ්‍යස්ථාන, ඉරුම් මෝල්, තෙල් කැවීමේ හා පරිරක්ෂණ යන්ත්‍රාගාර, දැව වියළීම හා වියළීමේ උඳුන් හා අවශ්‍ය උපකරණ මිළදීගැනීම, ඉදිකිරීම හා ක්‍රියාකරවීම.

- දැව අලෙවි මධ්‍යස්ථාන පවත්වාගෙන යාම.

- දැව අතුරු භාණ්ඩ නිෂ්පාදනය හා අලෙවිය

- දැව ආනයනය කිරීම.

- වන වගාවල ව්‍යාපෘති ආරම්භ කිරීම. නැවත වනවගා කිරීම් කැලෑ සහ වනවගාවන් විද්‍යාත්මකව කළමනාකරණය කිරීම.

- කෘෂිකාර්මික නිෂ්පාදන

- දැව ආශ්‍රිත නිමි හා අර්ධ නිමි භාණ්ඩ නිෂ්පාදන අපනයනය කිරීම.

- පෞද්ගලික ඉඩම්වලින් දැව මිලදීගැනීම.

- වනාන්තර ආශ්‍රිත නිෂ්පාදන පිරි සැකසුම.

- වේවැල් ආනයනය කිරීම.

- නියැදි පරීක්ෂා කිරීම් මඟින් දේශීය හා ආනයනය කරන ලද දැව හඳුනාගැනීම සහ දැව සම්බන්ධ සහතික නිකුත් කිරීම.

- දැව කර්මාන්තය ආශ්‍රිත විෂයයන් පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම, සහතික ප්‍රදානය කිරීම සහ පරිසරය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම.

- සංස්ථාවට අයත් ඉඩම් හා ගොඩනැඟිලිවල සම්පූර්ණ ප්‍රයෝජනය ලබාගැනීම සඳහා සැළසුම් කිරීම සහ ඒ වෙනුවෙන් ආයෝජනය කිරීම.

අපගේ ව්‍යාපාරික වටිනාකම්

- ඉතාමත් පරිසර හිතකාමී සහ වාණිජ වශයෙන් ජීවමාන රාජ්‍ය අංශයේ ආයතනයක් ලෙස අපගේ ස්ථාවරත්වය පවත්වාගෙන යෑම අපගේ ප්‍රමුඛ වගකීම ලෙස හඳුනාගනිමු.

- පිවිතුරු සහ හිතකාමී පරිසරයක් සුරක්ෂිත කිරීම සඳහා වනාන්තර සහ දැව ඉවත් කිරීමේ විද්‍යානුකූල කළමනාකරණයට සම්බන්ධ සියලුම ව්‍යවස්ථාපිත රෙගුලාසීන්ට අනුකූලව එය ඉටුකිරීමට අපි කැපවෙමු.

- ගනුදෙනුකරුවන් සමඟ ආචාරශීලි ව්‍යාපාරික සබඳතා ගොඩනඟා ගනිමින්, ඔවුනට සහ සියලුම ශ්‍රී ලාංකිකයන්ට වටිනාකම් නිර්මාණය කිරීම අපගේ පැවැත්මේ මූලික ම කාරණය ලෙස අපි පිළිග න්නෙමු.

- කුසලතා වර්ධනය, වෘත්තීය සංවර්ධනය සහ නිරන්තර අධ්‍යාපනය සහ පුහුණුව තුළින් අපගේ සේවා නියුක්තිකයන්ගේ ඵලදායීතා මට්ටම ඉහළ නැංවීම සඳහා කටයුතු කරන්නෙමු.

- ගනුදෙනුකරුවන්ට කාර්යක්ෂම සහ ආචාරශීලී සේවයක් සැපයීම සඳහා අපගේ සියලු කාර්යයන්හි දී ඔවුන්ව මූලිකව තබා ගනිමින් කටයුතු කරන්නෙමු.

- සියලුම මෙහෙයුම් කටයුතුවලදී සහ සේවා සැපයීමේදී පුද්ගලික අවංකභාවය ඉතා ඉහළින්ම තබාග න්නා බවට සහතික වන්නෙමු.

- අනාගත පරපුරේ අගනා ජාතික උරුමයන් ලෙස පරිසරය සහ වන සම්පත ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සම්බන්ධයෙන් සියලුම ව්‍යවස්ථාපිත රෙගුලාසි සහ සමාජීය ප්‍රතිමාන අනුගමනය කරන්නෙමු.



අධ්‍යක්ෂ මණ්ඩලය - 2022

- **එම්.එස්.කරුණාරත්න මහතා**
  සභාපති
  රාජ්‍ය දැව සංස්ථාව

- **ආචාර්ය කේ.එම්.ඒ.බණ්ඩාර මහතා**
  අධ්‍යක්ෂ
  වන සංරක්ෂක ජනරාල්

- **එස්.ඒ.සී.කුලතිලක මහත්මිය**
  අධ්‍යක්ෂ
  භාණ්ඩාගාර නියෝජිත


- **බී.ටී.බණ්ඩාර දිසානායක මහතා**
  අධ්‍යක්ෂ

- **එම්.ආර්.අජිත් කුමාර බණ්ඩාර මහතා**
  අධ්‍යක්ෂ

- **පී.ඩී.බී.බස්නායක මහතා**
  අධ්‍යක්ෂ

- **ඩී.ජී.එස්. දසනායක මහතා**
  අධ්‍යක්ෂ

- **කේ.අයි.ඩී.පී.කාරියවසම් මිය**
  අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්



ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මඩුල්ල - 2022


ජී.ඩී.එස්. කුමාරසිංහ මයා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්)

එම්.ඒ.සී.එන්.සමරසිංහ මයා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා පාලන)

එම්.සී. දේවේන්ද්‍ර මයා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්)

ඩබ්.බී. සමන්ත මයා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අලෙවි)

ජී.ජී.තිසර ගමගේ මයා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(ඉංජිනේරු හා නිෂ්පාදන) (වැ/අ)



2022 වසර සඳහා අධ්‍යක්ෂ මණ්ඩල සමාලෝචනය

රාජ්‍ය දැව සංස්ථාවෙහි 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන හා අපගේ වාර්තාව ඉදිරිපත් කිරීම සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලය ලෙස අප සතුටට පත්වන්නෙමු.

හැඳින්වීම

රාජ්‍ය දැව සංස්ථාව 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනත යටතේ, 1968 අප්‍රේල් මාසයේ දී සංස්ථාවක් ලෙස ස්ථාපනය කරන ලදී. රාජ්‍ය දැව සංස්ථාව 1968 දී අංක 49 දරණ රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ විධිවිධාන යටතේ පිහිටුවන ලද රාජ්‍ය ආයතනයක් ලෙස ස්ථාපිත කරන ලදී. රාජ්‍ය දැව සංස්ථාවේ ප්‍රධාන කාර්යාලය ''සම්පත්පාය, බත්තරමුල්ල හි පිහිටා ඇති අතර, ප්‍රාදේශීය කාර්යාල දිවයින පුරා පිහිටා ඇත.

ප්‍රධාන ක්‍රියාකාරකම්

රාජ්‍ය දැව සංස්ථාව මූලික වශයෙන් තම ආදායම් උපයාගනු ලබන්නේ දැව හා දැව පදනම් කරගත් නිෂ්පාදන අලෙවියෙනි.

ව්‍යාපාර සමාලෝචනය

රාජ්‍ය දැව සංස්ථාව ගුණාත්මකබව හා කැපීපෙනෙන කණ්ඩායම් හැඟීම මත ගොඩනැඟුණ විශ්වාසය පිළිබඳ අතීතයක් හා උරුමයක් ඇති කීර්තිමත් දැවැන්තයෙකි. ශ්‍රී ලංකාවේ ගුණාත්මක හා විශ්වාසදායීම දැව සැපයුම්කරු ලෙස රාජ්‍ය දැව සංස්ථාව එහි ආරම්භක වර්ෂය වන 1968 වසරේ සිටම තම ව්‍යාපාරය ගොඩනඟා ඇත. එමෙන්ම, මෙම ව්‍යාපාරය උදෙසා වන මාර්ගය සමෘද්ධිමත් අවසානයක් වෙත ගමන්ගන්නා මාර්ග යකි. නවෝත්පාදන අරමුණු, පාරිභෝගිකයන් කේන්ද්‍රීය කරගත් සැලසුම් තවදුරටත් ව්‍යාපාරයේ සාර්ථකත්වය හා වටිනාකම් ඉහළ නංවයි.


අවිනිශ්චිතතාවයන් හා ඉතා අභියෝගාත්මක පරිසරයක් තුළ වුවද, සමාලෝචිත වර්ෂය තුළ ස්ථාවර කාර්ය සාධනයක් ලබා ඇත. ඒ තුළින් දුෂ්කම අවස්ථා තුළ නොසැලී සිටීමට රාජ්‍ය දැව සංස්ථාව සතු හැකියාව හා සූදානම මනාව පිළිබිඹු වේ. ශ්‍රී ලංකාව කොවිඩ් 19 වසංගතය අතර ඉදිරියට ගමන් කළද, තිරසාර නොවන ණය, උද්දමනය රුපියලේ උච්චාවචනය හා විදේශ විනිමය සංචිත හිඟය හමුවේ ශ්‍රී ලංකා ආර්ථිකය අස්ථාවර විය. එබැවින් විවිධ සමාජ ස්ථරවල සිටින සියලු ශ්‍රී ලාංකිකයින් පෙර නොවූ දුෂ්කරතාවලට මුහුණ දුනි. කෙසේ වෙතත්, ජාතික ආර්ථිකයට ඇති අභියෝග කෙටිකාලීන හා මධ්‍යකාලීන ලෙස අඛණ්ඩව පවතිනු ඇත.


අගය උපරිම කිරීම සඳහා පිරිවැය ප්‍රශස්ථිකරණය, පරිමාව මත පදනම් වූ වර්ධනය කෙරෙහි ඉහළ අවධානයක් යොමුකිරීම, ජවසම්පන්න කළමනාකරණය ඇතුළු 2021 වර්ෂයේදී මුහුණපෑමට සිදුවූ ව්‍යාපාරික ගැටළු සඳහා විසඳුම් සෙවීමේදී අප ලබාගත් අත්දැකීම් සහ දැනුම උපයෝජනය කරගැනීම තුළින් සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ ශක්තිමත් කාර්ය සාධනයක් ළඟාකර ගැනීමට රාජ්‍ය දැව සංස්ථාව සමත් විය.


මූල්‍ය කාර්ය සාධනය

ආර්ථික අර්බුධය පාරිභෝගික හැසිරීම මත සහ අපගේ ඇතැම් නිෂ්පාදන අයිතමවල ක්‍රියාකාරිත්වය කෙරෙහි සැළකිය යුතු බලපෑමක් ඇති කළේය. රාජ්‍ය දැව සංස්ථාව විසින් 2022 වර්ෂයේ ආදායම ලෙස රුපියල් මිලියන 4,743 ක් උපයා ඇති අතර, එය පසුගිය වසරට සාපේක්ෂව 17%ක පහළ බැසීමකි. එමෙන්ම, සංස්ථාව විසින් 2022 වර්ෂය සඳහා උපයා ඇති දළ ලාභය රුපියල් මිලියන 2,291 ක් වන අතර, එය පෙර වසරට සාපේක්ෂව 17% ක පහළයැමකි.

කාර්ය සාධනය	2021	2022
	රු.මිලි	රු.මිලි
පිරිවැටුම	5,696	4,743
දළ ලාභය	2,754	2,291
මෙහෙයුම් ලාභය	1,245	330
මෙහෙයුම් නොවන ආදායම්	251	686
භාණ්ඩාගාර බදු සහ ආදායම් බදු පෙර ලාභය	1,496	1,016







සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ රාජ්‍ය දැව සංස්ථාව විසින් රුපියල් මිලියන 1,016 ක බදු පෙර ශුද්ධ ලාභය වාර්තා කළ අතර, එය පෙර වර්ෂයට සාපේක්ෂව -32%ක වර්ධනයකි. රැකියා අවස්ථා ලබාදීම තුළින් ශ්‍රී ලංකාවේ විරැකියාව තවදුරටත් අඩුකිරීම සඳහා රජයට සහයවීම හා වෙළෙඳපොළට ගුණාත්මක නිෂ්පාදන සැපයීම රජයේ ආයතනයක් වශයෙන් රාජ්‍ය දැව සංස්ථාවෙහි වගකීමක් වශයෙන් අප සළකනු ලබයි. 2022 වර්ෂයේ ආර්ථික අවපාතය යටතේ වුවදී සංස්ථා සේවකයන්ගේ රැකියා සුරක්ෂිතතාව තහවුරු කරමින් සේවක පිරිවැය ලෙස රුපියල් මිලියන 1,776ක් වැයකර ඇත. 2022 වර්ෂයේ මුළු ස්ථීර සේවක සංඛ්‍යාව 1,500 ක් වූ අතර, 2021 වසරේ 1,606 කි.

2021 හා 2022 වර්ෂ සඳහා වත්කම් මත ප්‍රතිලාභ සහ හිමිකම මත ප්‍රතිලාභ පහත පරිදි වේ.

Performance	ROA	ROE
	%	%
2022	6.6%	8.3%
2021	13.4%	18.3%

2021 වර්ෂයේ දී 13.4% ක් වූ බදු ගෙවීමට පෙර සාමාන්‍ය වත්කම් මත ප්‍රතිලාභ 2022 වර්ෂයේ දී 6.6% දක්වා පහළ ගිය අතර, 2021 වර්ෂයේ දී 18.3% වූ සාමාන්‍ය කොටස් මත ප්‍රතිලාභ (ROE) 2022 වර්ෂයේදී ද 8.3% දක්වා පහළ බැසිණි. සමාලෝචනයට භාජනය වූ වර්ෂයෙහි රජයේ ආදායමට සංස්ථාවේ දායකත්වය රුපියල් මිලියන 2,387 වන අතර, භාණ්ඩාගාරයට ගෙවන ලද රු.මිලියන 320 ක බදුද එයට ඇතුළත් වේ.

නිෂ්පාදනය

මෙහෙයුම් ක්‍රියාවලිය පරිසර හිතකාමී වීම ගුණාත්මක ඉහළ නිෂ්පාදන මට්ටමක් පවත්වා ගැනීම සඳහා මෙන් ම ආයතනයේ පැවැත්මට සහ ලාභදායිතාවයට මෙන් ම ආයතනික අභ්‍යන්තර හා බාහිර සංරචකවල යහපැවැත්මට අත්‍යවශ්‍ය බව සංස්ථාව තරයේ විශ්වාස කරයි.

රජය විසින් පනවනු ලබන නීති හා රෙගුලාසි වලට එකඟතාවය දක්වමින් ඒවාට අනුකූලව කටයුතු කිරීම, ක්‍රමවත් වැඩබිම් වර්ගීකරණ ලැයිස්තුවක් සකස් කිරීම, විද්‍යාත්මක දැව නිස්සාරණය, නිවැරදි දැව පරිරක්ෂණ ක්‍රම භාවිතය, විධිමත් අයුරින් යන්ත්‍රෝපකරණ ස්ථාපනය කිරීම සහ නඩත්තු කිරීම, සේවකයින් බඳවාගැනීමේ සහ සංවර්ධනය කිරීමේ නිවැරදි ක්‍රමවේදයක් ඇති කිරීම, සංස්ථාවේ කෙටි හා දිගුකාලීන අරමුණු තිරසාර ආකාරයකින් ඉටුකර ගැනීමට ඉවහල් විය. සැබවින් ම රාජ්‍ය දැව සංස්ථාව යනු ශ්‍රී ලංකාවේ තිරසාර වන කළමනාකරණය සඳහා දායකත්වය සපයන ප්‍රධාන ආයතනයයි.

- ඊට අමතරව කර්මාන්තයේ ප්‍රතිවාදීන්ට වඩා තරඟකාරීව වාසි ලබාගැනීම සඳහා පහත සඳහන් උපයා මාර්ග ක්‍රියාත්මක කිරීමට රාජ්‍ය දැව සංස්ථාව අදහස් කර ඇත.
- වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා වනජීවී දෙපාර්තමේන්තුව විසින් නිදහස් කරනු ලබන වනවගා විද්‍යාත්මක දැව නිස්සාරණය කිරීම සඳහා කටයුතු කිරීම.
- වෙළෙඳපොළ සඳහා කඳන්, දුම්රිය දෙපාර්තමේන්තුව වෙත සිල්පර, විදුලිබල මණ්ඩලය සඳහා විදුලිකණු හා වනජීවී දෙපාර්තමේන්තුව සඳහා අලිවැටකණු මෙන්ම පාරිභෝගික ඉල්ලුම සපුරාලීම සඳහා ඉරුදැව නිෂ්පාදනය කිරීම.
- වානිජ වටිනාකමින් යුතු දැව රාජ්‍ය වැවිලි සංස්ථාවෙන් හා පෞද්ගලික ඉඩම්වලින් මිලදීගැනීම.
- පරිත්‍යාග හා වනඅපරාධ දැව ලබාගැනීම.
- වනවගා වැඩසටහන් සඳහා ක්‍රියාකාරිත්ව සහභාගිවීම. (ක්‍රියාකිරීම හා සහභාගීවීම)
- දුම්රිය සිල්පර ආනයනය කර අගයක් එකතු කිරීමෙන් අනතුරුව ප්‍රති අපනයනය කිරීම.

රජයේ කැළෑවලින් දැව හෙළීම්

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් මුදාහරින ලද පරිණත වනවගාවන් හි ප්‍රමාණය අඩුවීම මැතකදී අපට මුහුණදීමට සිදු වූ ප්‍රධාන බාධකයකි. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් වාර්ෂිකව නිදහස් කරන වනවගා ප්‍රමාණය මහා භාණ්ඩාගාරයේ එකඟතාවය මත අමතර ප්‍රමාණයක් නිදහස් කරගැනීමත්, රාජ්‍ය වැවිලි සංස්ථාවෙන් සිල්පර සහ විදුලි සම්ප්‍රේෂණ කණු සඳහා අවශ්‍ය දැව ලබාගැනීමත්, ශ්‍රී ලංකා දුම්රිය සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම් සභාවට අයත් ඉඩම්වලින් දැව ලබාගැනීමටත් අවශ්‍ය කටයුතු සම්පාදනය වෙමින් පවතී.

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් වන කළමනාකරණ සැලැස්මකට අනුව හෙළීම් සඳහා තේක්ක, පයිනස් සහ යුකැලිප්ටස් වැනි වන වගා නිදහස් කරනු ලබන අතර 2021 හා 2022 වර්ෂවල හෙළීම් සඳහා නිදහස් කර ඇති හෙක්ටයාර් ප්‍රමාණය පහත පරිදි වේ.

	පූර්ණ හෙළීම් (හෙක්ටයාර්)		තුනීකිරීම් (හෙක්ටයාර්)	
දැව විශේෂය	2021	2022	2021	2022
තේක්ක	541	450	490	300
යුකැලිප්ටස්	160	100.4	238	110
පයිනස්	265	47.53	-	-
කායා	-	-	244	181
ඇකේෂියා	35	18.4	-	-

ඉරු දැව බවට පරිවර්තනය කිරීම

2021 වර්ෂයේ ඉරුදැව නිෂ්පාදනය ඝන මීටර් 3,924 ට සාපේක්ෂව 2022 වර්ෂය තුළදී ඉරුදැව ඝන මීටර් 3,432 ක් ඉරුම්හල් මගින් නිෂ්පාදනය කර ඇති අතර, ඝන මීටර් 3,441 ක් දිවයින පුරා පිහිටා ඇති දැව අලෙවි ගබඩා මගින් අලෙවි කර ඇත.

විදුලි කණු සහ සිල්පර පරිරක්ෂණය කිරීම

2022 වර්ෂය තුලදී සිල්පර 34,113ක් හා අලිවැටකණු 10,448ක් රාජ්‍ය දැව සංස්ථාවේ කල්දෙමුල්ල, කැප්පෙටිපොල හා බූස්ස පරිරක්ෂණාගාරවලින් පරිරක්ෂණය කර ඇත. පසුගිය වසරට සාපේක්ෂව සිල්පර නිෂ්පාදනය 17.4%කින් ඉහළ ගොස් ඇත.

ගෘහභාණ්ඩ නිෂ්පාදනය

රාජ්‍ය දැව සංස්ථාවේ අම්පාර, කල්දෙමුල්ල හා බූස්ස ගෘහභාණ්ඩ නිෂ්පාදනාගාරවලින් රුපියල්

මිලියන 292 ක් වටිනා ගෘහභාණ්ඩ සළකාබලන වර්ෂය තුලදී නිෂ්පාදනය කර ඇත. ඒ අතර රුපියල් මිලියන 428 (බදු සහිත) ක් වටිනාකමින් යුත් ගෘහභාණ්ඩ රාජ්‍ය දැව සංස්ථාවේ රත්මලාන, නුවර, රත්නපුර, තලල්ල, බූස්ස, අම්පාර, බණ්ඩාරවෙල හා බත්තරමුල්ල ගෘහභාණ්ඩ ප්‍රදර්ශනාගාර වලින් අලෙවි කර ඇත.

තිරසාර නොවන ණය, විදේශ විනිමය හිඟවීම, උද්ධමනය, ඉහළ පොලී අනුපාත හා මුදල් අවප්‍රමාණය හේතුවෙන් ලංකාවේ මෙහෙයුම් පරිසරය තවදුරටත් පීඩනයට පත්වන අතරේ එමගින් පුරවැසියන්ට හා ආයතනවලට දැඩි අභියෝගවලට මුහුණදීමට සිදුවේ. මෙවැනි

2021 - 2022 වර්ෂවල නිෂ්පාදනය, අලෙවිය හා ආදායම

		නිෂ්පාදන ප්‍රමාණය		අලෙවි ප්‍රමාණය		දළ පිරිවැටුම (රු.මිලියන)	
		2021	**2022**	**2021**	**2022**	**2021** (රු.මිලි)	**2022** (රු.මිලි)
කඳන්	M3	127,698	103,121	141,556	102,491	4,929	3624
ඉරුඳුව	M3	3924	3,432	3137	3,441	309	373
සිල්පර	No.	29,049	34,113	29,002	30,969	287	603
විදුලි කණු	No.	2,624	1,837	2,729	2,312	30	34
අලිවැට කණු	No.	11,913	10,448	17,412	11,219	104	71
වට කණු	No.	97,846	78,528	101,880	82,602	12	12
දර	M3.	86,971	93,785	70,075	75,710	49	69
වැට කණු	No.	151,893	84,911	164,913	80,985	22	13
ගෘහභාණ්ඩ	Mn	389	292	-	-	390	428

ඉලක්ක හා ළඟාකරගැනීම් සමාලෝචනය කිරීම සහ අධීක්ෂණය

රාජ්‍ය දැව සංස්ථාවෙහි කළමනාකාරිත්ව මඩුල්ල විසින් දෛනික මෙහෙයුම් කටයුතු වසර ආරම්භයේ ස්ථාපනය කරන ලද අරමුණුවලට අනුකූල වන බව සහතික කිරීම සඳහා හා අරමුණු සහ ඉලක්ක වසර අවසානයේ දී ළඟාකර ගැනීම තහවුරු කිරීම සඳහා අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග ගනු ලබයි. ඒ අනුව ප්‍රගතිය අධීක්ෂණය කිරීම ඇතුළු එක් එක් කලාපයට අදාළව පවත්නා හා ඇති විය හැකි සියලු ගැටළු විසඳීම සඳහා සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් සියලුම ප්‍රාදේශීය කළමනාකරුවන් සහ සංස්ථාවේ ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්ගේ සහභාගිත්වයෙන් මාසික ප්‍රාදේශීය කළමනාකරුවන්ගේ රැස්වීමක් රාජ්‍ය දැව සංස්ථාවෙහි කළමනාකාරිත්වය විසින් පවත්වනු ලබයි.

පසුබිමක් යටතේ, අරමුණු මත හා මූල්‍ය ස්ථායීතාව මත පදනම්ව භාහිර පරිසරයෙහි සිදුවන වෙනස්වීම්වලට ප්‍රතිචාර දක්වීමට කඩිසර වන අතරම, දැව වෙළෙඳපොළෙහි රාජ්‍ය දැව සංස්ථාව සඳහා ඇති ප්‍රමුඛ ස්ථානය තවදුරටත් ශක්තිමත් කිරීම කෙරෙහි අවධානය යොමුකරනු ඇත. මේ අතර, අපගේ ප්‍රජාව කෙරෙහි අපගේ වගකීම අප වටහාගෙන ඇති අතර, අපගේ පාර්ශවකරුවන් හට ඉහල වටිනාකම් ලබාදෙමින් ඔවුන් සමඟ ඉදිරියට යාමට ඇති අඛණ්ඩව කටයුතු කරන්නෙමු.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවට,

එම්.එස්.කරුණාරත්න
සභාපති
රාජ්‍ය දැව සංස්ථාව

අපගේ ආවරණ කලාප
ස්ථාන සිතියම - රාජ්‍ය දැව සංස්ථාව

Head Office - Battaramulla (A12)

Regional Offices
1 Ampara (G11)
2 Anuradhapura (C07)
3 Bandarawela (E12)
4 Colombo (A13)
5 Jaffna (B02)
6 Kurunegala (C10)
7 Kandy (D11)
8 Matara (C16)
9 Monaragala (F12)
10 Nuwara Eliya (D12)
11 Polonnaruwa (E08)
12 Rathnapura (C13)
13 Boossa (B15)
14 Keppetipola (D12)
15 Kaldemulla (A13)

Depots (Sales Centers)

Ampara Region
1 Ampara Depot (G11)
2 Padiyathalawa Depot (F11)
3 Batticaloa Depot (G09)

Anuradhapura Region
4 Anuradapura Depot (C07)
5 Medawachchiya Depot (C06)
6 Talawa Depot (C07)
7 Vauniya Depot (C05)

Bandarawela Region
8 Boralanda Depot (E13)

Colombo Region
9 Kadawatha Depot (A12)
10 Mirigama Depot (B11)
11 Willorawatta Depot (A13)
12 Kaldemulla Depot (A13)
13 Egodauyana Depot (A13)
14 Moratumulla Depot (A13)
15 Pannipitiya Depot (A12)
16 Ratmalana Depot (A13)


Jaffna Region
17 Kilinochchi Depot (C03)
18 Oddusudan Depot (D04)
19 Nallur Depot (B02)
20 Jaffna Depot (B02)

Kurunegala Region
21 Kankaniyamulla Depot (B10)
22 Kurunegala Depot (C10)
23 Nikaweratiya Depot (B09)
24 Melsiripura Depot (C10)
25 Puttlam Depot (A08)
26 Bingiriya Depot (A10)
27 Nainamadama Depot (A11)

Kandy Region
28 Pallekelle Depot (D11)
29 Matale Depot (D10)
30 Nelundeniya Depot (B11)
31 Ethgala Depot (C11)
32 Dambuluoya Depot (D09)
33 Naula (Medapihilla) Depot (D09)

Matara Region
34 Hambantota Depot (E15)
35 Unawatuna Depot (B15)
36 Ambalangoda Depot (B15)
37 Talalla Depot (D16)

Monaragala Region



38 Kumbukana Depot (F13)
39 Wellawaya Depot (E13)

Nuwara Eliya Region
40 Nuwara Eliya Depot (D12)
41 Kitulgala Depot (C12)
42 Harasbedda Depot (D12)

Polonnaruwa Region
43 Kaduruwella Depot (E08)
44 Wilankulama (Trincomalee) (E06)
45 Minneriya Depot (E08)

Rathnapura Region
46 Dela Depot (C13)
47 Beruwala Depot (A14)
48 Timbolketiya Depot (D14)
49 Matugama Depot (B14)

Boossa Region
50 Boosa Depot (B15)

Keppetipola Region
51 Keppitipola Depot (D12)

Furniture Showrooms
1 Head Office - Battaramulla (A12)
2 Rathmalana (A13)
3 Boossa (B15)
4 Pallekele (D11)
5 Ampara (G11)
6 Rathnapura (C13)
7 Talalla (D16)

Furniture Factories
1 Ampara (G11)
2 Kaldemulla (A13)
3 Boossa (B15)

Circuit Bungalows
1 Nuwara Eliya - Kandapola (D12)
2 Nuwara Eliya - Kandapola (New) (D12)
3 Timbolketiya (D14)
4 Sella Kataragama (F14)


Training Centers
1 Kaldemulla - TTTI (A13)
2 Head Office - IT (A12)

Laboratories
1 Head Office (A12)

Mechanical Workshops
1 Kaldemulla (A13)
2 Boralanda (E13)
3 Keppetipola (D12)

Sawmills
1 Kaldemulla (A13)
2 Boossa (B15)
3 Ampara (G11)
4 Keppetipola (D12)
5 Talalla (D16)
6 Ethgala (C11)
7 Dela (C13)
8 Melsiripura (C10)

Seasoning and Impregnation Plant
1 Kaldemulla (A13)
2 Boossa (B15)
3 Keppetipola (D12)



ආයතනික පාලනය

රාජ්‍ය දැව සංස්ථාව තුළ ආයතනික පාලනයෙහි (Corporate governance) ඉහළම ප්‍රමිතීන් පවත්වාගෙනයාමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කැපවී සිටින අතර, එහි වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දරනු ලබයි.

පාර්ශවකරුවන් සඳහා වන වගකීම් වෙත අවධානය යොමුකර ඇති බව සහතික කිරීම සඳහා රාජ්‍ය දැව සංස්ථාව තුළ ආයතනික පාලන ප්‍රතිපත්ති සහ භාවිතයන් සැළසුම් කර ඇති අතර, එමගින් සංස්ථා සේවකයින්, ගනුදෙනුකරුවන්, සැපයුම්කරුවන්, පාරිභෝගිකයින් සහ එය ක්‍රියාත්මක වන සියලුම ප්‍රජාවන් ඇතුළු එහි සියලුම පාර්ශවකරුවන්ගේ අවශ්‍යතා හඳුනාගනී. මෙම ලිපිය මගින් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ආයතනික පාලන ප්‍රතිපත්ති, භාවිතයන් සහ ක්‍රියාවලීන් පිළිබඳ පැහැදිළි කරනු ලබයි.

අධ්‍යක්ෂ මණ්ඩලය හා එහි මෙහෙයුම්

අධ්‍යක්ෂ මණ්ඩලය මගින් සංස්ථාව පාලනය කරනු ලබන අතර, සංස්ථාවේ ව්‍යාපාර කටයුතු මෙහෙයවීම සහ අධීක්ෂණය කරනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩලය අධ්‍යක්ෂකවරුන් හත් දෙනෙකුගෙන් සැදුම්ලත් අතර, ඉන් අධ්‍යක්ෂකවරුන් පස් දෙනෙකු රේඛීය අමාත්‍යාංශයේ අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන අතර, අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු නිල වශයෙන් පත්කරනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩලයෙහි ස්වාධීනත්වය හා විශේෂඥ දැනුම නිල වශයෙන් පත්කරන ලද අධ්‍යක්ෂවරුන් අතරින් එක් අධ්‍යක්ෂවරයෙකු මුදල් අමාත්‍යාංශයෙන් පත්කරනු ලබයි.

සෑම රැස්වීමකටම පෙර, තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා අධ්‍යක්ෂවරුන් හට අදාල සියලුම කළමනාකරණ තොරතුරු සහ පසුබිම් තොරතුරු සපයනු ලැබේ. සංස්ථාවේ කාර්යසාධනය, නව ආයෝජන, ප්‍රාග්ධන ව්‍යාපෘති සහ නිශ්චිත මණ්ඩල අනුමැතිය අවශ්‍ය වන වෙනත් ගැටළු පිළිබඳව මණ්ඩල පත්‍රිකා රැස්වීමට පෙර ඉදිරිපත් කරනු ලැබේ.

සංස්ථාවේ අනෙකුත් අධ්‍යක්ෂවරුන් සහ බාහිර පාර්ශවකරුවන් සමඟ නිරන්තර සම්බන්ධතා පැවැත්වීම, ප්‍රතිපත්ති සම්බන්ධ කාරණා සම්බන්ධයෙන් සභාපතිවරයා වගකිව යුතුයි තවද, සංස්ථාවේ සමස්ථ වාණිජ, මෙහෙයුම් හා උපායමාර්ගික සංවර්ධනයේ සියලු අංශ සඳහා ඔහු වගකිව යුතු අතර, ඒ සඳහා අනෙකුත් අධ්‍යක්ෂකවරුන් සහ ඉහළ කළමනාකාරිත්වයේ සහාය ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී තම අංශයට අදාල කරුණු සාකච්ඡා කරන විට ඉහළ කළමනාකාරිත්වයේ සාමාජිකයන් රැස්වීම අතරතුර අදාල අවස්ථාවේ පෙනී සිටී.

අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රධාන කාර්යයන්

- සංස්ථාවේ ව්‍යාපාර සහ කටයුතු මෙහෙයවීම
- සංස්ථාවේ මෙහෙයුම් සැළසුම් සඳහා පදනමක් ලෙස කෙටිකාලීන හා දිගුකාලීන උපාය මාර්ග සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම.
- ව්‍යාපාරයේ ප්‍රධාන අවදානම් හඳුනාගැනීම සහ ප්‍රමාණවත් අවදානම් කළමනාකරණ පද්ධති ක්‍රියාත්මක බව සහතික කිරීම.
- අභ්‍යන්තර පාලනයන්හි ප්‍රමාණවත් සහ ඵලදායී බව සහතික වීම.
- වාර්ෂික ප්‍රාග්ධනය සහ මෙහෙයුම් අයවැය අනුමත කිරීම සහ අයවැයට එරෙහිව කාර්යසාධනය සමාලෝචනය කිරීම.
- සංස්ථාවේ අවසාන මූල්‍ය ප්‍රකාශන අනුමත කිරීම.
- නීති හා රෙගුලාසිවලට අනුකූලවීම සහතිකවීම.
- සියලුම ගිවිසුම්, අත්පත්කර ගැනීම් හෝ වත්කම් බැහැර කිරීම සහ ප්‍රාග්ධන ව්‍යාපෘති අනුමත කිරීම.

භාණ්ඩාගාරයෙන් පත්කරන ලද අධ්‍යක්ෂවරයා සංස්ථාව සමඟ සෘජු හෝ වක්‍ර ද්‍රව්‍යමය සබඳතාවක් නොමැතිව ස්වාධීන වන අතර, එම අධ්‍යක්ෂකවරයා සතු පුළුල් පරාසයක විශේෂඥ දැනුම සහ වාණිජ ආයතනික සහ මූල්‍ය ක්‍රියාකාරකම් පිළිබඳ සැලකිය යුතු අත්දැකීම් අධ්‍යක්ෂ මණ්ඩලයට ස්වාධීන දැක්මක් සහ විනිශ්චයක් ගෙන එයි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අනු කමිටු

සියලුම අනු කමිටු පිහිටුවීම සහ ක්‍රියාත්මක කිරීම, මෙම කමිටු සඳහා සාමාජිකයින් පත්කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතු අතර, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එම අනු කමිටු සඳහා වගකීම් පවරා ඇත.

විගණන කමිටුව

විගණන කමිටුව අධ්‍යක්ෂකවරුන් තිදෙනෙකු ගෙන් සමන්විත වන අතර, එම අධ්‍යක්ෂකවරුන් එස්.ඒ.සී.කුලතිලක මිය - කමිටු සභාපතිනි, ආචාර්ය කේ.එම්.ඒ.බණ්ඩාර - කමිටු සාමාජික සහ බී.ටී.බණ්ඩාර දිසානායක මහතා - කමිටු සාමාජික වේ. සියලුම නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන් සහ ප්‍රධානීන් අවශ්‍ය අවස්ථාවේදී විගණන කමිටු රැසිවීම් සඳහා සහභාගී වේ. පිටු අංක 33-34 හි විගණන කමිටු වාර්තාව, මූල්‍ය වර්ෂය තුළ කමිටුව විසින් සිදුකරන ලද ක්‍රියාකාරකම් පැහැදිළි කරනු ලබයි.

අභ්‍යන්තර පාලන - Internal Controls

සංස්ථාවෙහි වත්කම් ආරක්ෂා කිරීම සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් ස්ථාපිත කිරීම සහ විශ්වාසදායක තොරතුරු ජනනය වන, නිවැරදි හා සම්පූර්ණ වාර්තා පවත්වාගෙනයාම සහතික කිරීම සඳහා වන වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය දරයි. මෙම පද්ධතියට මූල්‍ය, මෙහෙයුම් සහ අවදානම් කළමනාකරණය ඇතුළු සියලුම පාලයන් ඇතුළත් වන අතර, අවදානම් කළමනාකරණය සඳහා සංස්ථාව විසින් අනුගමනය කරන ලද උපාය මාර්ග පිටු අංක 35 සිට 39 දක්වා අවදානම් කළමනාකරණය පිළිබඳ වාර්තාවේ දක්වා ඇත.

අවුරුදු 05ක කාලසීමාවක් ආවරණය වන උපාය මාර්ගික සැළසුම්වලට අමතරව, සෑම මූල්‍ය වර්ෂයක් ආරම්භයේදීම පුළුල් අයවැය ක්‍රියාවලියක් ක්‍රියාත්මකවේ. වාර්ෂික අයවැය, තීරණාත්මක සාර්ථක සාධක හඳුනාගැනීම මගින් සියලු අංශ විසින් සකස් කරන ලද ක්‍රියාකාරී අරමුණු, මණ්ඩලය විසින් අනුමත කරනු ලබන අතර, සෑම මසකම එහි ප්‍රගතිය පරීක්ෂා කරනු ලබයි.

සංස්ථාවෙහි අභ්‍යන්තර විගණන අංශය විසින් අභ්‍යන්තර පාලන පද්ධතිය නිතිපතා ඇගයීමට ලක්කරන අතර, එහි සොයාගැනීම් විගණන කමිටුව විසින් පළමුව සමාලෝචනය කරනු ලබන අතර, ඉන්පසුව සැළකිය යුතු ගැටළු අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩලය දැනට පවතින අභ්‍යන්තර පාලන ක්‍රියාපටිපාටි සමාලෝචනය කරන ලද අතර, එහි සඵලතාවය පිළිබඳව තෘප්තිමත්වේ.

පාර්ශවකරුවන් සමඟ සම්බන්ධතාවය

අධ්‍යක්ෂ මණ්ඩලය සංස්ථාවේ ප්‍රධාන පාර්ශවකරුවන් සමඟ යහපත් සබඳතාවක් පවත්වා ගැනීමේ ඇති වැදගත්කම හඳුනාගන්නා අතර, සමස්ථ සංස්ථාව තුළම මෙය ඇති කිරීම සහතික කරයි. සංස්ථාව තුළ අභ්‍යන්තර සන්නිවේදනය ප්‍රධාන වශයෙන් විද්‍යුත් තැපෑල, සංදේශ සහ චක්‍රලේඛ හරහා සිදුකෙරේ.

සංස්ථාවේ ප්‍රතිපත්ති සහ භාවිතයන් සංස්ථාවේ වටිනාකම් සහ එහි සමාජ වගකීම්වලට අනුකූල බව අධ්‍යක්ෂ මණ්ඩලය සහතික කරනු ලබන අතර, සංස්ථාව තම සේවකයින්ගේ සහ සංවිධානය තුළ සිටින අනෙකුත් අයගේ පරිසරය, සෞඛ්‍ය සහ ආරක්ෂණ ප්‍රමිතීන් ආරක්ෂා කිරීම ප්‍රවර්ධනය කරයි. අදාල ක්‍රියාමාර්ග ආයතනික සමාජ වගකීම් වාර්තාවේ 40 සිට 49 දක්වා විස්තරාත්මකව දක්වා ඇත.

අනුකූලතාවය - Compliance

රාජ්‍ය දැව සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ශක්තිමත් අභ්‍යන්තර අනුකූලතා ක්‍රියාපටිපාටි

කෙරෙහි සැළකිය යුතු අවධාරණයක් ලබාදෙනු ඇති අතර, අනුකූලතාවය සහතික කිරීම සඳහා සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS සහ SLFRS) සහ අනෙකුත් ව්‍යවස්ථාපිත රෙගුලාසිවල මාර්ගෝපදේශවලට අනුකූලව සකස් කර ඇත.

පැවැත්ම - Going Concern

සංස්ථාවේ මූල්‍ය තත්වය සහ මුදල් ප්‍රවාහ තත්වය මනාව සමාලෝචනය කිරීමෙන් අනතුරුව අධ්‍යක්ෂකවරුන් විසින් මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී 'Going Concern' පදනම අඛණ්ඩව භාවිතා කර ඇත, සංස්ථාවේ ඉදිරි කාලය සඳහා එහි ක්‍රියාකාරිත්වය අඛණ්ඩව කරගෙන යාමට ප්‍රමාණවත් සම්පත් ඇති බව අධ්‍යක්ෂ මණ්ඩලයෙහි විශ්වාසය වේ.

විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව - 2022

විගණන හා කළමනාකරණ කමිටුවේ සැකැස්ම

එස්.ඒ.සී.කුලතිලක මිය	- සභාපතිනි
ආචාර්ය කේ.එම්.ඒ.බණ්ඩාර	- සාමාජික
බී.ටී.බණ්ඩාර දිසානායක මහතා	- සාමාජික

2022 වර්ෂයේ දී අවධානය යොමු කළ අංශ



මූල්‍ය වාර්තාකරණය



අභ්‍යන්තර විගණනය, අවදානම් සහ පාලන



බාහිර විගණනය



අනුකූලතාවය

කමිටු අරමුණු

මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සමාලෝචනය කිරීම තුළින් අධ්‍යක්ෂ මණ්ඩලයේ අධීක්ෂණ වගකීම ඉටුකිරීමට සහයවීම මූලික කරගත් මූල්‍ය ප්‍රකාශවල නිවැරදි බව, නෛතික හා නියාමන අවශ්‍යතාවයන්ට අනුකූලවීම සහතික කිරීම සඳහා අනුගමනය කරන ලද ක්‍රියාවලිය, අභ්‍යන්තර පාලන ක්‍රමය සහ අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය, අභ්‍යන්තර විගණන කාර්යය හා සියලුම පාර්ශවකරුවන්ගේ අවශ්‍යතා ආරක්ෂා කිරීමේ අරමුණින් බාහිර විගණකවරුන්ගේ ස්වාධීනත්වය සහ කාර්යසාධනය සමාලෝචනය කිරීම යන කාර්යයන් ඉටුකිරීම සඳහා විගණන කළමනාකරණ කමිටුව පිහිටුවන ලදී.

ව්‍යාපාරික පරිසරය තුළ මතුවෙමින් පවතින නව ප්‍රවණතා සමඟ ගමන්කිරීම සහ කමිටුවේ වගකීම් නියමිත වේලාවට හා නිසි අයුරින් ඉටුකිරීම සහතික කිරීම දක්වා විගණන කළමනාකරණ කමිටුවෙහි කාර්යභාරය සහ වගකීම් අඛණ්ඩව විකාශනය වේ.

ප්‍රධාන වගකීම්

- මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී හා ඉදිරිපත් කිරීමේදී අනුගමනය කළ යුතු පාලනයන් සමාලෝචනය කිරීම සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව අනාවරණය කිරීම්වල ප්‍රමාණවත් බව සහතික කිරීම.
- සංස්ථාවේ වත්කම්වල සුරක්ෂිතභාවය තහවුරු කිරීම සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සහ අවදානම් කළමනාකරණ කාර්යයේ ප්‍රමාණවත් බව සහ ඵලදායීතාවය අධීක්ෂණය සහ සමාලෝචනය.
- විගණන කමිටුව අනුමත වාර්ෂික විගණන සැලැස්ම ක්‍රියාත්මක කිරීම ඇතුළුව අභ්‍යන්තර විගණන කටයුතු අධීක්ෂණය කිරීම.
- බාහිර විගණකවරුන්ගේ ස්වාධීනත්වය සහ කාර්ය සාධනය සහතික කිරීම.
- වාර්ෂික මූල්‍ය ප්‍රකාශන විගණනයෙන් පැණනඟින සොයාගැනීම් සළකාබැලීම.
- ඒකාබද්ධ වාර්තාව, විගණනය කරන ලද වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සහ අතුරු වාර්තාව අනුමත කිරීම මණ්ඩලයට නිර්දේශ කිරීම.

2022 වර්ෂයේ දී සිදුකරන ලද කාර්යයන්

විගණන කමිටුව 2022 වර්ෂය තුළ පහත සඳහන් ක්‍රියාකාරකම්වල නිරත විය.

- **මූල්‍ය වාර්තාකරණය**

  අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ කිරීමට පෙර කමිටුව අවසාන විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කර කළමනාකරණය සමඟ සාකච්ඡා කරන ලදී

  මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම සඳහා භාවිතා කරන තොරතුරු පද්ධතිවල අදාළ පාලනයන්වල ඵලදායීතාවය සහ අවදානම් පිළිබඳව කමිටුව විසින් අඛණ්ඩව අවධානය යොමුකරන ලදී.

  ආර්ථික අවපාතය හේතුවෙන් ඇති විය හැකි මූල්‍යමය බලපෑම සළකාබලා කමිටුව විසින් නීතිපතා ව්‍යාපාරයේ පැවැත්ම පිළිබඳ ඇගයීම් සිදුකරන ලදී. තවද, වර්ෂය තුළදී කමිටුව නිරන්තරයෙන් මදල් ප්‍රවාහ ප්‍රක්ෂේපණ සහ අරමුදල් සම්පාදනය සමාලෝචනය කරන ලදී.

- **අනුකූලතාවය**

  නියාමන හා නෛතික අනුකූලතාව අධීක්ෂණය කිරීම සඳහා කළමනාකාරිත්වය විසින් ඉදිරිපත් කරන ලද ව්‍යවස්ථාපිත බදු අනුකූලතාව ප්‍රකාශ ඇතුළු නියාමන හා අනුකූලතා ප්‍රකාශ විගණන කමිටුව සමාලෝචනය කරන ලදී.

- **අභ්‍යන්තර විගණනය, අවදානම් සහ පාලන**

  සංස්ථාවට බලපාන සියලු ආකාරයේ වැදගත් අවදානම් හඳුනාගැනීම සහ අවම කිරීම සඳහා ඵලදායී උපාය මාර්ග ක්‍රියාත්මක වන බවට කළමනාකාරිත්වයෙන් අවශ්‍ය සහතිකය ලබාගැනීම කෙරෙහි කමිටුව අඛණ්ඩව අවධානය යොමු කර ඇති වර්ෂය තුළදී අවදානම් හඳුනාගැනීම, ඇගයීම, අවම කිරීම හා පාලන දුර්වලතා සඳහා සංස්ථාව විසින් අනුගමනය කරන ලද ප්‍රධාන අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය පිළිබඳව සංස්ථාවෙහි කළමනාකාරිත්වය සමඟ කමිටුව සාකච්ඡා කරන ලදී.

  සංස්ථාව තුළ අභ්‍යන්තර පාලනයන්හි ප්‍රමාණවත් බව සහ ඵලදායීතාවය පිළිබඳව කමිටුව නිරන්තරයෙන් විමර්ශනය කරන ලදී. පවත්වන ලද අභ්‍යන්තර විගණනයන්හි යාවත්කාලීන කිරීම් ද මෙහි සමන්විත වේ. තවද, මෙම ක්‍රියාවලියට සංස්ථාවේ ස්ථාපිත ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටිවලට අනුකූලවීම සහ නීති හා රෙගුලාසිවලට අනුකූලවීම පිළිබඳ යාවත්කාලීන කිරීමක් ඇතුළත් වේ.

  සංස්ථාව සඳහා වන අභ්‍යන්තර විගණන සැළැස්ම නියමිත කාල පරතරයන් තුළ කමිටුව විසින් සමාලෝචනය කළ අතර, මෙහෙයුම් පරිසරයට සහ ව්‍යාපාරික අවශ්‍යතාවන්ට සරිලන පරිදි වෙනස්කම් සිදුකරන ලදී.

- **බාහිර විගණනය**

  කමිටුව බාහිර විගණකවරුන් නිරන්තරයෙන් මුණගැසී ඔවුන්ගේ ස්වාධීනත්වය, විෂය මූලිකත්වය සහ ක්‍රියාකාරිත්වය නිරීක්ෂණය සිදුකළේය. විගණන හා කළමනාකරණ කමිටුව විසින් බාහිර විගණකවරුන් සමඟ රැස්වීම් පවත්වා ඇති අතර, විගණනය සැළසුම් කිරීමේ හා විෂය පථයේ සැළසුම් කරනු ලබන අදියරේදී විගණන සැළැස්ම සමාලෝචනය කිරීම, මූල්‍ය ප්‍රකාශන අනුමත කිරීමට පෙර විගණනය අවසන් කිරීම පිළිබඳ විගණන වාර්තාව සහ අභ්‍යන්තර පාලනයන් වැඩිදියුණු කළ යුතු අංශ සහ විගණකවරුන්ගේ මතය අනුව කළමනාකරණයේ අවධානය යොමු කළ යුතු වෙනත් කරුණු පිළිබඳව මෙහිදී සාකච්ඡා කරන ලදී. තවද, විගණන කළමනාකරණ කමිටුව විසින් බාහිර විගණකවරුන් සමඟ යම් නිශ්චිත කරුණු සාකච්ඡා කිරීම සඳහා ද, සාකච්ඡා පැවැත්විය. විගණන කමිටුව විසින් ඉහළ කළමනාකාරිත්වයේ තොරතුරු ද සැළකිල්ලට ගනිමින් බාහිර විගණකවරුන්ගේ කාර්යසාධනය සමාලෝචනය කළ අතර, සමාලෝචන ප්‍රතිඵල බාහිර විගණකවරුන් හා කළමනාකාරිත්වය සමඟ සාකච්ඡා කළේය.

එස්.ඒ.සී.කුලතිලක
සභාපතිනි
විගණන හා කළමනාකරණ කමිටුව.

අවදානම් කළමනාකරණය

තිරසාර වර්ධනයක් මෙන්ම ආයතනික අරමුණු හා පරමාර්ථ ළඟා කරගැනීමෙහි ස්ථාවර ප්‍රගතියක් ලබාගැනීම සඳහා ව්‍යාපාර සහ මූල්‍ය අවදානම් කළමනාකරණය මූලික වශයෙන් වැදගත් වේ. ''අවදානම'' සහ මුළුමනින් ම ''තුරන් කිරීමට'' නොහැකි සාධකයක් වන අතර, මෙහෙයුම් අඛණ්ඩව සමාලෝචනය හා උපාය මාර්ග අනුග මනය කරමින් අවදානම් ''අවම කිරීම'' සංස්ථාව සහතික කරයි. මෙම ඉලක්කය සපුරාගැනීම සඳහා විවිධ උපාය මාර්ග සකස් කර ක්‍රියාත්මක කරනු ලැබේ.

අවදානම් පරිසරය

2022 මූල්‍ය වර්ෂය ඉතා අභියෝගාත්මක වසරක් විය. කෙසේ වෙතත්, ක්‍රියාශීලී නායකත්වය සහ දැව සම්පත් කාර්යක්ෂමව කළමනාකරණය කිරීම තුළින් මෙම අවිනිශ්චිතතාවයන් මඟහරවා අපගේ මූලික ව්‍යාපාරය සමඟ ශක්තිමත් ලෙස වර්ධනය විය හැකි බව අපගේ විශ්වාසයයි. තවද, විවිධාංගීකරණය වූ කර්මාන්තයක සිටීම අවදානම් කළමනාකරණ ක්‍රියාවලියේ දී සංස්ථාවට ශක්තියක් වූ අතර, ආර්ථික අවපාත පසුබිම තුළ වුවද ස්ථාවර ප්‍රකෘතියක් ලබාගත්තෙමු.

අවදානම් පාලනය

අවදානම් කළමනාකරණය අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රධාන වගකීමක් වන අතර, අවදානම් කළමනාකරණය පිළිබඳ අධීක්ෂණ වගකීම ඇති විගණන කමිටුව විසින් මේ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට අවශ්‍ය සහය ලබාදේ. අවදානම් හඳුනාගැනීම, මැනීම, කළමනාකරණය අවම කිරීම සහ අවදානම් අධීක්ෂණය මෙන්ම අභ්‍යන්තර විගණනයට සහ අධ්‍යක්ෂ මණ්ඩලයට අවදානම් වාර්තා කිරීමට සෑම අංශ ප්‍රධානියෙකුම වගකීමෙන් බැඳී සිටී.

අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය

රාජ්‍ය දැව සංස්ථාවෙහි අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය සියලුම ආකාරයේ ව්‍යාපාරික හා මූල්‍ය අවදානම් මැනවින් හඳුනාගැනීම, විශ්ලේෂණය කිරීම සහ ප්‍රතිචාර දැක්වීම සහතික වන පරිදි සකස් කර ඇත. මෙය ව්‍යුහාත්මක අවදානම් පාලන ක්‍රමවේදයකට පහසුකම් සපයන අතර, ව්‍යාපාරයේ සෑම අංශයකම අවදානම් ඇතිවීමට පෙර හඳුනාගත හැකි සංස්කෘතියක් (Risk aware culture) ඇති කරමින් ප්‍රමාණවත් අවදානම් ඇගයීම, හඳුනාගැනීම සහ අවමකිරීම සහතික කරනු ඇත.

1. **අවදානම් හඳුනාගැනීම**

   අවදානම් හඳුනාගැනීමේ පරමාර්ථය වන්නේ ආයතනයක අරමුණු සාක්ෂාත් කරගැනීමට උපකාරී වන හෝ වළක්වා වන/බාධා ඇති කරවන අවදානම් සොයාගැනීම, හඳුනා ගැනීම සහ විස්තර කිරීමයි. අවදානම් හඳුනාගැනීමේ දී ව්‍යාපාරයට අදාළ, සුදුසු සහ යාවත්කාලීන තොරතුරු වැදගත් වන අතර, අරමුණු එකකට හෝ වැඩි ගණනකට බලපාන අවිනිශ්චිතතාවයන් හඳුනාගැනීම සඳහා ආයතනයකට විවිධ වූ ක්‍රමවේදයන් භාවිතා කළ හැකිය.

2. **අවදානම් විශ්ලේෂණය**

   අවදානම් විශ්ලේෂණයේ මූලික පරමාර්ථය වනුයේ අවදානමේ ස්වභාවය හා සුදුසු අවස්ථාවන්හිදී අවදානමෙහි බලපෑමේ ප්‍රමාණය ඇතුළු ලක්ෂණ අවබෝධ කර ගැනීම වන අතර, අවදානම් විශ්ලේෂණයට, අවිනිශ්චිතතාවයන්, අවදානම් ප්‍රභවයන්, ප්‍රතිවිපාක, සම්භාවිතාව, සිදුවීම්, අවස්ථා, පාලනයන් සහ ඒවායේ කාර්යක්ෂමතාව පිළිබඳ සවිස්තරාත්මක විශ්ලේෂණයක් ඇතුළත් වේ. තොරතුරුවල විවිධ බව, සංකීර්ණතාව, විශ්ලේෂණයේ අරමුණ මත පදනම්ව, තොරතුරු ලබාගැනීමේ හැකියාව

සහ විශ්වසනීයත්වය හා පවතින සම්පත් මත විශ්ලේෂණය සිදුකළ හැකිය. අවස්ථාව හෝ වාතාවරණය මත හා අපේක්ෂාව මත විශ්ලේෂණ ශිල්පීය ක්‍රම ගුණාත්මක, ප්‍රමාණාත්මක හෝ මෙහි සංයෝජනයක් විය හැකිය.

3. **අවදානම් ඇගැයීම**

තීරණ ගැනීමේ ක්‍රියාවලියට අවශ්‍ය සහයෝගය ලබාදීම, අවදානම් ඇගැයීමේ මූලික අරමුණ ලෙස හැඳින්විය හැක. අවදානම් විශ්ලේෂණයේ ප්‍රතිඵල ස්ථාපිත අවදානම් නිර්ණායක සමඟ සංසන්දනය කිරීමෙන් ලැබෙන ප්‍රතිඵල මත අවදානම් කළමනාකරණය සඳහා අමතර ක්‍රියාමාර්ගවල අවශ්‍යතාව හඳුනාගැනීම අවදානම් ඇගයීමේ ක්‍රියාවලියට ඇතුළත් වේ. එම තීරණ පහත පරිදි විය හැක.


- කිසිදු ක්‍රියාමාර්ගයක් නොගැනීම.
- අවදානම් සඳහා ප්‍රතිකාර ක්‍රම සළකාබැලීම.
- අවදානමෙහි බලපෑම තවදුරටත් අවබෝධ කරගැනීම සඳහා වැඩිදුර විශ්ලේෂණය.
- පවත්නා පාලනයන් පවත්වාගෙන යාම.
- අරමුණු නැවත සළකා බැලීම.

4. **අවදානම් ප්‍රතිකාර**

අවදානම් ප්‍රතිකාර ක්‍රියාවලියෙහි පරමාර්ථය වන්නේ අවදානම විසඳීම සඳහා විකල්ප විසඳුම් හඳුනාගෙන ක්‍රියාත්මක කිරීම වේ. එහි පහත පරිදි පුනරාවර්තන ක්‍රියාවලියක් ඇතුළත් වේ.

- අවදානම් ප්‍රතිකාර සඳහා විකල්ප විසඳුම් සකස් කිරීම සහ තෝරාගැනීම.
- තෝරාගත් විකල්පය සැළසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- ක්‍රියාත්මක කරන ලද ප්‍රතිකාරයේ ඵලදායීතාවය තක්සේරු කිරීම.
- ඉතිරිව පවතින අවදානමෙහි බලපෑම ආයතනයකට පිළිගත හැකි ද යන්න තීරණය කිරීම.
- පිළිගත නොහැකි නම්, තවදුරටත් ප්‍රතිකාර ක්‍රම ක්‍රියාත්මක කිරීම.

අවදානම් තාප සිතියම **(Risk Heat Map)**



අවදානම් නිරාවරණය	අරමුණු	අවදානම් අවමකිරීමේ උපායමාර්ග
මූල්‍ය අවදානම් කළමනාකරණය		
1. ද්‍රවශීලතාවය සහ මුදල් කළමනාකරණය.	වෙළෙඳපොළ අවස්ථාවන්ට වේගවත් ප්‍රතිචාර දැක්වීම සහතික කිරීම සඳහා ක්ෂණික අරමුදල් සැපයීමේ හැකියාව තහවුරු කිරීම.	දිගු කාලීන ණය මඟින් දිගුකාලීන වත්කම් සඳහා අරමුදල් සැපයීම.
	සෑම විටම ''ප්‍රමාණවත්'' ද්‍රවශීලතා මට්ටමක් පවත්වා ගැනීම.	සෑම විටම සංස්ථාවට කෙටි කාලීන ණය ගැනීමේ පහසුකම් ලබාගැනීම.
		වියදම් පාලනය සඳහා මුදල් බලතල වටිනාකම මත බෙදා ඇත.
		අනාගත අරමුදල් අවශ්‍යතා සඳහා ඇපකරයක් ලෙස ඉදිරිපත් කළ හැකි පොත් වටිනාකම්වලට වඩා සැළකිය යුතු ලෙස වෙළෙඳපොළ වටිනාකම් සහිත ඉඩම් සහ ගොඩනැඟිලි සංස්ථාව සතුව ඇත.
		විවිධ මූල්‍ය ආයතන හරහා අරමුදල් අවශ්‍යතා සපුරාගැනීම.
2. පොළී අනුපාත අවදානම	පොළී අනුපාත අස්ථාවරත්වයේ අහිතකර බලපෑම් අවම කිරීම.	සංස්ථාවේ ආයෝජන සඳහා හැකි උපරිම පොළී අනුපාතය ලබාගැනීම සඳහා බැංකු සමඟ සාකච්ඡා කිරීම.
	ණයගැනීමේ පිරිවැය අවම මට්ටමක පවතින බව සහතික කිරීම.	ඉහළ පිරිවැය අවම කිරීම සහ දේශීය පොළී අනුපාතවල අහිතකර උච්චාවචනයන් වළක්වා ගැනීම සඳහා සැපයුම්කරුවන්ගේ ණය ලබාගැනීම හා සාකච්ඡා කිරීම.
	කොටස් මත ප්‍රතිලාභ ප්‍රශස්ත කිරීම.	අඩු gearing අනුපාතයක් පවත්වා ගැනීම සහ ඵලදායී කාරක ප්‍රග්ධන කළමනාකරණය.
ව්‍යාපාර අවදානම් කළමනාකරණය		
3. ණය අවදානම	ණය ගැතියන් ණය පැහැර හැරීම් ආශ්‍රිත අවදානම් අවම කිරීම.	ණය ප්‍රතිපත්ති සංවර්ධනය කිරීම හා ක්‍රියාත්මක කිරීම.
		සියලුම ප්‍රධාන ගනුදෙනුකරුවන් සඳහා බැංකු ඇපකර, තැන්පතු සහ ඇපකරය ලබාගැනීම.
		ණය ලබාදීමට පෙර ගනුදෙනුකරුවන්ගේ ණය ලබාදීමේ සුදුසුකම් සහතික කිරීම සඳහා දැඩි තක්සේරු කිරීමේ ක්‍රියාපටිපාටි අනුගමනය කිරීම.
		ණයගැතියාගේ ශේෂයන් සමීපව අධීක්ෂණය කිරීම, ක්‍රියාකාරී සැළසුම් සකස් කිරීම සහ එම ක්‍රියාකාරී සැළසුම් අපේක්ෂිත අන්දමින් ක්‍රියාත්මක වන බව තහවුරු කිරීම.

4. වත්කම් අවදානම	ගින්නෙන්, සොරකමින් සහ යන්ත්‍රෝපකරණ බිඳවැටීමේ අවදානම අවම කිරීම.	සියලුම ස්පෘශ්‍ය වත්කම් සඳහා පුළුල් රක්ෂණ ආවරණ ලබාගැනීම.
		අනිවාර්ය වැළැක්වීමේ නඩත්තු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
		ගිනි නිවීම වැනි ක්ෂේත්‍රවල නිරත සේවකයන් සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
5. අභ්‍යන්තර පාලනයන් හා බැඳි අවදානම	සංස්ථා වත්කම් ආරක්ෂා කිරීම සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන ක්‍රමයක් පවත්වා ගැනීම.	පද්ධති විගණනය, තොග සහ මුදල් ගණනය කිරීම් ඇතුළු සියලුම විගණන අංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන පාලන යාන්ත්‍රණයන් සිදුකිරීම.
		සංස්ථාවේ කාර්යසාධනය එහි ඉලක්කවලට අනුකූල බව සහතික කිරීම සඳහා අයවැය ක්‍රියාවලියක් සහ අයවැය පාලන යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීම.
6. කීර්ති නාමය හා බැඳි අවදානම	කීර්ති නාමයට හානි පමුණුවන හේතූන් ඇතිවීම වැළැක්වීම.	නිෂ්පාදනවල ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා අඛණ්ඩ පුහුණුව, තත්ත්ව කළමනාකරණය සහ සහතික කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
	අපගේ ක්‍රියාපටිපාටියෙන් බැහැරව කීර්ති නාමය පිළිබඳ අර්බුදයක් ඇති වුවහොත් එහි බලපෑම අවම කිරීම.	නිරතුරුව අභ්‍යන්තර හා බාහිර තත්ත්ව පරීක්ෂා සිදුකිරීම.
		නිෂ්පාදන පහසුකම් සඳහා අඛණ්ඩ ආයෝජන හා වැඩිදියුණු කිරීමේ පියවරයන් ගැනීම.
		බාහිර තත්ත්ව පාලන ආයතන මඟින් සහතික ලබා ගැනීම.
		ප්‍රමිතිගත නිෂ්පාදන ක්‍රියාවලියක් ස්ථාපනය.
7. මානව ප්‍රාග්ධනය හා කම්කරු අවදානම	බාධාවකින් තොරව අඛණ්ඩ මෙහෙයුම් ක්‍රියාවලිය සහතික කිරීම.	දිරි දීමනා සහ සුභසාධක කටයුතු මඟින් සේවක ප්‍රතිලාභ පුළුල් කිරීම.
	මානව සේවායෝජකයෙකු ලෙස අපව ප්‍රක්ෂේපණය කිරීම, අභිප්‍රේරණ කටයුතු සාර්ථකව ඉටුකිරීම, සංවර්ධනය කිරීම, රඳවාගැනීම සහ ගුණාත්මක සේවක ප්‍රාග්ධනයක් ආකර්ෂණය කරගැනීම.	සේවක බඳවාගැනීම්, කාර්යසාධන ඇගැයීම් සහ අභ්‍යන්තර මෙන්ම බාහිර පුහුණු වැඩසටහන් සම්බන්ධයෙන් මානව සම්පත් අංශයේ ක්‍රියාකාරිත්වය වැඩිදියුණු කිරීම.
		කාර්ය සාධනය මත පදනම් වූ සංස්කෘතියක් සංස්ථාව තුළ ප්‍රවර්ධනය කිරීම.
8. තාක්ෂණික අවදානම	වර්තමාන තාක්ෂණික වර්ධනයන්ට අනුගතවීම සහ යල්පැණයාම වැළැක්වීම.	නව තාක්ෂණයන් සහ ස්වයංක්‍රීයකරණය සඳහා අඛණ්ඩ ආයෝජනය.
		වර්ෂය පුරා පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා ආයෝජනය කිරීම.

9. වෙළෙඳපොළ තරඟකාරිත්ව අවදානම	අපගේ වෙළෙඳපොළ කොටස උපරිම කිරීම.	ඉහළ ගුණාත්මක බවින් යුතු නිෂ්පාදන වෙළෙඳපොළට ඉදිරිපත් කිරීම.
	මූලික නිෂ්පාදනවලින් ජනනයවන ආදායම ඉහළ නැංවීම.	මිලගණන්වල තරඟකාරී බව සහතික කිරීම සඳහා නිෂ්පාදන ඵලදායීතාව සහ කාර්යක්ෂමතාව වැඩිකිරීම.
		අවශ්‍යතා හඳුනාගැනීම සඳහා වෙළෙඳපොළ පර්යේෂණ සිදුකිරීම.
		වෙළෙඳ ප්‍රචාරණ සහ ඉලක්ක අලෙවිකරණය තුළින් සංස්ථා සන්නාමය තවදුරටත් ශක්තිමත් කිරීම.
		ප්‍රදර්ශනාගාරවල පාරිභෝගික සම්බන්ධතා කළමනාකරණ වැඩසටහන් ස්ථාපනය.
10. පාරිසරික, දේශපාලනික සහ නියාමන අවදානම	අපගේ පාලනයෙන් බැහැරව ඇති බාහිර පරිසරයේ ඇති වන විචලනයන්ගෙන් ඇති විය හැකි සෘණාත්මක බලපෑම අවම කිරීම.	අදාල බලධාරීන් විසින් නියම කර ඇති ප්‍රමිතීන්ට අනුකූලවීම සහ අනුකූලතාවය සහතික කිරීම.
	නියාමන අවශ්‍යතාවයන්ට අනුකූලවීම.	ව්‍යවස්ථාපිත හා නියාමන ආයතනවල අවශ්‍යතාවයන්ට අනුකූලවීම.

ආයතනික සමාජ වගකීම

වගකීමෙන් යුතු රාජ්‍ය ආයතනයක් ලෙස, සියලුම බාහිර හා අභ්‍යන්තර පාර්ශවයන්ගේ වර්තමාන හා අනාගත පැවැත්ම අපගේ පැවැත්මට ද අත්‍යවශ්‍ය සාධකයක් බව අපගේ විශ්වාසයයි. ඒ අනුව දූව ව්‍යාපාරය තවදුරටත් වගකීමෙන් හා තිරසාර බැවින් වැඩිදියුණු කරමින් ආර්ථිකමය වශයෙන් දියුණුවක් ළඟා කරගැනීම සඳහා නව ක්‍රමෝපායන් ස්ථාපිත කිරීම අපගේ අරමුණ වේ.



පැළ බෙදාදීම සහ රුක් රෝපණ වැඩසටහන් සඳහා දායකත්වය

රාජ්‍ය දැව සංස්ථාවේ ප්‍රාදේශික 14ක් තුල පවත්වාගෙන යන පැල තවාන් 28ක් හරහා වටිනා දැවමය සහ අනෙකුත් විශේෂවල පැළ නිෂ්පාදනය කරනු ලබන අතර පර්යේෂණ සංවර්ධන හා පුහුණු අංශය මගින් විවිධ රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන වෙත නොමිලයේ පැළ බෙදා දෙනු ලැබේ. රුක් රෝපණ වැඩසටහන් තුලින් දැව විශේෂ ප්‍රචලිත කිරීම හරහා දේශීය දැව කර්මාන්තය තිරසාර කිරීමට සහ ජෛව විවිධත්වය වැඩි දියුණු කිරීමට රාජ්‍ය දැව සංස්ථාව අපේක්ෂා කරයි. තවද, ශාක ප්‍රජාවන් ආශ්‍රිත කාබන් සංචිත වැඩිදියුණු කිරීම තුලින් දේශගුණික විපර්යාසවලට විසඳුම් සෙවීම, දිවයිනේ වන ආවරණය වැඩි කිරීම සහ ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කිරීම, මෙම වැඩසටහන්වල ප්‍රධාන අරමුණු වේ. තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) වල අපගේ වපසරිය වන තිරසාර දැව කර්මාන්තය මත පදනම් වූ දැව (ද්‍රව්‍ය) පරිභෝජනය වැඩි කිරීම, අධ්‍යාපනික වැඩසටහන් සඳහා දායකත්වය ලබා දීම ආදිය කෙරෙහි රාජ්‍ය දැව සංස්ථාව අවධානය යොමු කර ඇති අතර පැළ නිෂ්පාදනය හා රුක් රෝපණ වැඩසටහන් සඳහා අනුග්‍රහ දැක්වීම තුළින් පරිසර සංරක්ෂණය සම්බන්ධ තිරසාර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීම සඳහා රටට සහය ලබා දීමද සිදු කරනු ලැබේ.

2022 වර්ෂයේදී විවිධ රුක් රෝපණ වැඩසටහන් සඳහා පැළ 68,603ක් බෙදා දී ඇති අතර 2022 වර්ෂයේදී රාජ්‍ය දැව සංස්ථාවේ තවාන් මගින් පැළ 65,468ක් නිෂ්පාදනය කර ඇත. පැළ බෙදා හැරීමේ විශේෂ අවස්ථා පහත සඳහන් වේ.

- පරිසර ආරක්ෂණ ඒකකය, ශ්‍රී ලංකා පොලිසිය - පැළ 30000
- පරිසර අමාත්‍යාංශය - පැළ 5400
- ලේක්හවුස් - සීමාසහිත ලංකාවේ එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම - පැළ 1650
- හරිත අස්වනු ව්‍යාපාරය - පැළ 3000
- අජිත් රාජපක්ෂ පදනම - පැළ 2250
- ප්‍රාදේශීය ලේකම් කාර්යාල (දිවයින පුරා) - පැළ 4732
- ප්‍රාදේශීය සභා (දිවයින පුරා) - පැළ 1545
- පාසල් (දිවයින පුරා) - පැළ 2918



ශ්‍රී ලංකා පොලිසියේ පරිසර ආරක්ෂණ ඒකකය සමඟ එක්ව සිදුකරන ලද රුක් රෝපණ වැඩසටහන



රුක් රෝපණ වැඩසටහන් සඳහා ටීවී දෙරණ වෙත පැළ පරිත්‍යාග කිරීම

"The Little Forester Program" - පුංචි වන විද්‍යාඥයා - 2022

වන සම්පත් තිරසාර කළමනාකරණය ලොව පුරා උණුසුම් මාතෘකාවක් වේ. ශ්‍රී ලාංකීය ප්‍රජාව පරිසර ආරක්ෂණය පිළිබඳව දැඩි සැලකිල්ලක් දක්වන නමුත්, තිරසාර සංකල්ප හොඳින් අවබෝධ කරගෙන නොමැත. එබැවින්, අඛණ්ඩ අධීක්ෂණයක් සහිතව "තිරසාර" සංකල්ප තේමාකර ගනිමින් වඩාත් ඵලදායී වැඩසටහනක් සංවිධානය කිරීම අත්‍යවශ්‍ය වේ.

රාජ්‍ය දැව සංස්ථාව සහ ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමයේ (SLAAS) B අංශය (කෘෂිකර්ම හා වන විද්‍යාව) හා එක්ව "The Little Forester Program 2022" සංවිධානය කරන ලදී. ශ්‍රී ලංකාවේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව ද මෙම වැඩසටහනට සහාය විය. වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා පහසුවෙන් ප්‍රවේශ විය හැකි කණ්ඩායම වන්නේ පාසල් සිසුන් බවට හඳුනා ගත් අතර ඒ අනුව එම සිසුන් ඉලක්ක කර රුක් රෝපණය, ඒවාගේ නඩත්තුව හා ඒ සම්බන්ධ වාර්තා පිළියෙළ කිරීම සඳහා අවශ්‍ය මඟ පෙන්වීම ලබා දෙන ලදී.



වේවැල්දෙණිය වීරසූරියකන්ද කනිෂ්ඨ විද්‍යාලයේ "පුංචි වන විද්‍යාඥයා" වැඩසටහන

මෙම වැඩසටහන 2022 වසරේ වේවැල්දෙණිය වීරසූරියකන්ද කනිෂ්ඨ විද්‍යාලයෙන් ආරම්භ කරන ලදී. රුක් රෝපණ ක්‍රියාකාරකම්වලට අමතරව කෘෂිකාර්මික උපකරණ කට්ටල සහ රාජ්‍ය දැව සංස්ථා ප්‍රකාශන එකතුවක් (තිරසාර වන කළමනාකරණය, ජෛව විවිධත්වය, ආශ්චර්යමත් දැව නිර්මාණ ශිල්පය, විවිධ දැව ගස් පිළිබඳ විශේෂ පිළිබඳ පත්‍රිකා) පාසලට පරිත්‍යාග කරන ලදී. පාසල් සිසුන් විසින් රෝපණය කරන ලද පැල අවම වශයෙන් මාස හයක්වත් රැකබලා ගැනීමේ වගකීම ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට පැවරූ සියලුම නඩත්තු කිරීම්/ නිරීක්ෂණ සපයා ඇති ක්ෂේත්‍ර අත්පොතෙහි සටහන් කිරීම සඳහා මඟ පෙන්වන ලදී.

අභ්‍යන්තර පුහුණු වැඩසටහන් පිළිබඳ තොරතුරු

විවිධ පුහුණු වැඩසටහන් හරහා සේවකයින්ගේ නිපුණත්වය වර්ධනය කිරීමට රාජ්‍ය දැව සංස්ථාව උපරිම උත්සාහය දරයි. දැව තාක්ෂණ පුහුණු ආයතනය (TTTI) යනු සංස්ථාවේ පුහුණු ආයතනය වන අතර එය විශාල වපසරියක පුහුණුවීම් සපයයි. තෘතියික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) යටතේ දැව තාක්ෂණ පුහුණු ආයතනය ලියාපදිංචි කර ඇත (ලියාපදිංචි අංක P01/0365).

පවත්වන ලද /පෞද්ගලිකව සහභාගී වූ පුහුණු වැඩසටහන්	පුහුණු වැඩසටහන් ගණන	ඉලක්කගත කාණ්ඩය	පුහුණු කරන ලද සේවකයින් ගණන
ආයතන සංග්‍රහය (TTTI)	01	ප්‍රධාන කාර්යාලයේ අංශවල කළමනාකරුවන්/ කළමනාකරණ සහකාරවරුන්	80
ISO 9001:2015 තත්ත්ව කළමනාකරණ පද්ධතිය	03	බූස්ස සංකීර්ණයේ තෝරාගත් කාර්ය මණ්ඩලය හා ප්‍රධාන කාර්යාලයේ තෝරාගත් කාර්ය මණ්ඩලය	75
Auto CAD - ගෘහ භාණ්ඩ සැලසුම් නිර්මාණය කිරීම	01	බූස්ස සහ අම්පාර ගෘහ භාණ්ඩ කර්මාන්තශාලාවල නිෂ්පාදන සහකාරවරුන්	05
සම්පත් කාර්යක්ෂමතාව සහ චක්‍රීය ආර්ථිකය	01	ප්‍රධාන කාර්යාලයේ අංශ කළමනාකරුවන්	10
මාර්ගගත කර්මාන්තශාලා පද්ධතිය	01	ගෘහ භාණ්ඩ කර්මාන්තශාලා කළමනාකරු සහ දත්ත ඇතුළත් කිරීමේ ක්‍රියාකරුවන්	30
ඉරුම්හල් පිළිබඳ පුහුණුව (TTTI)	01	රාජ්‍ය දැව සංස්ථා ඉරුම්හල්වල කාර්ය මණ්ඩලය	46
පරිසණක පුහුණුව (TTTI) /තොරතුරු තාක්ෂණ අංශය	04	කළමනාකරණ සහකාරවරුන්	29
මෘදු ලී සහ උණ බට සංරක්ෂණය	01	ගිල්වීමේ සහ රික්ත පීඩන පිරිපහදු යන්ත්‍රාගාර ඒකකවල සහ බූස්ස, කැප්පෙටිපොළ සංකීර්ණ සහ බණ්ඩාරවෙල ප්‍රාදේශිකයේ කළමනාකරුවන්	15

පවත්වන ලද /පෞද්ගලිකව සහභාගී වූ පුහුණු වැඩසටහන්	පුහුණු වැඩසටහන් ගණන	ඉලක්කගත කාණ්ඩය	පුහුණු කරන ලද සේවකයින් ගණන
දැනුම කළමනාකරණය	01	ප්‍රධාන කාර්යාලයේ අංශවල කළමනාකරුවන්/ කළමනාකරණ සහකාරවරුන්	10
අලෙවිකරණය සහ සන්නිවේදනය (TTTI)	01	ප්‍රදර්ශනාගාර (ගෘහ භාණ්ඩ) කළමනාකරු සහ ප්‍රදර්ශනාගාර කාර්ය මණ්ඩලය	30
කොටස් කළමනාකරණය සහ සංවිධානය කිරීම	01	ප්‍රධාන කාර්යාලයේ සහ කල්දෙමුල්ල සංකීර්ණයේ තොග භාරකරුවන්	05
ඩීසල් ජෙනරේටර් නඩත්තු කිරීම	01	කල්දෙමුල්ල සංකීර්ණයේ ඉංජිනේරු සහකාරවරුන්	01
විනය පටිපාටිය	01	කනිෂ්ඨ / මධ්‍යම කළමනාකරුවන්	122
ගිනි හා ආරක්ෂාව පිළිබඳ පුහුණුව	01	රාදෑස ප්‍රධාන කාර්යාලයේ විවිධ තනතුරු	70
ප්‍රධාන කාර්ය සාධන දර්ශක (KPI)	01	රාදෑස ප්‍රධාන කාර්යාලයේ කළමනාකරුවන්	30
තොග කළමනාකරණය	01	තොග භාරකරුවන් / කළමනාකරණ සහකාර	04
මානව සම්පත් කළමනාකරණය	05	විවිධ තනතුරු	15
ඉංග්‍රීසි	04	විවිධ තනතුරු	09
උපදේශනය	02	විවිධ තනතුරු	01
ගිණුම්කරණය	01	නියෝජ්‍ය කළමනාකරුවන්	01
ආනයන අපනයන ක්‍රියාවලිය	01	ප්‍රධාන කාර්යාලයේ කළමනාකරුවන්	25
රියදුරන් සඳහා පුහුණුව	01	ප්‍රධාන කාර්යාලයේ රියදුරන්	24
මනෝවිද්‍යාව සඳහා උපදේශනය (TTTI)	01	කල්දෙමුල්ල සංකීර්ණයේ විවිධ තනතුරු	40
විගණනය	01	රාදෑස දිවයින පුරා විගණන නිලධාරීන්	34
SWOT විශ්ලේෂණය සහ අභිප්‍රේරණය	01	ප්‍රධාන කාර්යාලයේ විවිධ තනතුරු	100
කම්කරු නීතිය	01	මානව සම්පත් සහ පාලන අංශයේ කළමනාකරුවන්	06
ඩීසල් ජෙන්රේටර්	01	ඩීසල් ජෙනරේටර් ක්‍රියාකරුවන්	10
ගිනි නිවීමේ පුහුණුව	01	බූස්ස සංකීර්ණයේ විවිධ තනතුරු	25

ව්‍යාපාර කළමනාකරණය සහ තොරතුරු සන්නිවේදන තාක්ෂණය	01	තොරතුරු තාක්ෂණ අංශයේ කළමනාකරු	06
පශ්චාත් උපාධි/ උපාධි/ පශ්චාත් උපාධි ඩිප්ලෝමා/ සහතික (සේවකයන්ගේ පුද්ගලික ඉල්ලීම් මත බාහිර ආයතන මගින් සපයනු ලැබේ)	27	විවිධ තනතුරු	28
එකතුව	**69**		**886**


2022 වර්ෂයේ මුළු පුහුණු වැඩසටහන්/ වැඩමුළු සංඛ්‍යාව - 69

මුළු සේවක සංඛ්‍යාව - 886

වැය කළ මුදල - Rs.3,855,849/=

මීට අමතරව රාජ්‍ය දැව සංස්ථාවේ පර්යේෂණ, සංවර්ධන සහ පුහුණු අංශය, චීනයේ NAFGA (National Academy of Forestry and Grassland Administration) ආයතනය සමඟ එක්ව විදේශීය පුහුණු වැඩසටහන් රාජ්‍ය දැව සංස්ථා නිලධාරීන් සඳහා ලබාදීමට කටයුතු කළේය. සියළුම වැඩසටහන් මාර්ගගත ක්‍රමයට පවත්වන ලදී.

ආයතනය	වැඩසටහන	වැඩසටහන් ගණන	සේවක සංඛ්‍යාව
NAFGA (National Academy of Forestry and Grassland Administration) China	Seminar on Import and Export Management and Protection of Endangered Species for officials from Developing Countries	01	05
	Seminar on Sustainable Forest Management and Development for officials from Developing Countries	01	07
	Seminar on Pomiculture Techniques for officials of Developing Countries	01	04
එකතුව		**03**	**16**



දැව කාර්මිකයන් සඳහා වන NVQ පුහුණුව - අම්පාර ගෘහ භාණ්ඩ කර්මාන්ත ශාලාව



ගිනි ආරක්ෂක පුහුණුව - බත්තරමුල්ල ප්‍රධාන කාර්යාලය



SWOT විශ්ලේෂණය සහ අභිප්‍රේරණය පිළිබඳ පුහුණුව - ප්‍රධාන කාර්යාලය බත්තරමුල්ල



රාජ්‍ය දැව සංස්ථා රියදුරන් සඳහා ආරක්ෂිත රිය පැදවීම පිළිබඳ පුහුණුව - බත්තරමුල්ල ප්‍රධාන කාර්යාලය

බාහිර පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පිළිබඳ තොරතුරු

රාජ්‍ය දැව සංස්ථාව රාජ්‍ය හා පෞද්ගලික අංශය සමඟ සම්බන්ධ වී දැව හා වන වගා ආශ්‍රිත විෂයයන් පිළිබඳව දැනුවත් කිරීමේ කාර්යන් වල නියැලේ. දැව තාක්ෂණ පුහුණු ආයතනය (TTTI) බාහිර පුහුණු වැඩසටහන් සඳහා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. බාහිර පාර්ශවයන් සඳහා ලබා දී ඇති පුහුණු අවස්ථා පහත පරිදි වේ.

ආයතනය	සිසුන් / සේවක ගණන
දැව විද්‍යාව සහ දැව තාක්ෂණය පිළිබඳ දේශන, ශ්‍රී ලංකා වන විද්‍යාල සිසුන්	27
උසස් තාක්ෂණ ආයතනය, ගාල්ල	30
රණවිරු සම්පත් මධ්‍යස්ථානය	34
ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලය ජයවර්ධනපුර	103
තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (NVQ)	47
ගිරිඋල්ල අධ්‍යාපන කලාපය - උසස් පෙළ සිසුන්	55
මොරටුව විශ්වවිද්‍යාලය, වාස්තු විද්‍යා දෙපාර්තමේන්තුව	35
ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානය	13
නාවික හා සාගර විද්‍යා ඇකඩමිය	20
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - තලාව	40
එකතුව	**404**



ශ්‍රී ලංකා යුද හමුදාව සඳහා සිදු කරන ලද දැව හඳුනාගැනීම පිළිබඳ පුහුණුව



ගිරිඋල්ල අධ්‍යාපන කලාපයේ උසස් පෙළ, ජෛව පද්ධති ඉංජිනේරු සිසුන් සඳහා සිදු කරන ලද දැව සංරක්ෂණය පිළිබඳ පුහුණුව

NVQ ඇගයීම් සඳහා දායකත්වය

රාජ්‍ය දැව සංස්ථාවෙහි දැව තාක්ෂණ පුහුණු ආයතනය (TTTI) ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු අධිකාරිය (NAITA) සමඟ සම්බන්ධ වී වඩු කාර්මිකයන් සඳහා වන ජාතික වෘත්තීය සුදුසුකම් සඳහා වන අවසාන පරීක්ෂණවල NVQ මට්ටම් 3 සහ 4හි අවසන් ඇගයීම් සිදු කර ඇත. අවසාන පරීක්ෂණ සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය, මෙවලම් සහ උපකරණ සහ පුහුණු ස්ථානය ලබා දීමෙන් NAITA විසින් නම් කරන ලද සිසුන්ට සහ විභාග අධීක්ෂකවරුන්ට පහසුකම් සපයනු ලැබේ. 2022 දී සිසුන් 19 දෙනෙකු ඇගයීමට ලක් කරන ලදී





NAITA සමඟ ඒකාබද්ධව NVQ-RPL අවසන් ඇගයුම් කල්දෙමුල්ල TTTI හි පවත්වනු ලැබේ.

2022 දී දැව ආශ්‍රිත පර්යේෂණ අධ්‍යයන

පර්යේෂණ සංවර්ධන හා පුහුණු අංශය විසින් දැව ආශ්‍රිත පර්යේෂණ අධ්‍යයන කිහිපයක් සිදු කරන ලද අතර ඒවා සඟරා සහ සම්මන්ත්‍රණ සාරාංශ සහ සම්මන්ත්‍රණවල පර්යේෂණ ලිපි ලෙස ප්‍රකාශයට පත් කරන ලදී. මෙම අධ්‍යයනයන්හි සොයාගැනීම් දැව හා වන විද්‍යාව පිළිබඳ සිසුන්ට සහ පර්යේෂකයන්ට මෙන්ම රාජ්‍ය දැව සංස්ථාවේ ක්ෂේත්‍ර යෙදුම්වල භාවිතයන් සඳහා ඉතා වැදගත් වේ.

පහත දැක්වෙන්නේ ප්‍රකාශිත අධ්‍යනයන් ය.

ජර්නල් පර්යේෂණ පත්‍රිකා

C. K. Muthumala, Sudhira De Silva, P. L. A. G. Alwis and K. K. I. U. Arunakumara. 2022.International Wood Products Journal, Strength index-based timber classification of Sri Lankan timbers and potential for finger-joint production from wood off-cuts, Taylor and Francishttps://doi.org/10.1080/20426445.2022.2117929

C. K. Muthumala, K. K. I. U. Arunakumara, Sudhira De Silva and P.L. A. G.Alwis. 2022. Evaluation of the Flexural Strength and Failure Modes of Seven

Types of Finger Jointed Wood Species, J Fail. Anal.andPreven. 22, 680–689 (2022).https://doi.org/10.1007/s11668-022-01358-0

Wijayawardene, N. N., Muthumala, C. K. et al. 2022. Necessity of a National Fungarium and a Culture Collection for Fungi in Sri Lanka, Chiang Mai J. Sci. 2022; 49(2): 248-271 https://doi.org/10.12982/CMJS.2022.027

C. K. Muthumala . 2022. Anatomical Study of Mangrove Timber Species in Sri Lanka, The Sri Lanka Forester, Vol.41, Forest Department, p-87-102.

අන්තර්ජාතික සම්මන්ත්‍රණ පර්යේෂණ පත්‍රිකා

R. S. Brahmanage, N.N. Wijayawardene, C. M. Nanayakkara, C.K. Muthumala, S. Wijesundara, D.Q.Dai and K.G.S.U.Ariyawansa. 2022. Investigation of Eucalyptus Foliar Pathogens in Sri Lanka, International Conference on Development and Utilization of Fungai Resources, China

C.K. Muthumala, K.K.I.U. Arunakumara, Sudhira De Silva,P.L.A.G. Alwis and S.M.J.P.Dayawansha. 2022. Shrink index-based timber classification and finger joint production, International Conference on Sustainable Built Environment 2022.

ප්‍රදර්ශන

රාජ්‍ය දැව සංස්ථාව විසින් දැව තිරසාර භාවිතය ප්‍රචලිත කිරීමේ කාර්යන්වල සක්‍රීයව නිරත වේ; එබැවින් රාජ්‍ය දැව සංස්ථාව ප්‍රදර්ශන සඳහා සහභාගී වෙමින් මහජනතාවගේ දැනුම වැඩි දියුණු කරයි.

1. BMICH හි පැවැත්වුණු ගෘහ නිර්මාණ ශිල්පීන්ගේ ප්‍රදර්ශනය - 2022
2. දෙහිවල ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ ප්‍රදර්ශනය



දෙහිවල ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ ප්‍රදර්ශනය



ගෘහ නිර්මාණ ශිල්පීන්ගේ BMICH හි පැවැත්වුනු ප්‍රදර්ශනය 2022

බාහිර පාර්ශ්ව සඳහා තාක්ෂණික සහාය

දැව සම්බන්ධ ගැටළු විසඳීම සඳහා පර්යේෂණ සංවර්ධන හා පුහුණු අංශය බාහිර ආයතන සඳහා තාක්ෂණික සහාය සපයයි. උදාහරණයක් ලෙස, ගෘහ භාණ්ඩ මිලදී ගැනීමේ ප්‍රසම්පාදන; ලී භාණ්ඩ සඳහා පිරිවිතර සැකසීම; දැව භාවිතය පිළිබඳ උපදේශනය, ආදිය. මේ අනුව, 2022 දී රාජ්‍ය දැව සංස්ථාව පහත ආයතන/වැඩසටහන් සඳහා සහාය විය.


1. 2050 කාබන් විමෝචනය අවම කිරීමේ සැලැස්ම සැකසීමට දායක වූ අතර ඒ සඳහා පරිසර අමාත්‍යාංශයට උපාය මාර්ගික සැලැස්මක් සකස් කිරීමට සහාය වීම.
2. ශ්‍රී ලංකා තේ කර්මාන්තය සඳහා දැව ඉන්ධන තිරසාර භාවිතය සඳහා වූ මෙහෙයුම් කමිටුවට දායක වීම.
3. NCS සහ ක්‍රීඩා දැව නිෂ්පාදන සංවිධානය කිරීමේ විෂයමාලා සකස් කිරීම සඳහා NAITA වෙත තාක්ෂණික සහාය ලබා දීම.
4. වන විද්‍යාලයේ සිසුන් සඳහා වන විද්‍යා හා දැව තාක්ෂණ උපදේශන ලබාදීමට දායක වීම.
5. ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ වන විද්‍යාව සහ දැව විද්‍යාව පිළිබඳ විෂයමාලා සකස් කිරීමට දායක වීම.

දැව හඳුනා ගැනීම සහ දැව වාර්තා නිකුත් කිරීම

ව්‍යුහ විද්‍යාත්මක ලක්ෂණ තුළින් දැව හඳුනාගැනීම සඳහා දැව ව්‍යුහ විද්‍යාව භාවිත කිරීමට පර්යේෂණ සංවර්ධන හා පුහුණු අංශය නවීන තාක්ෂසණය භාවිත කරයි. මෙම ක්‍රියාවලිය යටතේ වාර්ෂිකව දැව හඳුනාගැනීමේ සහතික සහ අනෙකුත් වාර්තා 150-200ක් පමණ රාජ්‍ය ආයතන, රාජ්‍ය නොවන ආයතන හා පුද්ගලයන් වෙත නිකුත් කෙරේ. දැව හඳුනා ගැනීමට අමතරව, MOR, MOE, සම්පීඩන පරීක්ෂණය, ඝනත්ව පරීක්ෂණ, දැව පරිරක්ෂණ පරීක්ෂණ (Boron, CCB) ශක්ති ගුණාංග පරීක්ෂණ වැනි පරීක්ෂණ සිදු කරන ලදී. ඒ අනුව 2022 වර්ෂයේදී පහත වාර්තා නිකුත් කර ඇත.

දැව හඳුනාගැනීම සඳහා පරීක්ෂා කරන ලද සාම්පල සංඛ්‍යාව 163 ක් වූ අතර නිකුත් කළ මුළු වාර්තා සංඛ්‍යාව 158 කි.


වාර්තා විස්තරය	වාර්තා ගණන
දැව හඳුනාගැනීම	79
දැව තෙතමනය පරීක්ෂා කිරීම	24
දැව ඝනත්ව පරීක්ෂණය	17
බෝරෝන් පරීක්ෂණය	09
CCB පරීක්ෂණය	03
දැව්වල ශක්ති ගුණාංග	04
වෙනත් (තාක්ෂණ වාර්තා සහ ක්ෂේත්‍ර චාරිකා මගින්)	22
මුළු වාර්තා සංඛ්‍යාව	**158**



රාජ්‍ය දැව සංස්ථාවේ දැව විද්‍යාගාරයේ UTM යන්ත්‍රය මගින් දැව්වල ශක්ති ගුණාංග පරීක්ෂණය කිරීම

ISO 9001:2015 තත්ත්ව කළමනාකරණ පද්ධතිය ස්ථාපිත කිරීම

රාජ්‍ය දැව සංස්ථාවේ බූස්ස ගෘහ භාණ්ඩ සංකීර්ණය සඳහා ISO 9001:2015 තත්ත්ව කළමනාකරණ පද්ධති


Certificate of Conformity

The Sri Lanka Standards Institution
Certifies that the Quality Management System of

STATE TIMBER CORPORATION
"SAMPATHPAYA",
NO. 82, RAJAMALWATTA ROAD, BATTARAMULLA,
SRI LANKA

has been assessed and approved in accordance with the requirements of ISO 9001:2015/ SLS ISO 9001:2015

Certificate No: QSC 10084
This certificate issued on 2022-08-16 is valid up to 2025-08-15
Date of first certification 2022-08-16

SCOPE OF CERTIFICATION


DESIGN, DEVELOPMENT AND MANUFACTURE OF WOODEN (TIMBER) CARVINGS, BUILDER'S CARPENTRY AND JOINERY, ORNAMENTAL ITEMS; MANUFACTURE OF SEASONED (DRIED) AND UNSEASONED (GREEN) SAWN TIMBER, CHEMICALLY TREATED (PRESERVED) AND UNTREATED (UNPRESERVED) SAWN TIMBER; AND PROVISION OF SEASONING AND TREATMENT PROCESSES FOR SAWN TIMBER.

This approval is subject to the continued satisfactory operation of the organization's Quality Management System.
This certificate is also applicable to the sites described in the authorized schedule bearing the same number and date as in this certificate. The authorized schedule describes site specific activities/ functions.

DIRECTOR GENERAL/CEO

SRI LANKA STANDARDS INSTITUTION
No. 17, Victoria Place, Elvitigala Mawatha, Colombo 08, Sri Lanka
www.slsi.lk

Page 1 of 2


Authorized Schedule

Certificate No: QSC 10081 continued
Issued on 2022-08-16 Valid up to 2025-08-15

APPLICABLE SITES

1. STATE TIMBER CORPORATION HEAD OFFICE
"SAMPATHPAYA", NO 82, RAJAMALWATTA ROAD, BATTARAMULLA, SRI LANKA

ACTIVITIES / FUNCTIONS
MARKETING, PURCHASING, RESEARCH & TRAINING, HUMAN RESOURCE & ADMINISTRATION

2. BOOSSA FURNITURE COMPLEX
STATE TIMBER CORPORATION, BOOSSA, SRI LANKA

ACTIVITIES / FUNCTIONS
WOODEN (TIMBER) FURNITURE PRODUCTION, SEASONING, PRESERVATION, SAWMILLING, MAINTENANCE, MARKETING, PURCHASING

This authorized schedule is meant to be used together with the certificate referred above and this schedule alone shall not be considered as a valid certificate.

DIRECTOR GENERAL/CEO

SRI LANKA STANDARDS INSTITUTION
No. 17, Victoria Place, Elvitigala Mawatha, Colombo 08, Sri Lanka
www.slsi.lk

Page 2 of 2

සහතිකය ලබා ගන්නා ලදී. දේශීය සහ ජාත්‍යන්තර වෙළෙඳපොළ තුළ ගෘහ භාණ්ඩ අපනයනයට රාජ්‍ය දැව සංස්ථා කීර්තිය ඉහළ නැංවීම සඳහා මෙම

තත්ත්ව සහතිකය ඉතා වැදගත් වේ.

මෙම සහතිකකරණය බූස්ස ගෘහ භාණ්ඩ සංකීර්ණය සහ ප්‍රධාන කාර්යාලය සඳහා වලංගු වන අතර එහි වපසරියට පහත සඳහන් ක්‍රියාවලින් ඇතුළත් වේ.

බූස්ස: දැව ඉරීම, පදම් කිරීම, පරිරක්ෂණය, දැව උපාංග නිෂ්පාදනය හා එකලස් කිරීම, ගෘහ භාණ්ඩ ගබඩා කිරීම

ප්‍රධාන කාර්යාලය: අලෙවිකරණය, මානව සම්පත් කළමනාකරණය, පර්යේෂණ, සංවර්ධන හා පුහුණුව, මිලදී ගැනීම හා නිර්මාණකරනය.

පයිනස් පිළිබඳ වාර්තා වැඩසටහන


ශ්‍රී ලංකාවේ පයින් වගාව, පයින් ශාකයේ ගුණ සහ ඒවායේ යෙදීම් පිළිබඳව මහජනතාව සහ සිසුන් දැනුවත් කිරීම සඳහා පයිනස් දැව පිළිබඳ වාර්තාමය වැඩසටහන් සකස් කරන ලදී. රාජ්‍ය දැව සංස්ථාවේ පර්යේෂණ, සංවර්ධන හා පුහුණු අංශය සහ අලෙවි අංශය ඒකාබද්ධව මෙම වාර්තාමය වැඩසටහන සැකසීමට දායක විය.







ව්‍යාපාර සාරාංශය


ආදායම් වර්ධන ප්‍රවනතා විශ්ලේෂණය






ලාභ වර්ධන ප්‍රවණතා විශ්ලේෂණය











ව්‍යාපාර සාරාංශය


නිෂ්පාදන ප්‍රවර්ධන ප්‍රවණතා විශ්ලේෂණ














ප්‍රාග්ධන වියදම් - 2022

විස්තරය (රු මිලියන 2ට වඩා වැඩි	Rs.
ප්‍රතිසංස්කරණ කටයුතු - ප්‍රධාන කාර්යාලය	19,433,488
බොයිලේරු - අම්පාර ගෘහභාණ්ඩ ඒකකය	2,903,992
අට්ටිමඩු - නුවර ප්‍රාදේශිකය	3,793,890

ආයෝජන

	31-12-2022	31-12-2021
රජයේ ආයතනවල තාවකාලික අතිරික්ත අරමුදල් ගිණුම	731,832,197	346,843,350
රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව	241.353,882	232,747,814
ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව	500,000	500,000
මහජන බැංකුව	1,900,333,483	1,828,073,777
ලංකා බැංකුව	1,805,915,239	2,606,347,769

දශකයක තොරතුරු (නිරපේක්ෂ සංඛ්‍යා)

		2013	2014	2015	2016	2017	2018	2019	2020	2021	2022
මුළු වාර්ෂික ආදායම	Rs. '000	3,213,644	3,756,482	4,132,052	4,522,238	4,630,718	4,457,024	4,608,413	4,372,033	5,996,789	5,465,421
වාර්ෂික දළ ලාභය	Rs. '000	1,197,518	1,453,450	1,757,115	2,045,090	2,075,950	1,964,647	1,890,812	1,745,766	2,753,682	2,290,975
භාණ්ඩාගාර සහ ආදායම් බදු පෙර ලාභය	Rs. '000	382,337	427,222	768,699	659,732	966,804	672,433	512,947	569,521	1,496,156	1,015,986
මුළු සේවක පිරිවැය	Rs. '000	1,117,036	1,254,516	1,449,749	1,789,572	1,572,775	1,553,598	1,584,418	1,640,020	1,580,855	1,776,363
වාර්ෂික ප්‍රාග්ධන වියදම්	Rs. '000	332,870	115,132	244,929	113,675	94,637	116,034	319,485	104,712	126,547	47,998
වර්ෂාවසාන ජංගම නොවන වත්කම්	Rs. '000	1,658,535	1,654,908	1,743,580	1,732,640	1,894,597	1,978,855	2,581,165	1,966,637	2,158,971	2,391,511
වර්ෂාවසාන ජංගම වත්කම්	Rs. '000	3,153,777	4,004,860	4,115,259	3,652,116	4,423,105	4,541,610	4,640,889	5,319,557	7,048,847	7,196,775
වර්ෂාවසාන ජංගම වගකීම්	Rs. '000	1,050,258	1,591,991	1,480,966	897,087	1,234,716	1,047,668	967,481	985,365	1,791,411	1,423,068
වර්ෂාවසාන ජංගම නොවන වගකීම්	Rs. '000	384,831	484,649	424,854	499,373	852,292	812,441	714,022	836,197	659,200	500,063
වර්ෂාවසාන ස්කන්ධය	Rs. '000	3,377,223	3,583,129	3,953,019	3,988,297	4,230,694	4,660,357	5,540,551	5,464,633	6,757,207	7,665,155
ඒකාබද්ධ අරමුදලට දායකත්වය	Rs. '000	50,000	25,000	50,000	175,000	100,000	100,000	50,000	511,026	100,000	320,000
වර්ෂාවසාන සේවක සංඛ්‍යාව	NOS.	2,139	2,186	2,145	2,125	2,083	2,001	1,803	1,708	1,606	1,500
ප්‍රධාන ක්‍රියාකාරී දර්ශක											
ස්කන්ධය භාණ්ඩාගාර සහ ආදායම් බදු පෙර ශුද්ධ ලාභය	%	11.32	11.92	19.45	16.54	22.85	14.43	9.26	10.42	22.14	13.25
මුළු වත්කම්වලට භාණ්ඩාගාර සහ ආදායම් බදු පෙර ශුද්ධ ලාභය	%	7.94	7.55	13.12	12.25	15.30	10.31	7.10	7.82	16.25	10.60
ජංගම අනුපාතය	Times	3.00	2.52	2.78	4.07	3.58	4.33	4.80	5.40	3.93	5.06
ස්කන්ධයට වත්කම් අනුපාතය	Times	0.70	0.63	0.67	0.74	0.67	0.71	0.77	0.75	0.73	0.80
වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය	%	3.78	3.64	6.31	0.66	3.84	6.59	12.19	8.00	6.91	14.04
මුළු පිරිවැටුම් වර්ධනය	%	(11.13)	16.89	10.00	9.44	2.40	(3.75)	3.40	(5.13)	37.16	(16.73)

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. එල්ඛඛඑල්/ඒ/එස්ටීඕ/එල්ඒ/01/2022/63

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2023 ජූලි 04 දින

සභාපති
රාජ්‍ය දැව සංස්ථාව







රාජ්‍ය දැව සංස්ථාවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

විගණකාධිපතිවරයා විසින් අත්සන් කරන ලද යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ආර්.එම්.එම්.එස්. පෙරේරා
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත් -
1. ලේකම් - වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය
2. ලේකම් - මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34
+94 11 2 88 72 23
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. එන්බඒඑල්/ඒ/එස්ටීඕ/එන්ඒ/01/2022/63

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2023 ජූලි 04 දින

රාජ්‍ය දැව සංස්ථාව
26 JUL 2023
සාමාන්‍යාධිකාරි කාර්යාලය

සභාපති

රාජ්‍ය දැව සංස්ථාව

රාජ්‍ය දැව සංස්ථාවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
සාමාන්‍යාධිකාර් (මූදල්) කියුම අංශය
27 JUL 2023
රාජ්‍ය දැව සංස්ථාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

රාජ්‍ය දැව සංස්ථාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය [illegible] දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34
+94 11 2 88 72 23
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි 31 හා 51 ඡේද අනුව වාර්තාකරන දිනට වත්කම්වල සාධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවලින් නිරූපණය වන ආකාරයට වත්කම් නැවත තක්සේරු කළ යුතු අතර වත්කම් සුන්බුන් වටිනාකම සහ ප්‍රයෝජනවත් ආයු කාලය අවම වශයෙන් සෑම මූල්‍ය වර්ෂයකදීම සමාලෝචනය කළ යුතුය. එසේ වුවද, 1968 වර්ෂයේ සිට රාජ්‍ය දැව සංස්ථාවට පවරාගෙන රු.91,657,617 ක් වශයෙන් මූල්‍ය ප්‍රකාශනවලින් නිරූපණය කරන ඉඩම්වල වර්තමාන වෙළඳපළ වටිනාකම සහ තවදුරටත් භාවිතයේ පවතින සම්පූර්ණයෙන් ක්ෂය වූ පිරිවැය රු.844,535,194 ක් වූ දේපළ පිරියත හා උපකරණවල ඵලදායී ජීවිත කාලය නැවත තක්සේරු කිරීමට සංස්ථාව කටයුතු කර නොතිබුණි.

(ආ) උපචිත සංකල්පය හා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 18 හි 09 වන ඡේදයට අනුව ලැබුණා හෝ ලැබිය යුතු සාධාරණ අගය සලකා බැලීමෙන් ආදායම් මැනීම කළ යුතුය. එසේ වුවද, හල්මිල්ලෑව තේක්ක වැඩ බිමෙහි සිදුවී තිබූ රු.2,994,536 ක අලාභය ප්‍රමාදයකින් තොරව අයකර ගැනීමට 2022 අප්‍රේල් 22 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා නියෝගය හා අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අනුව එක් අයකුගෙන් පමණක් අයකරගත් රු.299,453 ක් හැර ඉතිරි රු.2,695,083 ක වටිනාකම සමාලෝචිත වර්ෂයේ ලැබිය යුතු ආදායමක් ලෙස හඳුනා ගෙන නොතිබුණි. ඒ හේතුවෙන් එම වටිනාකමකින් සමාලෝචිත වර්ෂයේ ආදායම හා ජංගම වත්කම් ඌන ගණනය වී තිබුණි.

(ඇ) සංස්ථාවට එරෙහිව පවරා ඇති වන්දි වටිනාකම රු.2,008,710 ක් වූ නඩු 03 ක් සහ වන්දි වටිනාකම හඳුනා නොගත් නඩු 04 ක් සංස්ථාව විසින් පවරා ඇති නඩු වශයෙන් නිවැරදි නොවන ආකාරයට මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කර තිබුණු අතර ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 37 හි 28 සහ 34 ඡේදයන් ප්‍රකාරව අසම්භාව්‍ය වගකීම් හා අසම්භාව්‍ය වත්කම් හඳුනා ගැනීමට ද කටයුතු කර නොතිබුණි.

(ඈ) අනුමත ජ'නල් සටහන් වවුචරයකින් තොරව සේවක ණය පොලී ලෙස රු.11,072,773 ක් රඳවාගත් ඉපයුම්වලින් සේවක ණය වක්‍රිය අරමුදලට මාරු කර තිබුණි.

(ඉ) 2022 ජූලි 31 දිනට සිදු කරන ලද විශේෂ තොග සමීක්ෂණ වාර්තාව අනුව කල්දෙමුල්ල ගෘහභාණ්ඩ සංකීර්ණයේ පිරිවැය රු.2,622,900 ක් වූ ප්‍රතික්ෂේපිත සිල්පර, විදුලි කණු සහ වැට කණු ඒකක 757 ක් ඉතිරි තොග වශයෙන් ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 02 හි 09 ඡේදය ප්‍රකාරව අවසන් තොගය පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන අගයන්හි අඩු අගයට අගයකළ යුතු වූවත්, ප්‍රාදේශීය කාර්යාල 02 ක චෙන්දේසි කිරීම

සඳහා වෙන් කර තිබුණු ශුද්ධ උපලබ්ධි අගය රු.11,244,320 ක් වූ දැව කඳන් සහ ඉරු දැව, ඒවායේ රු.12,951,479 ක් වූ පිරිවැය වටිනාකමට අගය කර තිබීමෙන් මූල්‍ය ප්‍රකාශනවල තොග වටිනාකම රු.1,707,159 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(උ) ප්‍රාදේශීය කාර්යාල 09 ක පිරිවැය රු.303,526,109 ක් වූ තොගයේ ශුද්ධ උපලබ්ධි අගය රු.259,462,014 ක් වීමෙන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 02 හි 34 ඡේදය ප්‍රකාරව අඩු වූ රු.44,064,096 ක අගය විසඳම් යටතේත්, රු.303,526,109 ක පිරිවැය විකුණුම් පිරිවැය යටතේත් දැක්විය යුතු වුවද, ශුද්ධ අගය වූ රු.259,462,014 ක් විකුණුම් පිරිවැයට ගලපා තිබීමෙන් රු.44,064,096 ක් බැඟින් දළ ලාභය හා වෙනත් විසඳම් අඩුවෙන් නිරූපණය කර තිබුණි.

(ඌ) සංස්ථාවේ තොග ආගණනය කිරීමේ ප්‍රතිපත්තිය පළමු ලැබීමේ පළමු නිකුත් කිරීම (FIFO) ක්‍රමය වුවද, ඉරු දැව ගබඩාවල ඉතා පැරණි දැව් පැවතුණි. එසේ පවතින පැරණි දැව කාල විශ්ලේෂණයක් කර ඊට අදාළ වන රේටයන් අනුව තොග වටිනාකම් ආගණනය කළ යුතු වුව ද, ඇතැම් දැව තොග 2022 වර්ෂයේ ඉරු දැවවලට අදාළව ගණනය කළ රේටයන් යටතේ ගණනය කර තිබීමෙන් සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශනවල පවතින ඉරු දැව තොගය නිවැරදි බවට සනාථ කළ නොහැකි විය.

(එ) සමාලෝචිත වර්ෂය අවසානයට කැප්පෙටිපොල ගබඩාවට අයත් ඉරු දැව වෙන්දේසි තොග ආගණනය කිරීමේදී 2022 වර්ෂයට අදාළ ලොට් 73 ක පවතින ඝන ඩෙසිමීටර් 40,068 ක තොග, 2021 වර්ෂයේ ඒකක රේටය අනුව ආගණනය කිරීම නිසා අවසන් තොගය රු.1,501,748 ක් අඩුවෙන් ද, 2021 වර්ෂයට අදාළ ඝන ඩෙසිමීටර් 1,275 ක ලොට් 02 ක් 2022 වර්ෂයේ ඒකක රේටයට අනුව ආගණනය කිරීම නිසා අවසන් තොගයේ වටිනාකම රු.47,787 කින් වැඩියෙන් ද, දැක්වීමෙන් කැප්පෙටිපොළ ගබඩාවේ සමස්ථ වෙන්දේසි තොගය රු.1,453,961 ක් අඩුවෙන් දැක්වුණි.

(ඒ) අම්පාර ගෘහ භාණ්ඩ නිෂ්පාදනාගාරයේ 2009 වර්ෂයේ සිට පවතින වන අපරාධ කඳන් ඝන ඩෙසිමීටර් 148,178 ක් සම්බන්ධයෙන් පවත්නා නඩු කටයුතු අවසන් වී ඇත්දැයි සොයා බලා ඒවා තොග පොත්වලට ඇතුළත් කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන

කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 සංස්ථාවේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන සංස්ථාවේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතික වීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැළපෙනවාද යන්න සලකා බැලීමයි.

සංස්ථාවේ 2022 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තවදුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේනම් ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සංස්ථාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර

අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තව දුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබා ගන්නා ලදි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සංස්ථාව පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(I)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(I)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ මතය සඳහා පදනම කොටසේ (අ), (ආ), (ඊ) හා (ඌ) ඡේදයන්හි දක්වා ඇති

නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සංස්ථාව සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණයන් හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

	නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට යොමුව	නිරීක්ෂණ
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය.	
	i. මුදල් රෙගුලාසි 110	සංස්ථාවේ හානි පාඩු පිළිබඳ ලේඛනය යාවත්කාලීන කර පවත්වා නොතිබුණි.
	ii. මුදල් රෙගුලාසි 1646	වාහන භාර නිලධාරීන් විසින් වාර්තාව ඉදිරිපත් කරනු ලබන මාසයට පසු ඊළඟ මාසයේ 15 වැනි දිනට පෙර ගමන් පිළිබඳ මාසික සාරාංශයේ මුල් පිටපත සමඟ මාසයේ දෛනික ධාවන සටහන් ආයතන ප්‍රධානියා මාර්ගයෙන් විගණකාධිපති වෙත ලබා දිය යුතු වුව ද, වාහන 39කට අදාළව 2021 හා 2022 වර්ෂයන්හි දෛනික ධාවන සටහන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ)	2021 නොවැම්බර් 16 දිනැති අංක 1/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.6 ඡේදය	කෙටුම්පත් වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවද සංස්ථාවේ 2022 වර්ෂයේ කෙටුම්පත් වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි.
(ඇ)	1992 අගෝස්තු 19 දිනැති අංක 26/92 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	රජයේ වාහනවල රාජ්‍ය ලාංඡනය යෙදීම අනිවාර්ය කර තිබුණ ද, සංස්ථා වාහනවල රාජ්‍ය ලාංඡනය යොදා නොතිබුණි.
(ඈ)	2015 මැයි 25 දිනැති අංක PED 1/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය	
	i. 3.1, 3.2.1 සහ 3.2.2 ඡේද	නිලවාහන හිමි නිලධාරීන්ට මාසික ඉන්ධන ප්‍රමාණය, දීමනාවක් ලෙස ලබා දිය යුතු වුවද, මාසිකව ප්‍රතිපූරණය කිරීමේ පදනම මත අග්‍රිමයක් ලෙස ඉන්ධන දීමනාව ලබා දී තිබුණු අතර එම අග්‍රිමය ප්‍රමාණවත් නොවන අවස්ථාවලදී අත්තිකාරම් ලබා ගනිමින් වියදම් දරා පසුව අනුමැතිය ලබාගෙන තිබුණි. ඊට අදාළ බොහෝමයක් ගමන් පෞද්ගලික ඒවා බවට ද නිරීක්ෂණය විය.
	ii. 3.1 ඡේදය	සංස්ථා සභාපතිවරයාට මසකට භාවිතා කළ හැකි උපරිම ඉන්ධන ප්‍රමාණය ලීටර 170 ක් වුවද, 2020 හා 2021 වර්ෂයන්හි හිටපු සභාපතිවරයා විසින් වාහන 03ක් භාවිතයට ගෙන මසකට ඉන්ධන ලීටර 875 ක් බැගින් ලීටර 705 ක් වැඩියෙන් ලබාගෙන තිබුණි. තවද, එම චක්‍රලේඛයේ විධිවිධානවලට පටහැනිව එම කාලය තුළ නිලධාරීන් විසින් නිල වාහන පදවා රියදුරන් ලවා ධාවන සටහන් පිළියෙල කරවාගෙන තිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර සංස්ථාවේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

බලතල, කර්තව්‍ය සහ කාර්යයන්	නිරීක්ෂණ
1982 පෙබරවාරි 05 දිනැති අංක 178/10 දරන අති විශේෂ ගැසට් නිවේදනය.	සංස්ථාවේ අරමුණක් වූ දැව ආශ්‍රිත නිමි හා අර්ධ නිමි භාණ්ඩ අපනයනය කිරීමේ කාර්යය ඉටු කර ගැනීම සඳහා ප්‍රමාණවත් පද්ධති හා පාලන ක්‍රමයක් ස්ථාපිත කිරීමට අපොහොසත් වී තිබුණි.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර සංස්ථාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

(අ) සංස්ථාවේ කුරුණෑගල ප්‍රාදේශීය කාර්යාලය හා දැව ගබඩාව පිහිටි හෙක්ටයාර් 0.5033 ක ඉඩම මිලදී ගැනීම සඳහා 1987 වර්ෂයේ දී ඇස්තමේන්තුගත රු.400,000 ක මුදලෙන් සියයට 15 ක් ප්‍රාදේශීය ලේකම් වෙත තැන්පත් කර එය නොසළකා හැරීමත්, ඉන් වසර 15 කට පසු 2002 වර්ෂයේ දී එහි අයිතිකරුට රු.12,000,000 ක් ගෙවා ඉඩම අත්පත් කර ගැනීමට ප්‍රාදේශීය ලේකම් කළ දැනුම්දීම නොසලකා හැරීමත් හේතුවෙන් 2019 වර්ෂයේ අභියාචනාධිකරණ නඩු තීන්දුවක් අනුව වන්දි හා නෛතික පොලී සමඟ රු.32,005,946 මුදලක් ප්‍රාදේශීය ලේකම් වෙත ගෙවීමට සිදුවී තිබුණි. තවද, ප්‍රාදේශීය ලේකම් විසින් ඉඩමේ අයිතිකාර සමාගම වෙත එයින් රු.24,414,578 ක් පමණක් ගෙවා රු.7,591,369 ක මුදලක් රඳවාගෙන තිබීමත් අදාළ ඉඩම සංස්ථාවට පවරා දීමට ද කටයුතු කර නොතිබීමත් මතභේදාත්මක කරුණක් විය.

(ආ) විදුලි බල මණ්ඩලය වෙත යුකැලිප්ටස් වර්ගයේ විදුලි කණු සැපයීම සඳහා සංස්ථාව එම මණ්ඩලය සමඟ ඇති කරගත් ගිවිසුමේ කොන්දේසි අනුව නියමිත දිනට විදුලි කණු සැපයීමට නොහැකිවීම හේතුවෙන් දිනකට සියයට 0.1 ක් බැගින් උපරිමය සියයට 10 කට යටත්ව ප්‍රමාද ගාස්තු (Liquidated Damages) ගෙවීමට සිදුවී තිබුණු අතර 2011 වර්ෂයේ සිට 2016 දක්වා කාලය තුළ සංස්ථාව එළෙස ගෙවූ ප්‍රමාද ගාස්තුව රු.8,402,314 ක් සේවක අකාර්යක්ෂමතාවය මත ඇතිවූ පාඩුවක් බවට නිරීක්ෂණය විය.

(ඇ) 2020 ජනවාරි 09 දින සිට 2022 මාර්තු 10 දින දක්වා සංස්ථාවේ හිටපු සභාපතිවරයා විසින් භාවිතා කරන ලද Dell Laptop 01 ක්, Samsung Tab 01 ක් සහ Samsung Mobile Phone 01 ක් නැවත සංස්ථාවට භාර නොදීම හේතුවෙන් ඔහුගෙන් අයකළ යුතු බවට

ගණනය කළ රු.529,199 ක වෙළඳපොල වටිනාකම හා නැවත අත්පත් කර ගැනීමට දැරියයුතු වියදම සියයට 25 ක් ඇතුලුව මුළු මුදල රු.532,949 ක් අයකරගෙන නොතිබුණි.

(ඇ) අලි ගහනය බහුල ප්‍රදේශයක පිහිටා ඇති ඔඩ්ඩුසුඩ්ඩාන් ගබඩාව ආවරණය වන පරිදි 2018 වර්ෂයේ රු.993,751 ක වියදමකින් ඉදිකරන ලද නමුත් ආරම්භයේ සිටම ක්‍රියාත්මක නොවන විදුලි වැට අදාළ කොන්ත්‍රාත්කරු ලවාම අලුත්වැඩියා කරවා ගැනීමට හෝ කොන්ත්‍රාත්කරුට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් වැය කළ මුදල නිෂ්කාර්ය වී තිබුණු අතර ගබඩාවට හා නිලධාරීන්ට අලින්ගෙන් හානි සිදුවීමේ අවධානමක් පැවතුණි.

(ඉ) වන අපරාධ අංක හෝ වනයෙන් නිකුත් කිරීමේ නිවේදනපත් අංකයක් හෝ වෙනත් ලිඛිත සාක්ෂියක් නොමැති අලෙවි වටිනාකම රු.3,420,427 ක් වූ කැබලි 2,570 ක් ඇතුළත් වන අපරාධ ඉරු දැව තොග (Lot) 35 ක් නිෂ්කාර්ය ලෙස කැප්පෙට්ටිපොළ ගබඩාවේ රඳවාගෙන තිබුණි.

(ඊ) බොරලන්ද ගබඩාවේ 2019 වර්ෂයේ සිට අක්‍රීයව පවතින වෙහෙරාන් ඉරුම් යන්ත්‍රය අළුත්වැඩියා කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් වට අඩි 04 ට වැඩි කඳන් ඉරීම අඩපන වී එම කාර්යය CHAIN SAW යන්ත්‍රය මඟින් සිදු කරමින් පැවතීම නිසා දැව ඉරීමේ අපතය ඉහළ අගයක් ගන්නා බවට නිරීක්ෂණය විය.

(උ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2.2 මාර්ගෝපදේශය ප්‍රකාරව සිමිත ජාතික මිල කැඳවීමේ දී අවම වශයෙන් දින 21 ක ලංසු කාලයක් ලබා දිය යුතු වුවත්, කුරුණෑගල පොල්පිතිගම බීට්ටුවේ හෙක්ටයාර් 6 ක්වූ 01/008 C වැඩබිමෙහි තේක්ක ගස් 1720 ක් හෙළීම සම්බන්ධයෙන් අවස්ථා 03 කදී ලංසු කැඳවා අවස්ථා 02 දී නියමිත කාලයට වඩා අඩු ලංසුකාලයක් ලබා දී තිබුණු අතර පළමු ලංසු කැඳවීමේදී තෝරාගත් නමුත් ගිවිසුම්ගත නොවූ ලංසුකරුටම තෙවන ලංසු කැඳවීමේ දී ඒ වන විට ඉවත් කර තිබූ ගස් 290 ක් ද සමඟ සම්පූර්ණ ගස් ප්‍රමාණයම ඉවත් කිරීමට කොන්ත්‍රාත්තුව පිරිනැමීම මතභේදාත්මක කරුණක් බවට නිරීක්ෂණය කෙරේ.

(ඌ) මූලතිව් දිසා වන කාර්යාලය යටතේ පාලනය වන හෙක්ටයාර 40 ක් වූ මුරිප්පු තේක්ක වගාව පූර්ණ හෙළීම් සඳහා 2021 නොවැම්බර් මස රාජ්‍ය දැව සංස්ථාවට භාර දී තිබුණු අතර එහි වැඩ නිම කර 2022 අගෝස්තු 31 දින වන විට ආපසු වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට භාර දිය යුතුව තිබුණි. එසේ වුවද, හෙළීම් අවසන් නොකිරීම, කඳන් අංක නොකර රඳවාගෙන තිබීම, නිවැරදි දත්ත ඇතුළත්ව ලේඛන යාවත්කාලීන නොකිරීම

හා ඵලදාව අඩුවෙන් ලේඛනගත කර තිබීම, නිවේදන පත්‍රවල අංක හා කඳන් අංක වෙනස් වීම, හෙළීම් කළ යුතු ගස් තැනින් තැන ඉතිරි කර තිබීම යනාදී විවිධ අක්‍රමිකතා හේතුවෙන් 2023 මැයි 16 දින වන විට වසර 02 කට ආසන්න කාලයක් ගතවී තිබුණ ද එහි වැඩ නිම කිරීමට සංස්ථාව අපොහොත් වී තිබුණි.

තවද, 2022 ඔක්තෝබර් 12 දින සිදු කළ භෞතික පරීක්ෂාවේදී හෙළීම් කරන ලද සියලුම දැව වැඩබිමෙන් බැහැර කර තිබුණ ද, එදින වැඩබිමෙහි නොතිබුණු දැව පසුව ගබඩාවට එවා තිබීමත්, දික් මීටර 815 ක් වූ ගස් 87 ක් ගබඩාවට ලැබී නොතිබීමත් මතභේදාත්මක විය.

(එ) පූර්ණ හෙළීම් වැඩ බිමක භූමි වර්ගීකරණය කිරීම සඳහා සංස්ථාව විසින් පොදු නිර්ණායකයන් 15 ක් ඇතුළත් සෑම වැඩ බිමකටම එක ලෙස ආදේශ කිරීමට නොහැකි අතාත්වික ක්‍රමවේදයක් අනුගමනය කර තිබුණු අතර මූලතිව් මුරිප්පු තේක්ක පූර්ණ හෙළීම් වැඩබිමට ද එය ආදේශ කිරීම තුළින් වැරදි භූමි වර්ගීකරණයක් සිදු කර තිබුණි. ඒ හේතුවෙන් දැව පරිවර්තනය කිරීම සඳහා කොන්ත්‍රාත්කරුවන්ට ඉහළ රේටයක් ගෙවීමට සිදුවී තිබුණු අතර නිලධාරීන් නිසි සැළකිල්ලෙන් යුතුව රාජකාරී ඉටු නොකිරීම මත පිරිවැය ඉහළ යැමෙන් සංස්ථාවට අලාභ සිදුවන බවට නිරීක්ෂණය විය.

(ඒ) වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුව අනුව මූලතිව් මුරිප්පු වැඩ බිමෙහි මුළු දැව ඵලදාව ඝ.මී.1,550 ක් වුවද, සංස්ථාව එය ඝ.මී.700 ක් ලෙස ඝ.මී.850 ක් හෙවත් සියයට 54.84 ක් අඩුවෙන් ඇස්තමේන්තු කර තිබුණි. තවද, එම වැඩබිමෙහි C කොටසේ තත්‍ය ඵලදාව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුව සමඟ සැසඳීමේදී දික් මීටර 13,662 ක් හෙවත් සියයට 64 ක අසාමාන්‍ය අඩු අගයක් විය.

(ඔ) සංස්ථාව විසින් ගෘහ භාණ්ඩ නිෂ්පාදනය සඳහා ගත වන ශ්‍රම පැය ඇස්තමේන්තු කර තිබුණ ද, සත්‍ය වශයෙන් වැය වන ශ්‍රම පැය සමඟ සසඳා ශ්‍රමිකයන්ගේ කාර්යක්ෂමතාව හා ඵලදායීතාව මැනීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබීමෙන් ශ්‍රමිකයන් කාර්යක්ෂමව හා ඵලදායිව යොදාගෙන ඇති බවට සනාථ කළ නොහැකි විය.

(ඕ) වාර්ෂික විකුණුම් අවශ්‍යතාවය මත නිෂ්පාදන අවශ්‍යතාවය පුරෝකථනය කිරීම, යහපත් තොග පාලන ශිල්ප ක්‍රම අනුගමනය කර විධිමත් හා ප්‍රමාණවත් ගබඩා පවත්වා ගැනීම, කාර්යක්ෂම නිෂ්පාදන ක්‍රියාවලියක් ස්ථාපිත කිරීම යන කරුණු සම්බන්ධයෙන් ඉහළ කළමනාකාරිත්වයේ අවධානය යොමු නොවීම හේතුවෙන් 2012 වර්ෂයේ සිට 2022 ජූලි 31 දින දක්වා නිෂ්පාදනය කරන ලද පිරිවැය රු.68,239,793 ක් වූ අතිරික්ත ගෘහ භාණ්ඩ තොගයක් ද, 2022 වර්ෂය තුළ කිසිදු අළෙවියක් කර නොතිබුණු රු.7,152,896 ක් වටිනා

ගෘහ භාණ්ඩ අයිතම 32 ක් සහ ඉතා සෙමින් අලෙවි වන රු.3,132,000 ක් වටිනා ගෘහභාණ්ඩ අයිතම 12 ක් ද, 2012 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා නිෂ්පාදනය කරන ලද නමුත් ඔප නොදමන ලද වටිනාකම රු.20,474,207 ක් වූ ගෘහ භාණ්ඩ තොගයක් ද බුස්ස ප්‍රදර්ශනාගාර ගබඩාවේ හා යන්ත්‍රාගාරයේ පැවතුණි.

(ක) Finger joint ගෘහ භාණ්ඩ නිෂ්පාදනය සංස්ථා සේවකයන් යොදවා සිදු කරනු ලැබුව ද, එම සේවකයන්ගේ කාර්යක්ෂමතාව සහ කාර්යසාධනය ඇගයීම සඳහා විධිමත් පාලන ක්‍රමවේදයක් ස්ථාපිත කර නොතිබීමෙන් සිදුවන අකාර්යක්ෂමතාවය මත ඇණවුම් නිසිකලට සම්පූර්ණ කිරීමට නොහැකි වී තිබුණු අතර බෝඩ් 1,050 ක ඇණවුමක් අවලංගු කර තිබුණි. තවද, Finger joints බෝඩ් ආධාරයෙන් නිම කරන ලද ගෘහ භාණ්ඩ අලෙවිය ද ඉතා අවම මට්ටමක පැවතුණි.

(ග) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.7.7, 2.8.5, 2.11.3 සහ 6.3.1(අ) යන මාර්ගොපදේශයන්ට පටහැනිව විධිමත් ප්‍රසම්පාදන කමිටුවක් හා තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත් නොකොට ෆැක්ස් මඟින් මිල ගණන් ලබා ගෙන අවස්ථා 03 කදී බුස්ස නිෂ්පාදනාගාර සංකීර්ණයට රු.1,101,875 ක් වටිනා භාණ්ඩ මිල දී ගෙන තිබුණි.

(ච) බුස්ස නිෂ්පාදනාගාර සංකීර්ණයේ ගෘහ භාණ්ඩ නිෂ්පාදනය කෙටි වැඩ ගිවිසුම් මත බාහිර කොන්ත්‍රාත්කරුවන් මඟින් ඉටුකරවා ගන්නා අතර ඒ වෙනුවෙන් 2013 වර්ෂයේ සිට 2022 මාර්තු දක්වා කාලසීමාව තුළ කොන්ත්‍රාත්කරුවන් 69 දෙනෙකුට රු.10,322,050 ක කොටස් මුදල් ගෙවා තිබුණි. එසේ වුවද, අදාළ කාර්යයන් ගිවිසුම් කාලය තුළ නිමකරවා ගැනීමට කළමණාකරණය අපොහොසත් වීම හේතුවෙන් ඇතැම් කාර්යයන් සඳහා නැවත මිල ගණන් කැඳවීමටත්, සංස්ථා සේවකයන් ලවා ඉටුකරවා ගැනීමටත් සිදුවී තිබීමෙන් අධික කාලයක් හා අමතර පිරිවැයක් දැරීමට සිදු වන බවට නිරීක්ෂණය විය.

(ජ) බුස්ස නිෂ්පාදනාගාරයෙහි හැකියාව සහිත සුදුසු කොන්ත්‍රාත්කරුවන්ට කොන්ත්‍රාත් භාර නොදීම හා නිෂ්පාදනාගාරයේ අවිධිමත් සැලසුම්කරණය හේතුවෙන් වසර 01 ත් වසර 10 කට වැඩි කාලයකත් සිට පවතින කෙරීගෙන යන වැඩවල වටිනාකම රු.21,689,756 ක් වූ අතර කාලීන අවශ්‍යතාවය හඳුනා නොගැනීම හා අලෙවි කටයුතු ප්‍රවර්ධනය නොකිරීම හේතුවෙන් 2022 ජූලි 31 දිනට භාවිතයෙන් තොරව පවතිණ දැව තොගයෙහි වටිනාකම රු.මිලියන 65.5 ක් විය.

(ට) බුස්ස හා අම්පාර නිෂ්පාදනාගාරයන්හි එක්රැස් වන තොග අඩු කිරීම සඳහා දැව අට්ටි ගසා ප්‍රසිද්ධ වෙන්දේසියේ අඩු මිලකට අලෙවි කිරීමට පියවර ගෙන තිබුණු අතර ඒ ආකාරයට 2020 වර්ෂයේ දී රු.1,902,698 ක් වටිනා තොග අට්ටි 49 ක් රු.943,300 කට අලෙවි කිරීමෙන් සංස්ථාවට රු.959,398 ක පාඩුවක් සිදුවී තිබුණු අතර වෙන්දේසි නොවී පවතින

පිරිවැය රු.49,823,171 වටිනා ලොට් 191 ක වෙන්දේසි වටිනාකම රු.21,744,180 ක් වීමෙන් අවම වශයෙන් රු.28,078,991 ක පාඩුවක් සිදුවීමට ඉඩකඩ පවතින බවට ද නිරීක්ෂණය විය.

(ඩ) නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගෘහ භාණ්ඩ ප්‍රදර්ශනාගාරයක් ස්ථාපිත කිරීමේ යෝජනාවකට අනුව නිලධාරීන් දෙදෙනෙකුගෙන් සමන්විත කමිටුවක් මඟින් ශක්‍යතා අධ්‍යනයකින් තොරව රිකිල්ලගස්කඩ නගරය හා එහි ගොඩනැගිල්ලක් සුදුසු බවට කර තිබුණු නිර්දේශ පදනම් කරගෙන රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය නොකර රු.80,000 ක මාසික කුලී පදනමට 2021 මාර්තු සිට ලබාගත් ගොඩනැගිල්ලකට මාස 15ක් සඳහා රු.1,200,000 ක බදු කුලී ගෙවා එම කාලය තුළ රු.9,016,761 ක අලාභයක් ලබමින් පවත්වාගෙන ගොස් 2022 ජුනි 18 දින ප්‍රදර්ශනාගාරය වසා දමා තිබුණි. ප්‍රදර්ශනාගාරයේ ආදායම් හා වියදම් වාර්තා ඉදිරිපත් කර නොතිබීමෙන් මෙම ප්‍රදර්ශනාගාරය අලාභ ලබමින් පවත්වාගෙන යනු ලබන බව කල් ඇතිව හඳුනා ගැනීමට ද නොහැකි වී තිබුණි.

(ණ) වන අපරාධ දැව සම්බන්ධයෙන් ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳව 2018 ඔක්තෝබර් 10 දිනැති අංක 422 දරන අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛය මඟින් ලබා දී ඇති උපදෙස් අනුගමනය නොකර අම්පාර නිෂ්පාදනාගාරයෙහි 2019 වර්ෂයට පෙර සිට එහි පවතින රු.1.219.620 ක් වටිනා ඝන ඩෙසිමීටර් 16,088 ක වන අපරාධ ඉරූ දැව සහ රු.1.932.541 ක් වටිනා ඝන ඩෙසිමීටර් 158,274 ක වන අපරාධ දැව කඳන් තොගයක් ද පැවතුණි.

(ත) අම්පාර දැව ඉරුම්හලේ 2019 සිට 2022 වර්ෂය දක්වා කාලය තුළ පරිවර්තනය කිරීම සඳහා භාවිතයට ගෙන තිබුණු දැව ප්‍රමාණය ඝන ඩෙසිමීටර් 3,512,926 ක් වූ අතර නිමවුම ලෙස ලබා ගත් දැව ප්‍රමාණය ඝන ඩෙසිමීටර් 1,806,397 ක් වුයෙන් දැව පරිවර්තනය කිරීමේ දී සිදු වී ඇති අපතය ඝන ඩෙසිමීටර් 1,706,529 ක් හෙවත් සියයට 49 ක් විය. එම කාලය තුළ ඇතැම් කාර්යයන් සඳහා අවශ්‍යතාව ඉක්මවා සියයට 32 ක් වැඩියෙන් ඝන ඩෙසිමීටර් 454,496 ක දැව ප්‍රමාණයක් නිකුත් කර ඇති බවට ද, ඉරන ලද රු.295,712,614 ක් වටිනා ඝන ඩෙසිමීටර් 3,718,422 ක විශාල දැව තොගයක් කාර්යක්ෂමව භාවිතයට ගැනීමට සුදුසු වැඩපිළිවෙලක් නොතිබීමෙන් ගොඩගැසී ඇති බවට ද නිරීක්ෂණය විය.

(ද) 2018 වර්ෂයට පෙර සිට වැද්දුම් වැඩ නිම කරන ලද නිමවුම් වටිනාකම රු.98,476,655 ක් වූ අර්ධ නිමි භාණ්ඩ ඒකක 6,133 ක් නිම කර මාරුකිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් අම්පාර නිෂ්පාදනාගාරයෙන් ඉදිරි නිෂ්පාදන ගබඩා කිරීමේ ගැටළුවකට මුහුණ දී තිබුණි.

(න) බුස්ස ගෘහ භාණ්ඩ නිෂ්පාදනාගාරයට අවශ්‍ය දැව ඉරීම වෙහෙරාන් යන්ත්‍රය සහ මැක්වුඩ් යන්ත්‍රය මඟින් සිදු කරන අතර එහි දී සියයට 64.2 ක සිට සියයට 47.3 ක් දක්වා ඉහළ

අගයකින් දැව අපතයන් සිදුවන බව නිරීක්ෂණය විය. 2019 සිට 2022 වර්ෂය දක්වා සිදුවී ඇති දැව අපතය සන ඩෙසිමීටර් 857,940 ක් විය.

(ප) ගොමදියගාල 01/22 තේක්ක වැඩබිමෙහි 2017 වර්ෂයේදී සිදු වී තිබුණු අක්‍රමිකතාවක් සම්බන්ධ වෝදනාවට ලක් වූ සේවකයන් සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු නොකිරීම නිසා සහකාර ප්‍රාදේශීය කළමණාකරුවෙකු විසින් සංස්ථාවට සිදු කර තිබුණු රු.50,361 ක අලාභයක් අයකර ගැනීමට නොහැකි වී තිබුණු අතර එම නිලධාරීන්ට උසස්වීම් ලබා දීමට ද කළමනාකාරිත්වය කටයුතු කර තිබුණි.

3. වෙනත් කරුණු

(අ) පුහුණුවීම් සඳහා නිලධාරීන් තෝරා ගැනීමේදී නිශ්චිත ප්‍රතිපත්තියක් අනුගමනය නොකිරීම හේතුවෙන් එකම පිරිසක් පමණක් සෑම වර්ෂයකම විවිධ පුහුණු පාඨමාලා සඳහා සහභාගී වී තිබුණි. ඒ හේතුවෙන් සංස්ථා නිලධාරීන්ගේ දැනුම හා කුසලතා වර්ධන ක්‍රියාවලිය විධිමත්ව සිදු නොවන බව නිරීක්ෂණය විය.

(ආ) සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂයේදී වාහන නඩත්තු වියදම් රු.63,777,998 ක් සහ රු.32,346,175 ක සිල්පර නිෂ්පාදනය සහ අලෙවිය පිළිබඳව තොරතුරු විගණනයට ඉදිරිපත් නොවූ බැවින් ඒවා සතුටුදායක ලෙස විගණනය කිරීමට නොහැකි විය.

(ඇ) ණය පදනම මත ලබාදුන් දැව සහ දැව ආශ්‍රිත ගෘහභාණ්ඩ සඳහා 2022 දෙසැම්බර් 31 දිනට අය විය යුතු මුදල රු.මිලියන 908.87 ක් වූ අතර එයින් වසර 01 ත් 03 ත් අතර හිඟ හිටි ණය රු.මිලියන 430.86 ක් ද, වර්ෂ 04 ක් හා ඊට වැඩි ණය රු. මිලියන 59.85 ක් ද විය. ණය මුදල් ගෙවා නොමැති ආයතන 24 ක් වෙත නැවත නැවතත් ණයට භාණ්ඩ විකිණීම හේතුවෙන් එම ආයතනවලින් අයවිය යුතු ණය මුදල රු.770,799,748 ක් වූ අතර රාජ්‍ය ආයතන සමඟ ගිවිසුම් ගත නොවීම හා සියයට 10 ක ප්‍රමාද ගාස්තු අය නොකිරීම, විධිමත් ලේඛන පවත්වා මාසික අලෙවිය හා අයකර ගැනීමේ ප්‍රගතිය වාර්තා නොකිරීම, පරිගණක දත්ත පද්ධතිය යාවත්කාලීන කර පවත්වා නොතිබීම යනාදිය ණය අය නොවීම කෙරෙහි බලපා ඇති බවට නිරීක්ෂණය විය.

(ඈ) වර්ෂය අවසාන තොග සත්‍යාපනය සඳහා සංස්ථාව විසින් විධිමත් ආකෘති පත්‍රයක් හඳුන්වා දී තිබුණ ද එම ආකෘතියට අනුව වාර්තා ඉදිරිපත් කර නොතිබීම හේතුවෙන් ගණනය කිරීම්වල නිවැරදිතාව සනාථ කරගත නොහැකි විය.

ඩබ්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

වාර්ෂික ගිණුම්

ලාභ අලාභ හා විස්තීරණ ආදායම් ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

	සටහන්	2022 රු.	2021 රු.
පිරිවැටුම	2	4,743,049,736	5,695,663,163
විකුණුම් පිරිවැය	3	(2,452,074,230)	(2,941,981,641)
මෙහෙයුම් මත දළ ලාභය		**2,290,975,506**	**2,753,681,522**
වෙනත් ආදායම්	6		
මෙහෙයුම්	6.3	33,259,919	46,897,556
මෙහෙයුම් නොවන	6.1	14,953,721	26,284,246
මුළු ශුද්ධ ආදායම		**2,339,189,147**	**2,826,863,324**
විකුණුම් හා බෙදාහැරීමේ වියදම්	4	(955,435,355)	(652,350,206)
පරිපාලන වියදම්	5	(1,039,084,313)	(903,637,745)
මූල්‍ය වියදම		(2,844,101)	(2,663,074)
මූල්‍ය ආදායම	6.2	674,160,950	227,943,565
භාණ්ඩාගාර බදුවලට පෙර ශුද්ධ ලාභය		**1,015,986,328**	**1,496,155,864**
වර්ෂය සඳහා ආදායම් බදු	7	(380,105,005)	(259,944,164)
භාණ්ඩාගාරයට ගෙවූ බදු		(320,000,000)	(100,000,000)
වර්ෂය සඳහා ලාභය		**315,881,323**	**1,136,211,699**
වෙනත් විස්තීරණ ආදායම්			
විශ්‍රාමික පාරිතෝෂික අතිරික්ත/ඌණතා	18	347,392,072	156,362,663
වෙනත් විස්තීරණ ආදායම්		**347,392,072**	**156,362,663**
මුළු විස්තීරණ ආදායම්		**663,273,395**	**1,292,574,362**

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

	සටහන්	2022 රු.	2021 රු.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ පිරියත හා උපකරණ	8	1,309,685,438	1,475,219,895
භාවිත හිමිකම් වත්කම් (සෘධඹ)	10		370,021
අස්පෘශ්‍ය වත්කම්	9	25,493	213,922
ජීව විද්‍යාත්මක වත්කම්	11	7,735,659	7,735,659
භාණ්ඩාගාර තැන්පත්		2,966,000	2,966,000
සේවක ඇප තැන්පත්		85,468,421	78,322,465
ආයෝජන	12.1	973,686,078	580,091,164
පෙර ගෙවුම් සේවක ප්‍රතිලාභ		-	-
කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ		11,944,333	14,052,217
මුළු ජංගම වත්කම්		**2,391,511,422**	**2,158,971,343**
ජංගම වත්කම්			
වෙළඳ තොග	13	1,656,987,490	1,194,553,641
වෙළඳ සහ වෙනත් ණයගැතියෝ	14	1,742,578,098	1,175,568,840
ස්ථිර තැන්පතුවල ආයෝජන	12.2	3,706,248,722	4,434,421,546
මුදල් හා බැංකු ශේෂය	15	90,961,043	244,303,348
මුළු ජංගම වත්කම්		**7,196,775,353**	**7,048,847,375**
මුළු වත්කම්		**9,588,286,776**	**9,207,818,718**
ස්කන්ධය හා බැරකම්			
ස්කන්ධය හා සංචිත			
අනුමත ප්‍රාග්ධනය		**75,000,000**	**75,000,000**
දායක ප්‍රාග්ධනය	16	41,503,668	41,503,668
අයභාර සංචිත		7,129,558,552	6,282,683,017
		7,171,062,220	**6,324,186,685**
සේවක ණය වක්‍රීය අරමුදල	17	494,093,306	433,020,533
මුළු ස්කන්ධය		**7,665,155,526**	**6,757,207,218**
ජංගම නොවන බැරකම්			
විශ්‍රාම පාරිතෝෂික අරමුදල	18	253,071,791	508,978,707
සේවක ඇප තැන්පත්		85,468,421	78,322,465
මෙහෙයුම් කල්බදු		-	452,453
පොළී දරන වගකීම්	22	7,677,248	12,720,535
විලම්භිත බදු වගකීම්	7.2	153,845,554	58,726,137
මුළු ජංගම නොවන බැරකම්		**500,063,014**	**659,200,298**
ජංගම බැරකම්			
ආදායම් බදු	19	109,777,488	152,984,309
පොළී දරන වගකීම්	22	5,043,288	4,947,196
ණයහිමියෝ සහ උපචිත වියදම්	20	1,308,247,460	1,633,479,696
මුළු ජංගම බැරකම්		**1,423,068,236**	**1,791,411,202**
මුළු බැරකම්		**1,923,131,250**	**2,450,611,500**
මුළු ස්කන්ධය හා බැරකම්		**9,588,286,776**	**9,207,818,718**

රාජ්‍ය දැව සංස්ථාවේ ක්‍රියාකාරකම් සම්බන්ධ මෙම ප්‍රකාශනය 1971 අංක 38 දරණ මුදල් පනතේ විධි විධානවලට අනුකූලව ඉදිරිපත් කරනු ලැබේ.

සාමාන්‍යාධිකාරී - ප්‍ර වි නි
රාජ්‍ය දැව සංස්ථාව

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්)
රාජ්‍ය දැව සංස්ථාව

පිටු අංක 73 සිට 80 දක්වා වන ගිණුම් ප්‍රතිපත්ති සහ පිටු අංක 81 සිට 91 දක්වා වන ගිණුම් සටහන් මෙම ගිණුම් ප්‍රකාශවල කොටසකි. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂක මණ්ඩලය සතු වේ. මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අනුමත කර සහ අධ්‍යක්ෂක මණ්ඩලය වෙනුවෙන් අත්සන් තබන ලදී.

සභාපති
රාජ්‍ය දැව සංස්ථාව

අධ්‍යක්ෂ

දිනය: 2023.03.13

ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශනය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

	දායක ප්‍රාග්ධනය රු.	සේවක ණය චක්‍රීය අරමුදල රු.	රඳවාගත් ලාභ රු.	ප්‍රත්‍යාගණනය සංචිතය රු.	එකතුව රු.
2021 ජනවාරි 01 දිනට ශේෂය	**41,503,668**	**367,492,061**	**4,602,530,506**	**453,106,621**	**5,464,632,856**
වර්ෂය සඳහා ලාභය		50,000,000	(50,000,000)		
වර්ෂය තුළ අරමුදල් මාරුකිරීම්			1,136,211,699		**1,136,211,699**
වර්ෂය සඳහා සේවක ණය පොළිය		15,528,472	(15,528,472)		**-**
වෙනත් විස්තීරණ ආදායම්			156,362,663		**156,362,663**
2022 ජනවාරි 01 දිනට ශේෂය	**41,503,668**	**433,020,533**	**5,829,576,396**	**453,106,621**	**6,757,207,218**
වර්ෂය තුළ මුදල් මාරුකිරීම්		50,000,000	(50,000,000)		**-**
					-
තොග නශ්‍යවීම් සඳහා හුවමාරු			244,674,912		**244,674,912**
					-
වර්ෂය සඳහා ලාභය			315,881,323		**315,881,323**
වර්ෂය සඳහා සේවක ණයපොළිය ගැලපුම		11,072,773	(11,072,773)		
ප්‍රත්‍යාගණන ශේෂයන් හුවමාරු කිරීම්			3,700,000	(3,700,000)	
වෙනත් විස්තීරණ ආදායම්		-	347,392,072		**347,392,072**
2022 දෙසැම්බර් 31 දිනට ශේෂය	**41,503,668**	**494,093,306**	**6,680,151,931**	**449,406,621**	**7,665,155,526**

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

	2022 රු.	2021 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් ජනනය වූ මුදල් ප්‍රවාහය		
ගනුදෙනුකරුවන්ගෙන් ලැබුණු මුදල්	5,107,850,448	5,722,646,799
සැපයුම්කරුවන්ට හා සේවකයන්ට ගෙවූ මුදල්	(5,114,966,968)	(2,985,491,312)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනනය වූ මුදල්	**(7,116,520)**	**2,737,155,487**
ආදායම් බදු	(328,192,410)	(206,222,600)
භාණ්ඩාගාරයට ගෙවූ විශේෂ බදු	(320,000,000)	(100,000,000)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	**(655,308,930)**	**2,430,932,887**
ජීව විද්‍යාත්මක වත්කම් සංවර්ධනය		-
ආයෝජන	334,577,909	(2,522,562,785)
ආයෝජනවලින් ලද ආදායම	244,506,151	232,435,163
වත්කම් විකිණීමෙන් ලද මුදල්	10,718,802	15,465,252
කෙරීගෙන යන වැඩ	(4,526,949)	5,561,221
සේවක ණය නිකුත් කිරීම	(159,157,899)	
සේවක ණය අයකිරීම	130,930,240	
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය	**509,050,135**	**(2,395,647,859)**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය		
පොළී දරන ණය හා ණය ලබාගැනීම් වෙතින් මුදල්	(7,083,509)	(12,118,500)
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය	**(7,083,509)**	**(12,118,500)**
මුදල් හා මුදල් සමාන වත්කම්වල ශුද්ධ අගය වැඩිවීම/අඩුවීම	**(153,342,305)**	**23,166,528**
වර්ෂය ආරම්භයේ දී මුදල් හා මුදල් සමාන වත්කම් (සටහන් 15)	**244,303,348**	**221,136,821**
වර්ෂ අවසානයේ දී මුදල් හා මුදල් සමාන වත්කම් (සටහන 15)	**90,961,043**	**244,303,348**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

1.1 වාර්තාකරණ ආයතනය

1.1.1 සංස්ථාපනය
1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනත යටතේ, 1968 අප්‍රේල් මාසයේ දී රාජ්‍ය දැව සංස්ථාව සංස්ථාවක් ලෙස ස්ථාපනය කරන ලදී.

1.1.2 මූල්‍ය ප්‍රකාශන සඳහා අනුමැතිය ලද දිනය
2023 මාර්තු මස 13 වන දින අධ්‍යක්ෂ මණ්ඩලයේ දී සම්මත කරගන්නා ලද අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවට අනුකූලව 2022 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමට අනුමැතිය ලබා දී ඇත.

1.1.3 සේවක සංඛ්‍යාව
2022 දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ සේවක සංඛ්‍යාව 1,500 කි. (2021 - 1,606 කි.)

1.1.4 මූල්‍ය ප්‍රකාශන සඳහා වගකීම
මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ හා නිකුත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතුය.

1.2 ඉදිරිපත් කිරීමේ පදනම

1.2.1 අනුකූලතාවය පිළිබඳ ප්‍රකාශය
ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මගින් ප්‍රකාශ කරන ලද නිර්දේශිත රීතීන්වලට හා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (ලංකා ගිණුම්කරණ ප්‍රමිත සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත) වලට අනුකූලව සංස්ථාවේ 2022 දෙසැම්බර් 31 දිනට හා එම කාලපරිච්ඡේදයෙන් අවසන් වසර සඳහා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, විස්තීරණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සමඟ ගිණුම් සඳහා සටහන් පිළියෙළ කර ඇත.

1.2.2 අගය කිරීමේ පදනම
ලැබිය යුතු සේවක ණය සහ වෙළෙඳ ණයගැතියන් සාධාරණ අගයට ගිණුම්වල පෙන්වා ඇති අතර, ඒ හැර අනෙකුත් අගයන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇත්තේ ඓතිහාසික පිරිවැය පදනම් කරගෙනය.

1.2.3 භාවිතා වන හා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන මුදල් ඒකකය
මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කර ඇති අතර, එය සංස්ථාවේ ගනුදෙනු කරන මුදල් ඒකකය වේ. විශේෂයෙන් සඳහන් කොට නොමැති නම්, සියලුම මූල්‍ය තොරතුරු ආසන්නතම රුපියල දක්වා වැටයීම් කර ඉදිරිපත් කර ඇත.

1.2.4 ඇස්තමේන්තු හා නිගමන
ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී කළමනාකාරිත්වයට නොයෙකුත් ඇස්තමේන්තු, නිගමන හා උපකල්පන පදනම් කරගැනීමට සිදුවන අතර, ඒවා ගිණුම්කරණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදී හා වාර්තා කරන වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම්වල අගයන් කෙරෙහි බලපෑම් ඇති කරවයි. ඇස්තමේන්තු සහ මූලික උපකල්පන

අතීත අත්දැකීම් සහ යම් අවස්ථාවන් යටතේ සාධාරණයැයි විශ්වාස කරන විවිධ වෙනත් කරුණු මත පදනම් වී ඇත. සත්‍ය ප්‍රතිඵලය, ඇස්තමේන්තු නිගමනයන් හා තීරණවලට වඩා වෙනස් විය හැකියි ඇස්තමේන්තු හා උපකල්පන නිරතුරුවම සමාලෝචනය කරනු ලැබේ. සංශෝධනය කරනු ලබන ගණකාධිකරණ ඇස්තමේන්තු එම ඇස්තමේන්තු සංශෝධනය කරන ලද කාලපරිච්ඡේදයට හා ඒවා බලපානු ලබන ඉදිරි කාලපරිච්ඡේද සඳහා ගළපනු ලැබේ.

1.2.5 විදේශ විනිමය ගනුදෙනු

විදේශ විනිමය ගනුදෙනු ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්ථනය කරනුයේ ගනුදෙනු සිදුවූ දිනට පැවති විනිමය වටිනාකම අනුව වේ.

1.2.6 බදුකරණය

ගිණුම් ප්‍රකාශනවල වාර්තා වන ආදායම් සහ වියදම් පදනම් කරගෙන 2006 අංක 10 දරන හා 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන සහ පසුකාලීන සංශෝධනවලට අනුකූලව ගණනය කිරීමෙන් පසුව ආදායම් බදු සඳහා වෙන්කිරීම් කර ඇත.

1.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති

පහත සඳහන් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති අදාල ගිණුම් කාලපරිච්ඡේදය තුළදී අඛණ්ඩව භාවිතා කොට ඇත.

1.3.1 වත්කම් සහ වටිනාකම ගණනය කිරීම

1.3.1.1 දේපල පිරියත හා උපකරණ

1.3.1.1.1 හඳුනාගැනීමේ පදනම

දේපල, පිරියත හා උපකරණ පිරිවැයෙන් සමුච්චිත ක්ෂය සහ සමූච්චිත හානිවූ වටිනාකම අඩුකර අගය කර ඇත. (ඉඩම් හා ගොඩනැඟිලි සම්බන්ධයෙන් සාධාරණ අගය මත) වත්කම මිලදීගැනීමේදී එය සෘජුව ආරෝපිත වියදම් දේපල, පිරියත හා උපකරණවල වෙනම අයිතම ලෙස ගිණුම්ගත කරයි. සියලු දේපල, පිරියත හා උපකරණ පළමුව පිරිවැයට හඳුනාගනී.

1.3.1.1.2 ප්‍රත්‍යාගණන ආකෘතිය

ප්‍රත්‍යාගණන ක්‍රියාවලිය විධිමත් භාවයකින් යුතුව සිදුකරන අතර, එය වාර්තා කරන ගිණුම්කරණ වර්ෂය අවසානයේ සාධාරණ අගය මත පදනම්ව සිදුකරනු ලබන බැවින් ධාරණ අගය ප්‍රමාණාත්මක වශයෙන් සාධාරණ අගයට වඩා වෙනස් නොවේ.

මෝටර් රථ (යතුරුපැදි) ප්‍රත්‍යාගණනයේදී ඒවායෙහි ධාරණ අගය ප්‍රත්‍යාගනිත අගයන් සමඟ අඛණ්ඩව සකස් කෙරේ එදිනට පවතින සමුච්චිත ක්ෂය අගය දළ ධාරණ අගය සහ හානිකරන අලාභ ගැලපීමෙන් පසු ධාරණ අගය යන දෙකෙහි වෙනසට සමාන වන පරිදි ගලපනු ලබයි.

ප්‍රත්‍යාගණනයේ ප්‍රතිඵලයක් ලෙස වත්කම්වල ධාරණ අගයෙහි වැඩිවීමක් වෙනත් විස්තීරණ ආදායම් යටතේ හඳුනාගන්නා අතර, එය හිමිකමෙහි ප්‍රත්‍යාගණන සංචිතයට එකතු කරනු ලබයි. පෙර සිදු කරන ලද ප්‍රත්‍යාගණනයකදී ලාභයෙහි හෝ අලාභයෙහි සටහන් කරන ලද එම වත්කමෙහි ප්‍රත්‍යාගණිත අගය අඩුවීමත්, ආපසු හැරවීමට ඇති හැකියාවේ ප්‍රමාණය මත මෙම වැඩිවීම ලාභ/අලාභයෙහි හඳුනාගනු ලබයි.

ප්‍රත්‍යාගණනයේ ප්‍රතිඵලයක් ලෙස වත්කම්වල ධාරන අගයෙහි අඩුවීමක් ප්‍රවර්තන වර්ෂයේ ලාභයෙහි/අලාභයෙහි හඳුනාගැනේ. මෙම අඩුවීම, එම වත්කමට අදාල ප්‍රත්‍යාගණන සංචිතයෙහි පවතින බැර ශේෂයෙහි පරාසය මත වෙනත් විස්තීරණ ආදායම් ලෙස හඳුනාගනු ලබයි.

මෝටර් රථ වත්කම හඳුනාගැනීමේදී ඒ හා සම්බන්ධ ප්‍රත්‍යාගණන සංචිතය සෘජුවම රඳවාගත් ආදායමට මාරු කෙරේ.

1.3.1.1.3 වත්කම් විකිණීමෙන් ඇති වූ ලාභ/අලාභ

වත්කම් විකිණීමෙන් ඇතිවන ලාභයක් හෝ අලාභයක් (ශුද්ධ විකිණීමේ දී ලැබීම් හා වත්කමේ ධාරණ වටිනාකමේ වෙනස ලෙස ගණනය කරන ලද) වත්කම විකුණනු ලබන වර්ෂයේ ආදායම් ප්‍රකාශනයේ වෙනත් මෙහෙයුම් ආදායම්/වියදම් යටතේ දක්වනු ලබයි.

1.3.1.1.4 පසු පිරිවැය

ස්ථාවර ස්වභාවයෙන් ව්‍යාපාරය පවත්වාගෙන යාමට හෝ ව්‍යාපාරයේ ඉපැයුම් ධාරිතාව වර්ධනය කිරීම සඳහා වැයවන පසු වියදම්, ප්‍රාග්ධන වියදම් ලෙස සලකනු ලබන අතර, එවැනි වියදම් වත්කමේ ඉදිරියට ගෙනයනු ලබන වටිනාකමෙන් හඳුනාගැනේ. එමෙන්ම දේපල හා උපකරණවල එදිනෙදා නඩත්තු පිරිවැය ආදායම් ප්‍රකාශනයෙන් යෙදවූ වටිනාකම් ලෙස හඳුනාගැනේ.

1.3.1.1.5 ඉවත් කිරීම්

දේපල, පිරියත හා උපකරණ ඉවත් කිරීමේදී හෝ ඒවා පාවිච්චි කිරීම තුළින් ඉදිරි ප්‍රතිලාභයක් අත්නොවන විට ඒවායේ ඉදිරියට ගෙනඑන ලද වටිනාකම ගිණුම්වලින් ඉවත් කරනු ලැබේ. මෙසේ වත්කම් ඉවත් කිරීමේදී ජනනය වන ලාභ හෝ පාඩු විස්තීරණ ආදායම් ප්‍රකාශනයට ගළපනු ලබන අතර, ලාභ ආදායමක් ලෙස සළකනු නොලැබේ.

1.3.1.1.6 ක්ෂයවීම

දේපල, පිරියත හා උපකරණවල සියලුම අංගයන් එහි ඇස්තමේන්තුගත ඵලදායී ජීව කාලය පුරා සරළ රේඛීය පදනම මත විස්තීරණ ආදායම් ප්‍රකාශනයට කපාහරිනු ලබයි. ඉඩම් ක්ෂය නොකරනු ලබන අතර, අදාල ක්ෂය කිරීම් අනුපාත පහත පරිදි වේ.

ස්ථිර ගොඩනැඟිලි	2.5%
අර්ධ ස්ථිර ගොඩනැඟිලි	30%
යන්ත්‍රෝපකරණ	10%
වාහන	20%
මාර්ග හා දුම්රිය මාර්ග	5%
බදු ඉඩම්	5%
මාර්ග ඉදිකිරීම	10%
ගෘහභාණ්ඩ හා සවිකිරීම්	15%
කාර්යාල උපකරණ	15%
විවිධ වත්කම්	20%
පරිගණක	20%
විදුලි උපකරණ	10%
මෙවලම් හා උපකරණ	20%
ඉඩම් සංවර්ධන	10%

1.3.1.2 නොනිමි වැඩ

ගිණුම් වර්ෂය තුළදී සම්පූර්ණ කරගත නොහැකි වූ ප්‍රාග්ධන ආයෝජනවලට අදාල ප්‍රාග්ධන වියදම් අදාල වර්ෂයේ නොනිමි වැඩ යටතේ දක්වා ඇති අතර, වැඩ සම්පූර්ණ වී පරිහරණයට සුදුසු තත්වයට පැමිණි පසු ඒවා දේපල පිරියත හා උපකරණ යටතේ දක්වනු ලැබේ.

1.3.1.3 අස්පෘශ්‍ය වත්කම්

අස්පෘශ්‍ය වත්කම්වලට පරිසණක මෘදුකාංග මිලදීගැනීම සඳහා වැය වූ පිරිවැය ඇතුළත් වේ. එමෙන්ම මෙවැනි අස්පෘශ්‍ය වත්කම් හඳුනාගනු ලබන්නේ එහි පිරිවැය විශ්වාසදායි ලෙස මැනිය හැකිනම් සහ එහි අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ සංස්ථාව වෙත ලැබීමේ ප්‍රවණතාවයක් පවතී නම් පමණි. අස්පෘශ්‍ය වත්කම් පිරිවැයෙන්, සමුච්චිත ක්‍රමක්ෂය සහ සමුච්චිත හානි වූ වටිනාකම් අඩුකර වටිනාකම අගය කර ඇත. විශේෂිත වත්කමකට අදාලව පසුව දරනු ලබන වියදම් ප්‍රාග්ධනීත කරනු ලබන්නේ එම වියදම් දැරීම හේතුවෙන් අදාල වත්කමෙහි අනාගත ආර්ථික ප්‍රතිලාභ වර්ධනයට එය පිටුවහලක් වන්නේ නම් පමණි. ක්‍රමක්ෂය සරල රේඛීය පදනම මත ඇස්තමේන්තු ගත පස් අවුරුදු ජීව කාලය පුරා කපාහරිනු ලබයි.

1.3.1.4 ජීව විද්‍යාත්මක වත්කම්

''ජීව විද්‍යාත්මක වත්කම්'' පරිණත ජීව විද්‍යාත්මක වත්කම් සහ අපරිණත ජීව විද්‍යාත්මක වත්කම් ගණයට අයත් වන්නේ ඵලදාව නෙලාගන්නා මට්ටමට පත්ව ඇති හෝ නිරන්තර ඵලදාව ලැබෙන තත්වයට පත්ව ඇති අයිතමයන් ය. අපරිණත ජීව විද්‍යාත්මක වත්කම් ලෙස සැලකෙන්නේ ඵලදාව නෙලාගන්නා තත්වයට පත් නොවූ අයිතමයන් ය.

ජීව විද්‍යාත්මක වත්කම් ඵලදරන ජීව විද්‍යාත්මක වත්කම් සහ පරිභෝජනමය ජීව විද්‍යාත්මක වත්කම් ලෙස වර්ගීකරණය කෙරෙන අතර ඵලදරන ජීව විද්‍යාත්මක වත්කම් විකිණීම සඳහා හෝ නෙලාගැනීම සඳහා තබා නොගන්නා ඒවා වන අතර, එම අයිතමයන් කෘෂිකාර්මික නිෂ්පාදනයන් ලබාගැනීමේ පරමාර්ථයෙන් සංවර්ධනය කරනු ලැබේ. පරිභෝජනමය ජීව විද්‍යාත්මක වත්කම් ගණයට දැව ලබාගැනීමට පාලනය කරනු ලබන ගස් මෙන්ම ජීව විද්‍යාත්මක වත්කම්වලින් ඵලදාව නෙලාගන්නා ලද කෘෂිකාර්මික නිෂ්පාදන මෙන්ම ජීව විද්‍යාත්මක වත්කම් වශයෙන් විකුණනු ලබන අයිතමයන් අයත්වේ. අතීත සිද්ධියක ප්‍රතිඵලයක් සේ ආයතනය ඒවා වර්තමානයේ දී පාලනය කරනු ලබන විට හා එම අයිතමයන් සමඟ බැඳුනු අනාගත ආර්ථික ප්‍රතිලාභයන් ව්‍යාපාරය තුළට ජනනයවීම භව්‍ය වන්නේ නම් හා ඒවායේ පිරිවැය හෝ සාධාරණ අගය විශ්වසනීය පරිදි මැනිය හැකිවන විට ජීව විද්‍යාත්මක වත්කම් ආයතනය විසින් හඳුනාගනී. දැව ලබාගැනීමට පාලනය කරන ගස් මුල්වරට හඳුනාගන්නා අතර, සෑම වාර්තාකරණ කාලච්ඡේදයක් අවසානයේදීම ශ්‍රී.ල.ගි.ප්‍ර 41 ප්‍රකාරව ඒවා සාධාරණ අගයෙන් විකිණීම සඳහා යන පිරිවැය අඩු කළ පසු ලැබෙන අගයට නිරූපණය කෙරේ.

අපගේ ගණනය කිරීම්වලට අනුව තේක්ක ගසක් පරිණතවීමට රෝපණය කළ දින සිට අවුරුදු 35ක කාලයක් ගත වන බවත්, එම ගසේ විද්‍යාත්මක පරිනාමය සිදුවීමට අවුරුදු 10 ක කාලයක් ගත වන බව සඳහන් කළ හැක. ජීව විද්‍යාත්මක පරිනාමය සිදුවන කාලය අතරතුර දැරීමට සිදුවන පිරිවැයත්, එහි සාධාරණ අගයත් එම කාලපරිච්ඡේදය තුළ සමාන වන බව උපකල්පනය කර ඇත.

1.3.1.5 මූල්‍ය උපකරණ

1.3.1.5.1 ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම්

සංස්ථාව විසින් පළමුව ණය මුදල, ලැබිය යුතු මුදල් හා තැන්පතු එළඹි දිනය මත පදනම් ව හඳුනාගැනීම සිදුකරනු ලබයි. අනෙකුත් සියලුම මූල්‍ය වත්කම් (ලාභ හා අලාභ හරහා සාධාරණ අගය මත නම් කරන ලද වත්කම් ආඥාව) සංස්ථාව කොන්ත්‍රාත් විධිවිධානවලට අදාල පාර්ශවයක් බවට පත්වූ ගණුදෙනු සිදුවූ දිනය මත පදනම් ව හඳුනාගැනීම් සිදුකරනු ලබයි. වත්කම් කල්පිරීමේදී මූල්‍ය ප්‍රවාහ සඳහා ඇති ගිවිසුම්ගත හිමිකම් මත සංස්ථාව වත්කම් නැවත හඳුනාගැනීම හෝ මූල්‍ය වත්කම් ගනුදෙනුවලදී වත්කමට අදාල ගිවිසුම්ගත මූල්‍ය ප්‍රවාහ ලැබීමට ඇති අයිතිය සමඟ සැළකිය යුතු සියලුම අවදානම් මාරු කරනු ලබයි.

1.3.1.5.1.1 ණයට දුන් සහ අයවිය යුතු වත්කම්

ස්ථිර හෝ තීරණය කළ හැකි ගෙවීම් සහිත ක්‍රියාකාරී වෙළෙඳපොළෙන් උපුටාගත නොහැකි මූල්‍ය වත්කම් ණය හා ලැබීම් වේ. මෙම වත්කම් සාධාරණ අගයට එයට අදාල ඍජු වියදම් එකතු කිරීමෙන් පසු ලැබෙන අගය මත මූලික හඳුනාගැනීම සිදුකරනු ලබයි. මූලික හඳුනාගැනීමෙන් පසුව ණය හානිකරණ අලාභ ඉවත් කිරීමෙන් පසුව ඵලදායී පොළී ක්‍රමය යොදාගනිමින් එම වත්කම් නැවත හඳුනාගැනීම සිදුකරනු ලබයි. ණය හා ලැබීම් වෙළෙඳ හා වෙළෙඳ නොවන ලැබීම්වලින් සමන්විත වන අතර, සේවක ණය ද ඇතුළත් වේ. මුදල් හා මුදල් සමාන වත්කම් මුදල් ශේෂයන්ගෙන් හා ඒක්ෂණ තැන්පතුවලින් සමන්විත වන අතර, ඒක්ෂණ තැන්පතු ඇතුළත් කරනු ලබන්නේ මුදල් ප්‍රවාහ ප්‍රකාශ අරමුණ සඳහාය.

1.3.1.6 ආයෝජන

1.3.1.6.1 ස්ථිර තැන්පතු ආයෝජන පිරිවැය මත සඳහන් කර ඇත

1.3.1.6.2 දිගුකාලීන ආයෝජන පිරිවැය මත සඳහන් කර ඇත.

1.3.1.6.3 රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවෙහි ආයෝජන

1.3.1.6.4 අපහායනය

මූල්‍ය වත්කමක අගය අඩුවන බවට විෂය මූලික සාක්ෂි ඇතිදැයි එක් එක් වාර්තාකරණ දිනක දී ඇගයීමකට ලක්කිරීම සිදුකොට එසේ අගය අඩුවීමෙන් දැරීමට සිදුවන අලාභය ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ.

1.3.1.7 වෙළෙඳ තොග

වෙළෙඳ තොග අගයකරනු ලැබ ඇත්තේ පිරිවැය හෝ ඇස්තමේන්තුගත ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට ය. පරිත්‍යාග දෑව තොග ද, අගය කොට ඇත්තේ පිරිවැය (තොග වර්තමාන ස්ථානයට සහ වර්තමාන තත්වයට ගෙන ඒම සඳහා දරන ලද පිරිවැය) හෝ ඇස්තමේන්තු ගත ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට ය. පිරිවැය නිගමනය කරනු ලබන්නේ ප්‍රථමයෙන් ලැබීම්, ප්‍රථමයෙන් නිකුත් කරන පදනමට වන අතර පිරිවැයට, බඩුතොග ප්‍රවර්තන තත්වයට හා ස්ථානයට ගෙනඒම

සඳහා දරන ලද සියලු වියදම් ඇතුළත්වය. නිෂ්පාදන සම්බන්ධයෙන් මේ වනවිටදී පිරිවැයට සියලු සෘජු වියදම් ද සාමාන්‍ය ක්‍රියාකාරී මට්ටම මත පදනම් වන නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය ද ඇතුළත් ය. යල්පැනගිය, සෙමින් චලනය වන හා දෝෂ සහිත තොග වෙනුවෙන් රු.244,674,912/- ක තොග නශ්‍යවීම් සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම, ආදායම් සංචිත වෙත 2023 වර්ෂයේ මාරු කර ඇත.

1.3.2 වගකීම් හා ප්‍රතිපාදන

මූල්‍ය තත්ව ප්‍රකාශනයේ ජංගම වගකීම් යටතේ ගැනෙනුයේ ඉල්ලූ වහා ගෙවිය යුතු ගෙවීම් හෝ මූල්‍ය තත්ව ප්‍රකාශන දින සිට වසරක් තුළ ගෙවිය යුතු ගෙවීම්ය. ජංගම නොවන වගකීම් ලෙස ගැනෙනුයේ මූල්‍ය තත්ව ප්‍රකාශන දින සිට වසරකට වැඩිකාලයක් තුළ ගෙවිය යුතු ගෙවීම් ය. මූල්‍ය ප්‍රකාශනවල සියලුම හඳුනාගෙන ඇති වගකීම් ගිණුම්ගත කර ඇත.

1.3.2.1 වෙළෙඳ හා අනෙකුත් ගෙවිය යුතු වගකීම්

වෙළෙඳ හා අනෙකුත් කටයුතු සඳහා ගෙවීම් අදාල පිරිවැය අනුව සඳහන් කර ඇත.

1.3.2.2 විශ්‍රාම පාරිතෝෂිකය

1983 අංක 12 දරන විශ්‍රාම පාරිතෝෂික පනත අනුව අඛන්ඩව වර්ෂ 05කට වඩා වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සේවකයින් විශ්‍රාම පාරිතෝෂික සඳහා හිමිකම් ලබයි. කෙසේ වෙතත් සියලුම සංස්ථා සේවකයින් වෙනුවෙන් වර්ෂ 2022 දෙසැම්බර් 31 දිනට අවසන් කර ඇති සේවා කාලය හා අවසන්වරට ලැබූ වැටුප පදනම් කරගෙන සේවක විශ්‍රාම පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන වෙන්කර ඇත.

1.3.2.3 අසම්භාව්‍ය වත්කම් හා වගකීම් සඳහා වෙන්කිරීම්

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස වර්තමානයේ විශ්වාසනීයව මැනිය හැකි නීතිමය හෝ සාධාරණීකරණය කළ හැකි වගකීමක් පවතී නම් හා එම වගකීම ජනිතවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ගලායෑමයක් නියත වශයෙන්ම සිදුවේ නම් පමණක් සංස්ථාව මගින් ප්‍රතිපාදන වෙන්කරනු ලබයි.

මුදලින් මැනිය හැකි සියලුම වගකීම් සඳහා ප්‍රතිපාදන සලසා ඇති අතර, අනෙකුත් වගකීම් හෙළිදරව් කර ඇත.

බගවන්තලාව චැපල්ටන් වාණිජ තුනීකිරීම් බිම් කට්ටියේ අනවසර හෙළීම් නිසා රජයට පාඩු සිදුවූ බව දන්වන ලද අතර, පරීක්ෂණවලදී හෙළිදරව් වූ සමහර කරුණු හේතුවෙන් තවමත් නිශ්චිත නිගමනයකට එළඹිය නොහැකි බැවින් සංස්ථාවේ නිලධාරින් සමග එක්ව එම කරුණ සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්විය යුතු බවට වනසංරක්ෂණ ජෙනරාල් විසින් තීරණය කර ඇත. තවදුරටත් දැව සංස්ථාවට එරෙහිව පහත නඩු ගොනුකර ඇත.

නඩු අංකය: 1225/එම්(රු.1,000,000), නඩු අංකය: 4/එස්පීඑල් (රු.500,000),
නඩු අංකය: 15404/එම්(රු.1,578,908), නඩු අංකය: 11651/එම්ආර් (රු.1,250,000),
නඩු අංකය: 5897/එම්(රු.600,000), නඩු අංකය: 3377/එම් (රු.1,000,000),
නඩු අංකය: 55857 (මහේස්ත්‍රාත් අධිකරණය තෙල්දෙණිය)

තවදුරටත් දැව සංස්ථාව විසින් පහත නඩුව ගොනුකර ඇත.
නඩු අංකය: 38804 (රු.2,500,000), නඩු අංකය: 7036 (කොළඹ මහේස්ත්‍රාත් අධිකරණය)

නඩු අංකය: 5271/එම් (රු.294,275), නඩු අංකය: ඒ/46/2021, නඩු අංකය: ඒ/31/2022, නඩු අංකය: එල්ටී/44/798/2022, නඩු අංකය: එල්ටී/44/800/2022,නඩු අංකය: එම්/28211 (රු.300,000)
නඩු අංකය: එස්සී/එච්සී/එල්ඒ/35/2014, නඩු අංකය: එස්සී/සීඑච්/එල්ඒ/36/2014

ලංකා බැංකුවේ ස්ථාවර තැන්පතු ගිණුම් අංක. 82509320, 823589, 88980062 සහ 88980012 ට එරෙහිව බැංකු ඇපකරයන් නිකුත් කර ඇත.

1.3.3 ආදායම් හඳුනාගැනීම

ආදායම් හඳුනාගනු ලබන්නේ එමගින් සංස්ථාව වෙත ආර්ථික ප්‍රතිලාභ ලැබිය හැකි හා එය විශ්වාසදායී ලෙස මැනිය හැකි විටදීය. දැව විකිණීමෙන් ලද ආදායම ගණනය කර ඇත්තේ දැව විකිණීමෙන් ලැබුණු හෝ ලැබිය යුතු මුදල, වෙළෙඳ වට්ටම් සහ ප්‍රමාණ සඳහා දෙනු ලබන සහන ආදිය සැළකිල්ලට යොමුකිරීමෙන් සාධාරණ වටිනාකම් පදනමට ය. රාජ්‍ය දැව සංස්ථාවේ සහ වනසංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සේවකයින් හට 25% ක සහනදායී මිලක් යටතේ දැව නිකුත් කරන අතර, එම වියදම් සුභසාධක පහසුකම් වැය ශීර්ෂය යටතේ ගිණුම්ගත කර ඇත.

1.3.3.1 විකුණුම් ආදායම

භාණ්ඩ විකුණුම් ආදායම ලෙස පිළිගනු ලබන්නේ එම භාණ්ඩවල හිමිකාරීත්වය, අවදානම් සහ ප්‍රතිලාභ භාණ්ඩ මිලදීගත් තැනැත්තා වෙත පතැවරුණු අවස්ථාවේදීය. එනම්, භාණ්ඩ බෙදාහැරීමෙන් පසුව විකුණුම් ආදායමක් ලෙස සලකනු ලැබේ.

1.3.3.2 පොළී ආදායම

උපචිත පදනම යටතේ පොළී ආදායම ගණනය කෙරේ.

1.3.4 වියදම් හඳුනාගැනීම

වර්ෂය තුළ ලබා ඇති ලාභය ගණන් බැලීමේදී වසර තුළ ව්‍යාපාර කටයුතු කරගෙන යාම සඳහා දරන ලද සියලුම වියදම් ආදායමෙන් අඩුකර ඇත. අළුත්වැඩියා සහ නවීකරණයට අදාල වියදම් එය දැරූ වර්ෂයේ විස්තීරණ ආදායම් ප්‍රකාශනයට හරකර ඇත.

1.3.4.1 ආදායම් බදු

ප්‍රවර්තන හා විලම්භීත බදු වලින් ආදායම් බදු සමන්විත වේ. ස්කන්ධයෙන් හෝ වෙනත් විස්තීරණ ආදායම් තුළින් සෘජුව හඳුනාගන්නා අයිතමවලට අදාල ප්‍රමාණය හැර ප්‍රවර්තන හා විලම්භීත බදු වියදම් විස්තීරණ ආදායම් ප්‍රකාශනය මගින් හඳුනාගනී.

වාර්තා කරන දිනට බලපවත්වන බදු අනුපාත හා පූර්ව වර්ෂය වෙනුවෙන් කරන ලද වෙන්කිරීම් උපයෝගී කරගෙන, වර්ෂයේ බදු ආදායම හෝ අලාභය මත ගෙවිය යුතු හෝ ලැබිය යුතු අපේක්ෂිත බදු මුදල ප්‍රවර්තන බදු ලෙස හඳුනාගනී. වසරේ මුල් මාස 6 සඳහා ආදායම් බදු අනුපාතය 24% ක් වන අතර එය අවසන් මාස 06 සඳහා 30% ක් ලෙස සලකා ඇත.

මූල්‍ය වාර්තාකරණය සඳහා වත්කම් හා වගකීම්වල ඉදිරියට ගෙන ආ ශේෂය සහ බදු මුදල අතර තාවකාලික වෙනස ලබාගැනීම සඳහා වගකීම් ක්‍රමය භාවිතය මගින් විලම්භීත බදු මුදල ගණනය කෙරේ.

අනාගත වත්කම්වල පරිභෝජනයට ගත හැකි අගයට එරෙහිව අනාගතයේ දී බදු ලාභයක් ලැබීමේ සම්භාවිතාවක් පවතී නම් එම ප්‍රමාණයට පමණක් විලම්භිත බදු වත්කම හඳුනාගැනේ. වත්කමට අදාල බදු ප්‍රතිලාභය තවදුරටත් ලබාගත නොහැක්කේ නම් එම ප්‍රමාණයට විලම්භිත බදු වත්කම පහත හෙලනු ලැබේ.

1.3.4.2 **ස්කන්ධභාග ගෙවීම**

2022 වසර සඳහා ස්කන්ධභාගය ගණනය කර ඇත්තේ හෙලා ඇති දැව පරිමාව අනුවය.

1.3.4.3 **පිරිවැය වෙන්කිරීම**

දැව හුවමාරු අගය මත දැව පිරිවැය හා දැව ඉරුම්හල්වල පරිවර්තන පිරිවැය බෙදාවෙන් කරනු ලබන අතර, අදාල ඒකකය වෙත ප්‍රවාහනය කිරීමේ කුලී අගය මත යාන්ත්‍රික වැඩපොළේ පිරිවැය වෙන්කරනු ලබයි.

1.3.5 **මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනට පසුව සිදුවීම්**

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සකස් කළ දිනට පසුව පැණනැගි සියලු සැළකිය යුතු සිද්ධීන් සැළකිල්ලට ගෙන මූල්‍ය ප්‍රකාශනවල අදාල සටහන් යටතේ නිසි ගැළපීම් හෝ අනාවරණය කිරීම් සිදුකර ඇත.

1.3.6 **සේවක ණය චක්‍රීය අරමුදල**

මෙම අරමුදල නිර්මාණය කොට ඇත්තේ සංස්ථාවේ සේවකයන්ට ණය ලබාදීමේ අරමුණිනි. සේවක ණයපොළී ආදායම වෙනත් ආදායම් යටතේ විස්තීරණ ආදායම් ප්‍රකාශනයෙහි දක්වා, ආදායම් බදු අඩුකිරීමෙන් පසු ශුද්ධ පොළී ආදායම සේවක ණය චක්‍රීය අරමුදලට මාරු කරනු ලැබේ. මෙමගින් සේවක ණය චක්‍රීය අරමුදල ගොඩනැංවෙන අතර, එමගින් ණය ලබාදීම අරමුදලේ ඇති මුදල් ප්‍රමාණයට සීමාවේ.

1.3.7 **මුදල් ප්‍රවාහ ප්‍රකාශනය**

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සම්බන්ධ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ට අනුකූලව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සෘජු ක්‍රමයට අනුව පිළියෙළ කර ඇත. මුදල් සහ මුදල්වලට සමාන වත්කම්වලට වටිනාකම වෙනස්වීමේ අවධානමට යටත්ව ඉක්මණින් මුදල් වලට මාරුකර ගතහැකි ඉහළ ද්‍රවශීලතාවයක් ඇති කෙටිකාලීන ආයෝජන ඇතුළත් වේ. මුදල් සහ මුදල් සමාන වත්කම්වලට ඇතැති මුදල්, බැංකු ශේෂ සහ බැංකුවල ඇති කෙටිකාලීන තැන්පතු ඇතුළත් වේ.

1.3.8 **පෙරගෙවුම් කාර්ය මණ්ඩල ප්‍රතිලාභ**

සේවක ණය 2021 වර්ෂයේ සිට නාමික අගය මත ගිණුම්ගත කර ඇත.

1.4 **සැළකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්කම්**

1.4.1 **කල්බදු**

සංශෝධිත අතීතයානුයෝගි ප්‍රවේශය භාවිත කරමින් සංස්ථාව SLFRS 16 අනුගමනය කළේය. එහිදී 2022 ජනවාරි 01 දිනට මූලික භාවිතයේ සමුච්චිත බලපෑම රඳවාගත් ඉපැයීම් තුළ හඳුනාගන්නා ලදී. ඒ අනුව 2020/21 සඳහා ඉදිරිපත් කරන ලද සංසන්දනාත්මක තොරතුරු නැවත ප්‍රකාශ කර ඇත. එනම් එය පෙර වාර්තාවල පරිදි LKAS 17 යටතේ ඊට අදාලව ඉදිරිපත් කළ අර්ථකථන වේ. ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්කම් පිළිබඳ පහත හෙළිදරව් කෙරේ. තවද, SLFRS 16 හි හෙළිදරව් කිරීමේ අවශ්‍යතා සංසන්දනාත්මක තොරතුරු සඳහා අදාල කර නැත.

ගිණුම් සඳහා සටහන්

02. පිරිවැටුම	2022 රු.	2021 රු.
කඳන් - රජයේ ඉඩම්වලින් ලද	2,884,794,418	4,263,168,636
කඳන් - පුද්ගලික ඉඩම්වලින් ලද	82,897,119	15,935,012
ඉරුඳුව	316,315,473	250,264,064
ඉරුඳුව - ආනයනය කරන ලද	4,516,823	7,760,973
සිල්පර - පුද්ගලික ඉඩම්වලින් ලද	322,233,695	210,926,113
සිල්පර - රජයේ ඉඩම්වලින් ලද	222,179,959	70,546,942
විදුලි සම්ප්‍රේෂණ කණු රජයේ ඉඩම්වලින් ලද	30,486,691	24,358,769
විදුලි සම්ප්‍රේෂණ කණු පුද්ගලික ඉඩම්වලින් ලද		1,849,841
අලිවැට කණු	64,296,744	95,848,438
වෙනත්	19,508,910	17,094,249
වන අපරාධ දඩ	43,085,239	36,889,560
පරිත්‍යාග දඩ	363,688,830	339,079,059
ගෘහභාණ්ඩ	389,045,833	361,941,506
ශුද්ධ පිරිවැටුම	**4,743,049,736**	**5,695,663,163**

03. විකුණුම් පිරිවැය	2022 රු.	2021 රු.
දැව ගබඩා හා මංසල ගබඩා	1,119,895,786	1,716,182,782
දැව පරිරක්ෂණාගාර	327,669,060	328,568,486
ගෘහභාණ්ඩ යන්ත්‍රාගාර	288,422,973	237,631,914
මංසල විකුණුම්	716,086,411	659,598,459
එකතුව	**2,452,074,230**	**2,941,981,641**

04. විකුණුම් හා බෙදාහැරීමේ වියදම්	2022 රු.	2021 රු.
දැව ගබඩා	683,486,152	582,852,827
දැව පරිරක්ෂණාගාර	153,568,450	84,463
ගෘහභාණ්ඩ යන්ත්‍රාගාර	107,936,519	61,067,523
ප්‍රාදේශීය කාර්යාල හා ප්‍රධාන කාර්යාලය	10,444,235	8,345,393
එකතුව	**955,435,355**	**652,350,206**

05. පරිපාලන වියදම්	2022 රු.	2021 රු.
දැව පරීක්ෂණාගාර	39,430,136	19,400,979
ගෘහ භාණ්ඩ යන්ත්‍රාගාර	88,301,548	84,317,363
ප්‍රාදේශීය කාර්යාල හා ප්‍රධාන කාර්යාලය	904,564,888	791,517,502
සංචාරක බංගලා	6,787,742	8,401,902
එකතුව	**1,039,084,313**	**903,637,745**

06. වෙනත් ආදායම්	2022 රු.	2021 රු.
මෙහෙයුම් නොවන ආදායම් - 6.1		
විදේශ විනිමය හුවමාරු (අලාභ)	217,212	1,112
ගොඩනැගිලි කුලිය	14,736,509	26,283,134
එකතුව	**14,953,721**	**26,284,246**
මූල්‍ය ආදායම - 6.2		
පොළී ආදායම් - ආයෝජන	656,461,016	209,150,787
සේවක ණය පොළිය	17,699,934	18,792,778
	674,160,950	**227,943,565**
මෙහෙයුම් ආදායම - 6.3		
විවිධ ආදායම්	19,560,152	19,100,793
දඩ - කොන්ත්‍රාත්කරුවන්ගේ සහ සැපයුම්කරුවන්ගේ	384,062	289,792
වත්කම් විකිණීමෙන් ලද ආදායම	7,785,830	11,062,237
තොග හානි සඳහා අධි වෙන්කිරීම්	-	-
අඩමාන ණය අධි වෙන්කිරීම්		11,307,530
ඌණතා සහ පාඩු සඳහා අයකිරීම්	1,614,881	1,408,895
ආපසු නොගෙවන ටෙන්ඩර් තැන්පත්	3,914,995	3,728,308
	33,259,919	**46,897,556**
එකතුව	**722,374,591**	**301,125,367**

වෙනත් ආදායම් විශ්ලේෂණය 2022

ආදායම් මූලාශ්‍ර	අලෙවි ගබඩා	දැව පදම් කිරීමේ ඒකක	ගෘහභාණ්ඩ නිෂ්පාදන ඒකක	ප්‍රාදේශීය කාර්යාල සහ ප්‍රධාන කාර්යාලය	Sawmills	සංචාරක බංගලා	එකතුව
මෙහෙයුම් නොවන ආදායම් 6.1							
විදේශ විනිමය හුවමාරු ලාභ / (අලාභ)				217,212			217,212
ගොඩනැගිලි කුළිය			84,900	14,651,609			14,736,509
							-
	-	-	**84,900**	**14,868,821**			**14,953,721**
මූල්‍ය ආදායම 6.2							
පොළී ආදායම - ආයෝජන				656,461,016			656,461,016
සේවක ණය පොළිය				17,699,934			17,699,934
	-	-	-	**674,160,950**			**674,160,950**
					-	-	
මෙහෙයුම් ආදායම් 6.3							
විවිධ ආදායම්	514,629		136,218	17,863,215	-	1,046,090	19,560,152
දඩ - කොන්ත්‍රාත්කරුවන්ගේ සහ සැපයුම්කරුවන්ගේ				384,062			384,062
වත්කම් විකිණීමෙන් ලද ආදායම				7,785,830			7,785,830
අඩමාන ණය අධි වෙන්කිරීම්				-			-
ඌණතා සහ පාඩු සඳහා අයකිරීම්				1,614,881			1,614,881
ආපසු නොගෙවන ටෙන්ඩර් තැන්පත්				3,914,995			3,914,995
	514,629	-	**136,218**	**31,562,983**	-	**1,046,090**	**33,259,919**
එකතුව	**514,629**	-	**221,118**	**720,592,754**	-	**1,046,090**	**722,374,591**

07. ආදායම් බදු	2022 රු.	2021 රු.
ප්‍රවර්තන බදු වියදම්		
ප්‍රවර්තන වර්ෂය සඳහා ආදායම් බදු - 7.1	284,985,589	279,506,150
පෙර වර්ෂය සඳහා අධි / ඌණ වෙන්කිරීම්	-	(5,225,215)
	284,985,589	**274,280,935**
විලම්භිත බදු වියදම් - 7.2		
තාවකාලික වෙනස්වීම්වල ප්‍රවර්තනය හා මූලාරම්භය	95,119,416	(14,336,771)
	95,119,416	(14,336,771)
වර්ෂය සඳහා බදු අයකිරීම්	**380,105,005**	**259,944,164**

7.1 ප්‍රවර්තන වර්ෂයේ ලාභය සඳහා ආදායම් බදු	2022 රු.	2021 රු.
බදු පෙර ලාභය	1,015,986,328	1,496,155,864
සමාහාර ඉඩනොදෙන වියදම්	595,441,184	314,880,517
සමාහාර ඉඩදෙන වියදම්	(879,241,564)	(497,194,849)
ව්‍යාපාරික ලාභය	732,185,948	1,313,841,532
ව්‍යාපාරික නොවන ආදායම්	689,114,672	254,227,811
තක්සේරු ආදායම්	1,421,300,620	1,568,069,343
අඩුකළ හැකි වියදම්	(320,000,000)	(100,000,000)
බදු අයකළ හැකි ආදායම්	1,101,300,620	1,468,069,343
ආදායම් බද්දෙන්	284,985,589	279,506,150
එකතුව	**284,985,589**	**279,506,150**

7.2 විලම්භිත බදු	තාවකාලික වෙනස රු.	බදු බලපෑම (වත්කම්) / වගකීම් රු.
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය	326,256,319	58,726,137
වසර තුළ උත්පාදනය වූ මුදල	186,562,193	95,119,416
2022 දෙසැම්බර් 31 දිනට ශේෂය	**512,818,512**	**153,845,554**
දේපළ, පිරියත හා උපකරණවල තාවකාලික වෙනස	765,890,304	229,767,091
විශ්‍රාම පාරිතෝෂික අරමුදලේ තාවකාලික වෙනස	(253,071,791)	(75,921,537)
2022 දෙසැම්බර් 31 දිනට ශේෂය	**512,818,512**	**153,845,554**

08. දේපල පිරියත හා උපකරණ

විස්තරය	පිරිවැය					සිදුවැය						
	2022.01.01 දිනට ශේෂය	එකතු කිරීම්	ඉවත් කිරීම්	ගැලපීම්	2022.12.31 දිනට ශේෂය	2022.01.01 දිනට ශේෂය	ඉවත් කිරීම්	ගැලපීම්	වසර සඳහා අයකිරීම්	2022.12.31 දිනට ශේෂය	2022.12.31 දිනට ඉදිරියට ගෙන එන ලද වටිනාකම	2021.12.31 දිනට ඉදිරියට ගෙන එන ලද වටිනාකම (රු)
ඉඩම්	91,657,617				91,657,617					-	91,657,617	91,657,617
ඉඩම් සංවර්ධනය	53,026,162	226,000			53,252,162	32,529,739			3,510,424	36,040,163	17,211,999	20,496,423
ගොඩනැගිලි	998,207,334	23,905,396			1,022,112,730	284,562,123			22,842,747	307,404,871	714,707,859	713,645,211
දැව අට්ටිමඩු හා වෙනත් ගොඩනැගිලි	68,759,377	3,793,890		2,756,668	69,796,599	54,135,009		135,945	5,357,452	59,356,516	10,440,084	14,624,369
මාර්ග හා දුම්රිය මාර්ග	43,213,075				43,213,075	13,084,938			2,011,669	15,096,607	28,116,469	30,128,138
යන්ත්‍ර සූත්‍ර හා උපකරණ	766,964,145	967,559	642,720		767,288,984	605,806,879	642,715		31,668,004	636,832,168	130,456,816	161,157,266
බදු අයිති ඉඩම් හා ගොඩනැගිලි	148,311				148,311	148,311				148,311	-	-
මාර්ග ඉදිකිරීම් යන්ත්‍ර හා උපකරණ	60,450				60,450	60,450				60,450	-	-
මෙවලම් හා උපකරණ	8,015,167	386,838			8,402,005	6,596,663			447,762	7,044,425	1,357,580	1,418,504
විදුලි උපකරණ	29,686,556	1,754,341			31,440,897	18,631,510			2,211,044	20,842,554	10,598,342	11,055,046
වාහන	636,032,364		6,109,457		629,922,907	257,888,406	3,176,489		123,691,665	378,403,581	251,519,326	378,143,958
ගෘහභාණ්ඩ හා සවිකිරීම්	89,792,976	6,982,889			96,775,865	60,529,862			7,667,876	68,197,738	28,578,127	29,263,114
කාර්යාලීය උපකරණ	40,534,029	4,331,041			44,865,070	35,941,195			1,485,867	37,427,061	7,438,008	4,592,834
පරිගණක හා උපාංග	91,685,963	3,790,120			95,476,084	75,829,607			5,793,832	81,623,439	13,852,645	15,856,356
විවිධ වත්කම්	34,519,266	1,860,045			36,379,311	31,338,198			1,290,537	32,628,734	3,750,577	3,181,068
පෙර නිමැවුම් වියුහ	4,938,333				4,938,333	4,938,333				4,938,333	-	-
බදු අයිති ඉඩම් - රත්නපුර	680,300				680,300	680,300				680,300	-	-
එකතුව	**2,957,921,425**	**47,998,119**	**6,752,177**	**2,756,668**	**2,996,410,699**	**1,482,701,521**	**3,819,204**	**135,945**	**207,978,881**	**1,686,725,252**	**1,309,685,438**	**1,475,219,895**

* වාර්තා කරන දිනය වන විට පිරිවැය රු. 844,535,194/-ක් වූ සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද දේපළ, පිරියත හා උපකරණ ප්‍රමාණයක් සංස්ථාව සතු වේ.
* සංස්ථාව සතුව තාවකාලික අක්‍රිය දේපල පිරියත හා උපකරණ නොමැති

09. අස්පෘශ්‍ය වත්කම්

විස්තරය	පිරිවැය					සිදුවැය				
	2022.01.01 දිනට ශේෂය	එකතු කිරීම්	ඉවත් කිරීම්	2022.12.31 දිනට ශේෂය	2022.01.01 දිනට ශේෂය	ඉවත් කිරීම්	වසර සඳහා අයකිරීම්	2022.12.31 දිනට ශේෂය	2022.12.31 දිනට ඉදිරියට ගෙන එන ලද වටිනාකම	2021.12.31 දිනට ඉදිරියට ගෙන එන ලද වටිනාකම (රු)
පරිගණක මෘදුකාංග	5,413,211	-	-	5,413,211	5,199,290	-	188,429	5,387,719	25,493.23	213,922
එකතුව	**5,413,211**	**-**	**-**	**5,413,211**	**5,199,290**	**-**	**188,429**	**5,387,719**	**25,493**	**213,922**

10. භාවිත හිමිකම් වත්කම්

විස්තරය	පිරිවැය					සිදුවැය				
	2022.01.01 දිනට ශේෂය	එකතු කිරීම්	ඉවත් කිරීම්	2022.12.31 දිනට ශේෂය	2022.01.01 දිනට ශේෂය	ඉවත් කිරීම්	වසර සඳහා අයකිරීම්	2022.12.31 දිනට ශේෂය	2022.12.31 දිනට ඉදිරියට ගෙන එන ලද වටිනාකම	2021.12.31 දිනට ඉදිරියට ගෙන එන ලද වටිනාකම (රු)
මෙහෙයුම් - කල්බදු රථවාහන	13,690,714	-	-	13,690,714	13,320,693	-	370,021	13,690,714	-	370,021
එකතුව	**13,690,714**	**-**	**-**	**13,690,714**	**13,320,693**	**-**	**370,021**	**13,690,714**	**-**	**370,021**

11. ජීව විද්‍යාත්මක වත්කම් දෙසැම්බර් 31 දිනට ශේෂය	2022 රු.	2021 රු.
වර්ෂය ආරම්භක ශේෂය	7,735,659	7,735,659
නැවත වගාකිරීම් හෝ සංවර්ධනය සඳහා දරණ ලද වියදම්		
වර්ෂය අවසානයේ ශේෂය	**7,735,659**	**7,735,659**

අපගේ ගණනය කිරීම්වලට අනුව තේක්ක ගසක් පරිනතවීමට රෝපණය කළ දින සිට අවුරුදු 35ක කාලයක් ගතවන බවත්, එම ගසේ විද්‍යාත්මක පරිණාමය සිදුවීමට අවුරුදු 10ක කාලයක් ගතවන බවත් සඳහන් කළ හැකිය. ජීව විද්‍යාත්මක පරිණාමය ගතවන කාලය අතරතුර දැරීමට සිදුවන පිරිවැයත්, එහි සාධාරණ අගයත්, එම කාල පරිච්ඡේදය තුළ සමාන බව උපකල්පනය කර ඇත. රාජ්‍ය දැව සංස්ථාවට අයත් තේක්ක වගාවන් තවම අවුරුදු 9 ක අපරිණත වගාවන් කාණ්ඩයට අයත් වේ. එම වගාවන් පරිණත බවට පත්වන විට ඒ සඳහා දැරිය යුතු ආයෝජන පිරිවැයක් වෙතොත් එම අගය ද ඇතුළුව මුළු අගය අපරිණත ගිණුම්වලින් පරිණත ගිණුම් තුළට මාරුකරනු ලැබේ.

පුලියන්කුලම, මැදවච්චිය, සෙවනපිටිය හා විනීතගම යන ස්ථානවල සංස්ථාව සතු තේක්ක වගාවක් පවත්වාගෙන යනු ලබයි.

12. ආයෝජන 12.1 ආයෝජන - දිගු කාලීන දෙසැම්බර් 31 දිනට	2022 රු.	2021 රු.
ස්ථාවර තැන්පතුවල ආයෝජනය - දිගු කාලීන		
රාජ්‍ය ආයතනවල තාවකාලික අරමුදල් ගිණුම	731,832,197	346,843,350
රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව	241,353,882	232,747,814
	973,186,078	**579,591,164**
කොටස්වල ආයෝජනය		
ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ මණ්ඩලය	500,000	500,000
	500,000	**500,000**
එකතුව	**973,686,078**	**580,091,164**

12.2 ආයෝජනය - කෙටි කාලීන	2022 රු.	2021 රු.
මහජන බැංකුව	1,900,333,483	1,828,073,777
ලංකා බැංකුව	1,805,915,239	2,606,347,769
එකතුව	**3,706,248,722**	**4,434,421,546**

13. තොග දෙසැම්බර් 31 දිනට	2022 රු.	2021 රු.
වෙළඳ බඩු තොගය	1,257,140,272	1,241,746,652
තොග හානිවීම් සඳහා වෙන්කිරීම්		(244,674,912)
	1,257,140,272	997,071,740
කෙරීගෙන යන වැඩ	45,932,364	50,697,909
ගබඩා ද්‍රව්‍ය සහ අමතර කොටස්	151,331,005	109,581,397
පරිරක්ෂණය කිරීමේ ද්‍රව්‍ය	154,361,610	12,912,460
ඉන්ධන හා තෙල්	19,160,876	5,122,054
ලිපිද්‍රව්‍ය	29,061,362	19,168,080
එකතුව	**1,656,987,490**	**1,194,553,641**

13.1 තොග විශ්ලේෂණය දෙසැම්බර් 31 දිනට	2022 රු.	2021 රු.
රජයේ ඉඩම්වලින් ලද කඳන්	584,592,104	569,516,977
රජයේ ඉඩම්වලින් ලද ඉරුඳුව	294,871,597	322,325,921
ආනයනික ඉරුඳුව	2,170,719	6,814,623
රජයේ ඉඩම්වලින් ලද සිල්පර	32,346,175	6,434,416
පුද්ගලික ඉඩම්වලින් ලද සිල්පර		5,606,678
රජයේ ඉඩම්වලින් ලද විදුලිසම්ප්‍රේෂණ කණු	885,861	7,027,408
පුද්ගලික ඉඩම්වලින් ලද විදුලිසම්ප්‍රේෂණ කණු	784,553	657,968
මංසල විකුණුම්	19,586,359	12,575,341
වෙනත්	21,264,661	14,674,223
ගෘහභාණ්ඩ	300,638,243	296,113,096
එකතුව	**1,257,140,272**	**1,241,746,652**

14. වෙළඳ සහ වෙනත් ණයගැතියෝ දෙසැම්බර් 31 දිනට	2022 රු.	2021 රු.
වෙළඳ ණයගැතියෝ	908,873,671	581,533,142
අඩමාන ණය වෙන්කිරීම්	(352,054,492)	(111,377,120)
	556,819,179	**470,156,022**
කාර්ය මණ්ඩල ණයගැතියෝ 14.2	405,760,751	382,626,133
වෙනත් ණයගැතියෝ 14.1	48,896,341	47,297,923
තැන්පත් හා පූර්ව ගෙවීම්		
දේශීය මිලදීගැනීම් අත්තිකාරම්	2,930,983	1,680,739
පූර්ව ගෙවීම් ආනයන	330,311	288,757
පූර්ව ගෙවීම් අත්තිකාරම්	38,258,608	41,759,392
තැන්පත් සඳහා ලැබිය යුතු පොළිය	38,110,127	21,823,345
ආපසු හරවා යැවූ චෙක්පත්	553,200,630	124,495,091
කතරගම අෂ්ඨපල අරමුදල	24,641	36,579
උසාවි තැන්පත්	760,200	760,200
මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය	8,778,248	8,778,248
වනජීවී හා වනසංරක්ෂණ අමාත්‍යාංශය	1,731,821	1,731,821
වනසංරක්ෂණ දෙපාර්තමේන්තුව	80,549,079	70,198,323
ESCAMP ව්‍යාපෘතිය	6,427,178	3,624,266
ජෛව ආරක්ෂණ පද්ධතිය		312,000
එකතුව	**1,742,578,098**	**1,175,568,840**

14.1 වෙනත් ණයගැතියෝ දෙසැම්බර් 31 දිනට	2022 රු.	2021 රු.
විවිධ ණයගැතියෝ	5,013,840	7,340,930
පොදු තැන්පත්	44,249,121	40,323,614
වෙන් කිරීම්	(366,620)	(366,620)
එකතුව	**48,896,341**	**47,297,923**

14.2 කාර්ය මණ්ඩල ණයගැතියෝ දෙසැම්බර් 31 දිනට	2022 රු.	2021 රු.
කාර්යමණ්ඩල ණය / ලැබීම්		
වාහන ණය	30,135,823	14,654,364
ආපදා ණය	314,243,779	301,738,469
විදුලි උපකරණ ණය	30,404	30,404
යතුරුපැදි ණය	914,011	949,793
ලැප්ටොප් පරිගණක ණය	21,146,514	24,935,677
ගෘහභාණ්ඩ ණය	5,815,795	2,978,671
	372,286,325	**345,287,378**
අත්තිකාරම් හා වෙනත් ණය		
වැටුප් අත්තිකාරම්	12,000	29,800
විශේෂ වැටුප් අත්තිකාරම්	7,000	7,500
ගමන් වියදම් අත්තිකාරම්	3,123,198	3,407,345
උත්සව අත්තිකාරම්	57,416	174,642
අභ්‍යන්තර හරපත්	2,582,800	3,535,258
සේවක අයකිරීම්	20,156,809	25,570,452
වැඩබිම් ශුද්ධ කිරීම වෙනුවෙන් ලැබිය යුතු වියදම්	7,535,203	4,613,758
රෙදිපිළි ණය	33,474,426	37,338,755
එකතුව	**405,760,751**	**382,626,133**

15. මුදල් හා බැංකු ශේෂය දෙසැම්බර් 31 දිනට	2022 රු.	2021 රු.
අතැති මුදල්	1,151,500	1,094,000
ලංකා බැංකුව - ජංගම ගිණුම	56,425,347	24,930,186
ලංකා බැංකුව - කාලීන තැන්පතු	33,184,196	218,079,162
ලංකා බැංකුව - හරපත්	200,000	200,000
එකතුව	**90,961,043**	**244,303,348**

16. දායක ප්‍රාග්ධනය දෙසැම්බර් 31 දිනට	2022 රු.	2021 රු.
ශ්‍රී ලංකා රජයේ අරමුදල	25,584,808	25,584,808
වනසංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් පවරාගත් වත්කම්	10,714,815	10,714,815
ලෝක බැංකු ආධාර	708,202	708,202
කැනේඩියානු හා බ්‍රිතාන්‍ය ආධාර	4,495,843	4,495,843
එකතුව	**41,503,668**	**41,503,668**

17. සේවක ණය චක්‍රීය අරමුදල දෙසැම්බර් 31 දිනට	2022 රු.	2021 රු.
වසර ආරම්භක ශේෂය	433,020,533	367,492,061
සේවක ණය පොළී ලැබීම්	11,072,773	15,528,472
මුදල් තැන්පත් කිරීම	50,000,000	50,000,000
වසර අවසාන මුළු ශේෂය	**494,093,306**	**433,020,533**
දෙසැම්බර් 31 දිනට ප්‍රයෝජනයට ගත් අරමුදලේ නාමික අගය	355,941,623	334,266,833
දෙසැම්බර් 31 දිනට ප්‍රයෝජනයට නොගත් අරමුදල	**138,151,683**	**98,753,700**

18. විශ්‍රාමික පාරිතෝෂිකය දෙසැම්බර් 31 දිනට	2022 රු.	2021 රු.
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ හඳුනාගෙන ඇති අගයන් පහතින් දැක්වේ.		
වසර ආරම්භක ශේෂය	508,978,707	668,235,659
වර්ෂය සඳහා ප්‍රතිපාදන	10,972,397	25,428,270
වසර සඳහා පොළිය	121,254,433	53,232,021
වර්ෂය තුළ ඌණතාවය හෝ (අතිරික්තය)	(347,392,072)	(156,362,663)
වර්ෂය තුළ ගෙවීම්	(40,741,672)	(81,554,581)
වසර අවසාන ශේෂය	**253,071,791**	**508,978,707**
ආදායම් ප්‍රකාශනයේ හඳුනාගෙන ඇති අගයන් පහතින් දැක්වේ.		
මෙම වසර සඳහා ප්‍රතිපාදන	10,972,397	25,428,270
වසර සඳහා පොළිය	121,254,433	53,232,021
ආදායම් ප්‍රකාශනයේ හඳුනාගෙන ඇති අගය	**132,226,830**	**78,660,291**
විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ හඳුනාගත් ප්‍රමාණයන් පහත පරිදි වේ.		
වර්ෂය සඳහා (අතිරික්තය) / හෝ ඌණතාවය	(347,392,072)	(156,362,663)
විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ හඳුනාගත් ප්‍රමාණය	**(347,392,072)**	**(156,362,663)**

විශ්‍රාමික පාරිතෝෂික සඳහා වන වගකීම් ගණනයේ දී 1983 අංක 12 දරන විශ්‍රාමික පාරිතෝෂික පනතට අනුකූලව අඛණ්ඩව අවුරුදු 5කට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සේවකයන් පාරිතෝෂික සඳහා හිමිකම් ලබයි. 2021 දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ විශ්‍රාමික පාරිතෝෂික සඳහා වන වගකීම් ආයු ගණනය කිරීම යටතේ ඇගයීමට ලක්කරන ලදී. වාර්තා කරනු ලබන දිනට ප්‍රධාන උපකල්පන,

වට්ටම් අනුපාතය	32.39%	9.70%
අනාගත වැටුප් වැඩිවීමේ අනුපාතය	5.33%	2.87%
සේවක පිරිවැටුම් අනුපාතය	10.74%	6.15%
විශ්‍රාම ගැන්වීමේ වයස	60	62

19. බදුකරණය දෙසැම්බර් 31 දිනට	2022 රු.	2021 රු.
වසර ආරම්භක ගෙවිය යුතු ආදායම් බදු ශේෂය	152,984,309	84,925,974
වර්ෂය තුළ ගෙවීම්	(328,192,410)	(206,222,600)
බදු සඳහා ඌණ වෙන්කිරීම්		(5,225,215)
වර්ෂය සඳහා වෙන්කිරීම්	284,985,589	279,506,150
වසර අවසාන ශේෂය	**109,777,488**	**152,984,309**

20. ණය හිමියෝ සහ උපචිත වියදම් දෙසැම්බර් 31 දිනට	2022 රු.	2021 රු.
සේවක අර්ථසාධක අරමුදල	21,202,652	21,830,600
සේවක භාරකාර අරමුදල	2,457,060	2,532,431
උපචිත වියදම්	282,609,994	118,670,929
ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු	22,212,707	27,103,739
ඇප තැන්පත් - කාර්ය මණ්ඩලය හැර	125,789,403	110,725,546
ගෙවිය යුතු විගණන ගාස්තු	4,000,000	4,000,000
රඳවාගත් මුදල්	12,331,258	11,446,031
වෙනත් ණයහිමියෝ	178,502,395	151,225,212
වනසංරක්ෂණ දෙපාර්තමේන්තුව	605,788,853	1,100,597,119
වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව	50,444,632	38,320,077
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව	112,802	112,802
එකතුකළ අගය මත බදු	2,795,704	46,915,213
එකතුව	**1,308,247,460**	**1,633,479,698**

21. ආශ්‍රිත පාර්ශවයන් සමඟ ගණුදෙනු

* රාජ්‍ය දැව සංස්ථාවේ අධ්‍යක්ෂවරයෙකු හා වනසංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වනසංරක්ෂණ අධ්‍යක්ෂ ජෙනරාල් විසින් සංස්ථාවට දැව හෙළීම සඳහා වනවගා නිදහස් කිරීමේදී ජාතික කළමනාකරණ සැලැස්මට අනුව සිදුකරන අතර, වන සංරක්ෂණ දෙපාර්තමේන්තු විසින් රු. 1,059,093,029/- වටිනා ගස් වර්ෂය තුළ දී සංස්ථාවට ලබා දී ඇත. වනජීවී දෙපාර්තමේන්තු විසින් ද රු. 12,512,335/- වටිනා ගස් වර්ෂය තුළ දී සංස්ථාවට ලබා දී ඇත.

	වර්ග අඩි ගණන	කුලී මුදල (රු.)
වනසංරක්ෂණ දෙපාර්තමේන්තුව	22,040	550,000
වනසංරක්ෂණ දෙපාර්තමේන්තුව	6,480	300,000
ESCAMP ව්‍යාපෘතිය	5,649	375,000

මූල්‍ය ප්‍රකාශන දිනයට ආශ්‍රිත පාර්ශවයන් සමග ගනුදෙනුවල ශේෂයන් පහත පරිදි වේ

	2022 රු.	**2021** රු.
ආශ්‍රිත පාර්ශවයන්ට ගෙවිය යුතු		
වනසංරක්ෂණ දෙපාර්තමේන්තුව	605,788,853	1,100,597,119
වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව	50,444,632	38,320,077
	656,233,485	**1,138,917,196**
ආශ්‍රිත පාර්ශවයනගෙන් ලැබිය යුතු		
වනසංරක්ෂණ දෙපාර්තමේන්තුව	80,549,079	70,198,323
වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව	27,383,714	8,931,746
ESCAMP ව්‍යාපෘතිය	6,427,178	3,624,266
පරිසර හා මහවැලි සංවර්ධන අමාත්‍යාංශය	1,731,821	1,731,821
වනජීවී හා වනසංරක්ෂණ අමාත්‍යාංශය	-	-
	116,091,792	**84,486,156**

22. පොළී දරන වගකීම් **මූල්‍ය කල්බදු**	**2022** **Rs.**	**2021** **Rs.**
වසර ආරම්භක ශේෂය	21,127,311	27,753,039
අත්පත් කරගැනීම්		-
නැවත ගෙවීම්	(6,625,728)	(6,625,728)
	14,501,583	21,127,311
අවිනිශ්චිත කල්බදු පොළිය	(1,781,048)	(3,459,579)
වසර අවසාන ශේෂය	**12,720,535**	**17,667,732**
පොළී දරන වගකීම් - ජංගම	5,043,287	4,947,196
පොළී දරන වගකීම් - ජංගම නොවන	7,677,248	12,720,535
	12,720,535	**17,667,732**

මූල්‍ය පරිභාෂික ශබ්ද මාලාව

A

ගිණුම්කරණ ප්‍රතිපත්ති

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ දී හා ඉදිරිපත් කිරීමේ දී සංස්ථාව විසින් අනුගමනය කරනු ලබන නිශ්චිත මූලධර්ම, පදනම්, සම්මුතීන් හා නීතිරීති

ක්‍රමක්ෂය

අස්පෘශ්‍ය වත්කමක ක්ෂය කළ හැකි අගය ක්‍රමානුකූලව එහි ප්‍රයෝජනවත් ජීව කාලය පුරා බෙදාවෙන් කිරීම

උපචිත පදනම

ලැබීම් හෝ ගෙවීම් කාලය නොසලකා ආදායම් සහ පිරිවැය එකිනෙක සමඟ ගැලපුම් කිරීමේ මූලධර්මය වේ

B

ජීව විද්‍යාත්මක වත්කම්

ජීව විද්‍යාත්මක / ප්‍රාණවත් සතෙකු හෝ ශාකයක්.

C

මුදල් සහ මුදල් සමාන අයිතම

මාස තුනක් හෝ ඊට අඩු මුල් කල්පිරීම් සහිත ද්‍රවශීලි ආයෝජන

වත්මන් / ජංගම අනුපාතය

ජංගම වත්කම් ජංගම වගකීම් වලින් බෙදනු ලැබේ.

D

විලම්භිත බදු

වර්තමාන ගිණුම්කරන ප්‍රතිපත්ති, බදු ප්‍රතිපත්තිවලින් වෙනස්වීම නිසා අනාගතයේ දී ඇතිවිය හැකි වත්කම් හෝ වගකීම් වේ.

ක්ෂයවීම

වත්කමක ක්ෂය කළ හැකි වටිනාකම එහි ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරාවට වඩාත් ක්‍රමානුකූලව බෙදාහැරීම.

මූල්‍ය පරිභාෂික ශබ්ද මාලාව

F

සාධාරණ වටිනාකම

වර්තමාන වෙළෙඳපොළ තත්ත්වය යටතේ මිනුම් දිනයේ දී වත්කම් හෝ වගකීම් විකිණීම සඳහා වෙළෙඳපොළ පාර්ශවකරුවන් අතර විධිමත් ගනුදෙනුවක දී වත්කම් හෝ වගකීම් හුවමාරු වන අගය සාධාරණ අගය ලෙස උපකල්පනය කරයි.

මූල්‍ය කල්බදු

මූල්‍ය කල්බදු යනු වත්කම්වල හිමිකාරිත්වය (කල්බදු ගැණුම්කරු) සඳහා සියලු අවදානම් සහ ප්‍රතිලාභ මාරු වන කල්බදු ක්‍රමවේදයකි. නීත්‍යානුකූල අයිතිය ගිවිසුම අවසානයේ මාරුවීම හෝ නොවීම සිදුවිය හැක.

G

තෝලනය

භාවිතයේ යොදවා ඇති ප්‍රාග්ධනයට ණය ගැනීම් අනුපාතය

R

ආදායම් / අයභාරය සංචිත

ආයෝජන සඳහා ගොඩනඟාගන්නා ලද සංචිත වේ.

වත්කම් මත ප්‍රතිලාභ (ROA)

ශුද්ධ ආදායම සමස්ත වත්කම්වල ප්‍රතිශතයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇති අතර, එය ලාභ හැකියාව මැනීමේ සහ අභ්‍යන්තර කර්මාන්ත කාර්ය සාධනය සංසන්දනයේ පදනමක් ලෙස භාවිතා කරයි.

භාවිතයට ඇති අයිතිය

භාවිතයට ඇති අයිතිය යනු කල්බදු ජීවිත කාලය පුරාවට ම වත්කමක් භාවිතා කිරීමට කල්බදු ගැනුම්කරුට ඇති අයිතියයි.
වත්කම් ගණනය කරනු ලබන්නේ කල්බදු වගකීම්වල ආරම්භක මුදලට, බදු ආරම්භක දිනයට පෙර බදුකරුට ලබා දී ඇති ඕනෑම කල්බදු ගෙවීම් එකතු කළ යුතු අතර, එහි කිසියම් ආරම්භක සෘජු පිරිවැයක් දැරීම, ලැබුණු සියලුම කල්බදු දිරි දීමනා/සහනයන් ඉවත් කිරීම.

සම්බන්ධිත පාර්ශවයන්

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කරන ආයතනයට සම්බන්ධ පුද්ගලයෙකු හෝ ආයතනයකි

V

අගය එකතු කිරීම

සංස්ථාවේ ක්‍රියාකාරකම් සහ එය බෙදාහැරීම මඟින් ජනනය කරන ලද සම්පත් ප්‍රමාණය.